**විදුලි සංදේශ,විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යාංශය**

# වාර්ෂික කාර්යසාධන වාර්තාව 2018

***#9, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07***

| පටුන | අංකය |
|---|---|
| 01 විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාතුමාගේ පණිවුඩය | 03,04 |
| 02 විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවුඩය | 05,06 |
| 03 විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශ වාර්ෂික කාර්ය සාධන වාර්තාව- 2018 | |
| 3.1 විදුලි සංදේශ,විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යාංශය -ක්‍රීඩා අංශය | 7, 43 |
| 3.2 ක්‍රීඩා වෛද්‍ය ආයතනය | 44,51 |
| 3.3 ජාතික ක්‍රීඩා විද්‍යායතනය | 52, 59 |
| 04විදුලි සංදේශලවිදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යාංශය -විදුලි සංදේශ,විදේශ රැකියා අංශය | |
| 4.1 විදේශ රැකියා අංශය | 60, 90 |
| 4.2 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 91, 110 |



**විදුලි සංදේශ විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යතුමාගේ පණිවිඩය....**

විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශය 2018 වාර්ෂික කාර්ය සාධන වාර්තාවට එහි අමාත්‍යවරයා ලෙස මෙම පණිවුඩය ලබාදීමට ලැබීම ඉමහත් භාග්‍යක් කොට සලකමි. ශ්‍රී ලංකාවට ඉතාම වැදගත් කාර්යකෙෂ්ත්‍රයන් තුනක් සඳහා මෙම අමාත්‍යාංශය වගකීමට යටත් වේ. ඒ අනුව,

**ක්‍රීඩා කෙෂ්ත්‍රය**

ශ්‍රී ලංකාවේ ක්‍රීඩා කෙෂ්ත්‍රය පිළිබඳ අවධානය යොමුවීමේ දී 1948 දී ඩන්කන් වයිට් මුල් ම ඔලිම්පික් පදක්කම ලබාගැනීමෙන් පසුව නැවතත් සුසන්තිකා ජයසිංහ ඔලිම්පික් රිදී පදක්කමක් ලබාගනු ලබන්නේ 2000 දීය. ඒ අනුව නැවතත් ඔලිම්පික් පදක්කම් ලබා ගැනීම සඳහා ගත වූ කාල පරතරය වසර 52 කි. 2019 වසර වනවිටත් නැවත ඔලිම්පික් පදක්කම් ලබා ගත හැකි පරිසාදන මට්ටමට ළඟා වී ඇති හෝ ළඟා විය හැකි ක්‍රීඩක ක්‍රීඩිකාවන් මෙතෙක් බිහි වී නොමැති බවට වාර්තා වේ. දකුණු ආසියානු හා ආසියානු තරඟ වලදී ලබා ඇති සාර්ථකත්වයන් ගැන යම් පමණකට සතුටු විය හැකි වුවත් සමස්ථ ක්‍රීඩා සංවර්ධනය ගැන ස්වාධීනව බැලීමේ දී ක්‍රීඩාවේ ස්ථාවර හා නොනවතින දියුණුවක් පිළිබඳ අපට කිසිසේත්ම සෑහීමකට පත්විය නොහැකි වී ඇත.

මේ සඳහා සුවිශේෂී හේතු ගණනාවක් ඇති බව මම නිරීක්ෂණය කරමි.

- ක්‍රිඩා අමාත්‍යාංශය සහ ක්‍රීඩා දෙපාර්තමේන්තුව සතුව පුළුල්, ඒකාබද්ධ, සක්‍රිය හා ප්‍රායෝගික වැඩපිළිවෙලක් නොමැති වීම.
- ක්‍රිඩා සංගම් සතු අභ්‍යන්තර අර්බුද සහ ආරවුල් නිසා අදාළ ක්‍රීඩාවේ නිතිපතා නියැලීමට ක්‍රීඩකයන්ට අවස්ථාව නොලැබීම.
- ක්‍රීඩා සඳහා දිවයින පුරා ඇති වී ඇති යටිතල පහසුකම් වල අක්‍රමවත් ව්‍යාප්තිය, පරිහරණය හා නඩත්තුවේ දුර්වලතා.
- සංගම්වල ක්‍රීඩකයන්ගේ ආකල්ප වල පවතින දුර්වලතා.

එබැවින් මේ සියල්ල ජය ගැනීම උදෙසා නිර්මල දර්ශනයක් මත පිහිටුවා ගනු ලබන ක්‍රමවත් වැඩපිලිවෙලක් අවංකවම අවශ්‍ය වී ඇත. ඒ අනුව 2019.02.25 සහ 26 දින දෙකෙහි ශ්‍රී ලංකාවේ ක්‍රිඩා කෙෂ්ත්‍රයේ සංගම් 66 හි නියෝජිතයින්, ක්‍රීඩා උපදේශක සභාවේ සාමාජිකයින්, ක්‍රීඩා විනිශ්චයකරුවන්, ක්‍රිඩා උපදේශකයින්,තාක්ෂණික ශිල්පීන් සහ ක්‍රීඩකයින්ගේ සයභාගීත්වයෙන් දින දෙකක වැඩමුළුවක් පැවැත් වූ අතර ඒ මත පදනම්ව ඉදිරි වසර 03 ක කාලයක් සඳහා ස්ථාවර ක්‍රමවේදයක් ඉදිරිපත් කිරීමටත්, එය වසරින් වසර ක්‍රියාත්මක කරන ආකාරය තීරණය කිරීමටත් අවශ්‍ය වන්නා වූ මූලික පදනම මා විසින් මේවන විටත් දමා ඇත.

එසේම ක්‍රිඩා පනතට අවශ්‍ය ධනාත්මක සංශෝධනයන් සිදු කිරීමටත් ක්‍රීඩා නීති රෙගුලාසි යාවත්කාලීන කිරීමටත් සෑම පළාතකම පූර්ණ පහසුකම් සහිත එක් ක්‍රීඩා සංකීර්ණයක් බැගින් ස්ථාපිත කිරීමටත් බොහෝ ක්‍රීඩා පිටි වල අකාර්යක්ෂම පරිපාලනය මගහරිනු වස් සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ ක්‍රීඩා පරිපාලනය විධිමත් සහ ක්‍රමවත්ව උසස් තත්වයට ගෙන ඒමටත් ක්‍රීඩාව සඳහා ඔම්බුඩ්ස්මන්වරයෙක් පත් කිරීමටත් කටයුතු කරන අතර ක්‍රීඩාව පිළිබඳ ව ගනු ලබන සෑම පියවරක්ම ක්‍රීඩා උපදේශක මණ්ඩලයේ සහාය ඇතිව ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

**විදේශ රැකියා ක්ෂේත්‍රය**

ශ්‍රී ලංකාවේ විදේශ රැකියා ක්ෂේත්‍රයේ විදේශ රැකියා සඳහා යැවීමේ ප්‍රවණතාවය, ශ්‍රමිකයන් ලබා දීමේ ප්‍රවණතාවය හා ක්‍රමවේදයෙහි වෙනසක් සිදු විය යුතුය යන්න දීර්ඝකාලයක පටන් පැවතෙන අදහසකි. ඒ අනුව, මැද පෙරදිග ගෘහ සේවක, සේවිකාවන් යැවීම පිළිබඳ අවදානම අවම කොට වෙනත් හඳුනාගත් ක්ෂේත්‍ර කිහිපයක් සඳහා පුහුණු ශ්‍රමිකයන් යවා විදේශ ආදායම වැඩි කර ගැනීමේ අවශ්‍යතාවය අප විසින් මැනවින් වටහා ගෙන ඇත. ඒ අනුව සාත්තු සේවිකා, හෝටල් කර්මාන්තය, පෙදරේරු කර්මාන්තය, වඩු කර්මාන්තය වැනි ක්ෂේත්‍රයක් පිළිබඳව වැඩි අවධානයකින් යොමු කළ යුතුව පවතින අතර ශ්‍රී ලංකාව තුළ මෙම ශ්‍රමිකයින්ගේ හිඟතාවයක් නොපවතින ලෙස මෙය ඉටු කිරීමෙහි ලා වැඩ කටයුතු සකස් කළ යුතුව තිබේ. ඒ සඳහා තරුණ කටයුතු අමාත්‍යාංශය, ජාතික තරුණ සේවා සභාව, වෘත්තීය පුහුණු අධිකාරිය වැනි ආයතන සමග ඒකාබද්ධව සැලසුම් කිරීමේ අවශ්‍යතාවය මනා ලෙස පෙනී යයි. මේ සඳහා මූලික වශයෙන්ම ක්‍රියාත්මක වන විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කටයුතු තාක්ෂණිකව, දියුණු සහ විනිවිද පෙනෙන ක්‍රමවේදයක් ඔස්සේ වැඩි දියුණු කළ යුතු අතර මේ වන විට විදේශ ශ්‍රමිකයකු යැවීමට පෙරාතුව සිට එම සේවකයා හෝ සේවිකාව අදාළ ස්ථානයේ රැකියාව කරා යන අවස්ථාව දක්වාත් එම අය ලබන වැටුප ශ්‍රී ලංකාවට නීත්‍යානුකූලව එවීමේ පහසුව සඳහාත් තොරතුරු තාක්ෂණික ක්‍රමවේදයක් හඳුන්වාදීමේ ලා මේ වන විට අවධානය යොමු ව ඇත. ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ ද අනුමැතිය ලබා ගෙන ඇත. විදේශ ශ්‍රමිකයන් ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසු ඔවුන්ගේ සුභ සාධනය සහ වර්ධනය පිළිබඳ රජයේ අවධානය යොමු වීම උදෙසා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්තව ඇති සංවර්ධන නිලධාරීන් හරහා ඍජු වැඩපිළිවෙලක් යෙදීමට ද අත්‍යාවශ්‍ය කරුණක් වී තිබේ. එසේම විදේශ රැකියා ක්ෂේත්‍රයේ දී තානාපති කාර්යාලයන්හි ඇති රැඳවුම් කඳවුරු වල සිටින ශ්‍රී ලාංකිකයන් ප්‍රමාණය එහි රඳවා ගැනීමේ කාලය අවම කර ගැනීමට හැකි වී තිබීම ජයග්‍රහණයකි. විදේශ රැකියා වල නිරතවන්නන්ට තම තමන් සිටින රටෙහි තානාපති කාර්යාල වලින්ම විධිමත් පරිදි ජීව දත්ත සහිත ගමන් බලපත්‍රය ලබා ගැනීම සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව ඒ සඳහා කටයුතු අරඹා ඇත. ඒ සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව නොබෝ දිනකින් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිතය.

**විදුලි සංදේශ අංශය**

විදුලි සංදේශ ක්ෂේත්‍රයේදී මා හට පවරා ඇති මූලිකම වගකීම වී ඇත්තේ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව ඇවර කිරීම පිළිබඳව සහ එහි විශ්‍රාම වැටුප් ලබා දීමට ඉතිරි වී ඇති හිටපු සේවක සේවිකාවන් සඳහා විශ්‍රාම වැටුප් ලබා දීම පිළිබඳ කඩිනම් කිරීමය. ඒ සඳහා ක්‍රමවේදයක් ලෙස ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු මාස 6ක කොන්ත්‍රාත් පදනමට ඒ සඳහා පත් කොට කඩිනම් පියවර ගැනීමට මා විසින් කටයුතු කර තිබේ.

සමස්තයක් ලෙස සලකා බැලීමේ දී මෙම විෂයයන්, ක්‍රීඩා සහ විදේශ රැකියා යන අංශයන්හි ඉදිරි කටයුතු ඉතා යහපත් පදනමකින් ඇරඹීමටත්, දැනට පවතින ඵලදායි ක්‍රියාමාර්ග එලෙසම පවත්වා ගැනීමටත් ඉහත කී පරිදි විධිමත් වැඩපිළිවෙලක අවශ්‍යතාවය වඩ වඩා කැපී පෙනේ. ඒ දීර්ඝ ගමන යාම උදෙසා ගරු ජනාධිපතිතුමා, අග්‍රාමාත්‍යතුමා ඇතුලු ඔබ සැමගේ ආශිර්වාදය මම අපේක්ෂා කරන අතර මෙම අභියෝගයන් ජයග්‍රහණය කිරීමට මා හට නිරන්තරව සහයෝගය දෙන පාර්ලිමේන්තු මන්ත්‍රී මනූෂ නානායක්කාර මැතිතුමාටත් විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්තුමාටත්, ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇතුළු සියලු ආයතන ප්‍රධානීන්, අනෙකුත් කාර්ය මණ්ඩලයටත් මාගේ කෘතවේදිත්වය පුද කරමි.

**හරීන් ප්‍රනාන්දු (පා.ම)**
විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍ය



**විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම්ගේ පණිවුඩය**

විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් ලෙස වාර්ෂික කාර්ය සාධන වාර්තාවට පණිවුඩයක් ලබා දීමට ලැබූ අවස්ථාව භාග්‍යයක් කොට සලකමි.

විදුලි සංදේශ අංශය මඟින් විදුලි සංදේශ පද්ධතියක් ඔස්සේ යම් විදුලි පණිවුඩයක් යවන්නා හෝ ලබන්නා අතර හුවමාරු වන තොරතුරු ලබා දීමේ සේවාව නිවැරදි ලෙස හා කාර්යක්ෂම ලෙස ළඟා කර දීමත්, විදේශ රැකියා අංශය මඟින් ගෝලීය රැකියා වෙළඳ පොළ වෙත මානව සම්පත් සැපයීමේ ප්‍රමුඛයා බවට ශ්‍රී ලංකාව පත් කිරීම සඳහා වන පහසුකම් සම්පාදනයත්, ක්‍රීඩා අංශය මඟින් සැමට ක්‍රීඩා සංකල්පය යටතේ රට තුළ ක්‍රීඩා සංස්කෘතියක් නිර්මාණය කිරීම තුළින් නිරෝගිමත් ජන සමාජයක් දැයට උරුම කරමින් ශ්‍රී ලාංකික නාමය ජාත්‍යන්තර තලයේ ඔප් නැංවීමත්, විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශයේ පුළුල් වගකීම වේ.

ඌණ සංවර්ධිත රටවල ජංගම පුළුල් සංඛ්‍යාතයින්ගෙන් ඇති වන ආර්ථික බලපෑම සංවර්ධිත රටවල්ට වඩා වැඩි වන අතර මූලික වශයෙන් විදුලි සංදේශ සේවා සලසන රජය සතු ව්‍යවසායන් හි කටයුතු අධීක්ෂණයෙන් විදුලි සංදේශනයට අදාළ සමායෝජන කටයුතු, ජාත්‍යන්තර සහයෝගිතාවන්ට අදාළ කටයුතු, විදුලි සංදේශනයන්ට අදාළ ප්‍රමිතිකරණය ප්‍රවර්ධන කිරීම, පර්යේෂණ හා සංවර්ධනය කිරීම, විදුලි සංදේශ සම්බන්ධයෙන් පෞද්ගලික අංශයේ ආයෝජන ප්‍රවර්ධන කිරීම සමඟින් සංවර්ධනය වෙමින් පවතින රටක් වන ශ්‍රී ලංකාව තුළ දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනය සඳහා සංවේදී දායකත්වයක් ලබා දීම ද විදුලි සංදේශ අංශයේ කර්තව්‍ය වේ.

ශ්‍රී ලංකාවට වැඩිම විදේශ විනිමය ප්‍රමාණයක් ලබා දෙන ශ්‍රම සැපයුම් වෙළඳ පොළ සඳහා ජාත්‍යන්තර සහයෝගිතාවය හා එම සම්බන්ධතාවයන් ඉතා වැදගත් වන අතර කලාපීය සංවර්ධන සම්මුතීන් ඉදිරියට ගෙන යාමටත් කාලීන සංශෝධනයන්ට යටත්ව අවබෝධතා ගිවිසුම් යාවත්කාලීන කරමින් ශ්‍රම වෙළඳ පොළ ගුණාත්මකව ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාමත් විදේශ රැකියා අංශයේ ප්‍රධාන කර්තව්‍ය වේ. සම්පූර්ණයෙන්ම මැද පෙරදිග රටවලට යොමුව තිබූ ශ්‍රමික ගලා යෑම අනෙකුත් නැගෙනහිර ආසියාතික යුරෝපීය රටවල් වෙත යොමු කිරීම තුළින් ශ්‍රමය ගලා යෑමේ දිශානතිය යහපත් කර ගැනීම සඳහා විදේශ රැකියා අංශය ලබා ගත් ඉහළ දායකත්වය කැපී පෙනෙන ලක්ෂණයකි.

ක්‍රීඩාවෙන් ප්‍රමුඛ ස්ථානයේ වැජඹෙන රටවල් සේම ශ්‍රී ලංකාවද ක්‍රීඩාවෙන් ප්‍රමුඛ වූ දේශයක් කරලීම ශ්‍රී ලාංකිකයන් ලෙස අපගේ අරමුණ වන අතර ඒ වෙනුවෙන් දේශීය මෙන්ම විදේශීය ක්‍රීඩා විද්වතුන්ගේ තාක්ෂණික දැනුම, බුද්ධිය හා අත්දැකීම් භාවිත කරමින් විවිධ ක්‍රීඩා ව්‍යාපෘතීන් ආරම්භ කිරීම මෙම අමාත්‍යාංශය මඟින් සිදු කිරීමත් වර්තමානයේ ශරීර සුවතාවය පිළිබඳව අවධානයක් නොදක්වන ශ්‍රී ලාංකික ජනයා සඳහා ශරීර සුවතාවයේ යෙදීම පිළිබඳ ඇති වැදගත්කම හා එහි හිතකර බලපෑම් පිළිබඳ ශ්‍රී ලාංකික ජනතාව දැනුවත් කිරීමද ඒ සඳහා යොමු කරවා ගැනීමද අපගේ කර්තව්‍ය වේ.

විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක වන පරිපාලනය ඔස්සේ විදුලි සංදේශ අංශය හරහා සන්නිවේදන ක්‍රියාවලියේදී ජාත්‍යන්තර මට්ටමේ සේවාවක් ලබා දෙමින් උසස් ප්‍රමිතියෙන් යුතු සන්නිවේදන සේවාවක් ලබා දීමටත් ශ්‍රී ලංකාව තුළ දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනයක් ළඟා කර දීමටත්, විදේශ රැකියා අංශය හරහා ප්‍රාදේශීය මට්ටමේ සිට විදේශ රැකියා සම්බන්යෙන් ඇති සියළුම කාර්යයන් ඉටු කිරීමේදී සංක්‍රමණිකයන්ගේ මානව අයිතිවාසිකම් හා අයිතිවාසිකම් සඳහා වූ ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට හා ගැටළු විසඳා ගැනීමටත් ක්‍රීඩා අංශය හරහා ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ කුසලතා දක්වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා අවශ්‍ය වන ක්‍රීඩා යටිතල පහසුකම් ලබා දීමටත් ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් ජයග්‍රහන ලබා ගැනීමට අවශ්‍ය

පහසුකම් ලබා දීමටත්, ඒ තුළින් රටේ සමාජීය හා ආර්ථික මට්ටම ශක්තිමත් කිරීමට අත්වැලක් වීමටත්, ශ්‍රී ලාංකික ජන සමාජයේ නීරෝගීමත් ජන කොටසකට හිමිකම් ලබා දීමටත් විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශයේ සියළුම නිලධාරින් දරණ වෙහෙසීම අගය කරන අතර මෙම කර්තව්‍ය සාර්ථක කර ගැනීම සඳහාත් එය ශ්‍රී ලාංකික සංවර්ධන ගමන් මගේ උන්නතිය සඳහා අත්වැලක් කරලීමට මෙම නිලධාරින්ට ධෛර්යය ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

**ඩබ්. ඒ. චූලානන්ද පෙරේරා**
**ලේකම්**
**විදුලි සංදේශ, විදේශ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය**

## විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශය

## ක්‍රීඩා අංශය

2018 වර්ෂය ආරම්භයේදී ක්‍රීඩා අමාත්‍යාංශය ලෙස ක්‍රීඩාව සඳහා වෙනමම අමාත්‍යාංශයක් ස්ථාපිත කරනු ලැබුවද 2018 අප්‍රේල් මාසයේ දී ක්‍රීඩා විෂය පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතට පත් කරනු ලැබීය. එසේ වුවද ඊට අයත් කාර්ය භාරය හා වගකීම් ඒ ආකාරයටම ක්‍රියාත්මක කරනු ලැබූ අතර අයවැය ප්‍රතිපාදන මත සංවර්ධන ව්‍යාපෘති කෙරෙහි ආයෝජන ක්‍රියාත්මක කරනු ලැබීය. ක්‍රීඩාව 13 වන ව්‍යවස්ථාවට අනුව පළාත් සභාවටද අයත් විමධ්‍යගත විෂයයක් බැවින් පළාත් සභා , පළාත් පාලන අමාත්‍යාංශය යටතට නීතිගතවීම මත සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වඩාත් පහසුවක් විය. 2018 දෙසැම්බර් මස අවසානයේදී විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශය ලෙස නැවත ස්ථාපිත විය.

### දැක්ම

ක්‍රීඩාවෙන් ආසියාවේ ප්‍රමුඛ දේශයක් වීම.

### මෙහෙවර

ක්‍රීඩාවේ ජාතික ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම තුළින් සැම පුරවැසියෙකුම උද්යෝගීමත්, නීරෝගී, විනයගරුක, අභිමානවත්, පුද්ගලයෙකු බවට පත් කිරීමෙන් එක්සත්, සමෘද්ධිමත් දේශයක් ගොඩනැගීම.

### අභිමතාර්ථ

1. ශ්‍රී ලාංකීය සංස්කෘතියේ හා සමාජයේ ක්‍රීඩාව අත්‍යාවශ්‍ය අංගයක් බවට පත් කිරීම
2. සියළු ශ්‍රී ලාංකිකයන්ගේ ජීවන තත්වය උසස් කර ගැනීමට ශාරීරික සුවය හා සෞඛ්‍ය දියුණු කර ගැනීම සඳහා ක්‍රීඩාව උපයෝගී කර ගැනීම.
3. සැම කෙනෙකුටම ක්‍රීඩාවට සහභාගී විය හැකි වන පරිදි ඒ සඳහා අවශ්‍ය දැනුම ඉඩකඩ හා අවස්ථා සලසා දීම.
4. ක්‍රීඩාව සමස්ථයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය සම්පත් හා යටිතල පහසුකම් ලබා දීම.
5. ක්‍රීඩා කෞෂල්‍යයෙන් ජාත්‍යන්තර වශයෙන් ලබා ඇති ශ්‍රී ලාංකීය ප්‍රතිරූපය ඉහළ නංවාලීම.
6. ක්‍රීඩා ආශ්‍රිත කර්මාන්ත දියුණු කර නව රැකියා මාර්ග බිහිකර ආර්ථිකය ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු කිරීම
7. ප්‍රධාන විදේශ විනිමය ඉපයුම් ක්ෂේත්‍රයක් ලෙස ක්‍රීඩා ක්ෂේත්‍රය යොදා ගැනීම.
8. සාමය සහ වාර්ගික ඒකාග්‍රතාවය සඳහා ක්‍රීඩාව උපයෝගී කර ගැනීම.

## ක්‍රීඩා අංශයේ කාර්යයන්

2015.09.21 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා අංශයේ කාර්යයන් හා කර්තව්‍යයන් මෙසේය :

1. ක්‍රීඩා විෂයට අනුබද්ධ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
2. ක්‍රීඩා කටයුතු දිරිගැන්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම හා ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වර්ධනය කිරීම.
3. ක්‍රීඩා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම.
4. ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය අන්තර්ජාතික වශයෙන් ගොඩ නැගීම සඳහා ක්‍රීඩාව යොදගැනීමට හැකිවන ලෙස නව ක්‍රමෝපායන් සම්පාදනය හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
5. පොදු මහජනතාවගේ ශාරීරික සුවතාවය සැලසීමට අවශ්‍ය පහසුකම් ප්‍රවර්ධනය හා සම්බන්ධීකරණය සිදු කිරීම.
6. ක්‍රීඩා අමාත්‍යාංශයට අනුබද්ධිත දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවලට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු.
7. ක්‍රීඩා අමාත්‍යාංශයට අනුබද්ධිත දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා අධීක්ෂණය කිරීම.

### ක්‍රීඩාව හා බැඳුණු නෛතික රාමුව

- ක්‍රීඩා නීතිය (1973 අංක 25)
- සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරී පනත (1999 අංක 17)
- ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත (2013 අංක 33)

2018 වර්ෂය සඳහා ක්‍රීඩා අංශය වෙත වෙන් කළ සෘජු අයවැය යෝජනා මත රුපියල් මිලියන 5,425 ක් වෙන් වූ අතර අයවැය යෝජනා මත තවත් මිලියන 2650ක ආයෝජන සහ අතිරේක ප්‍රතිපාදන රුපියල් මිලියන 188.70 ක්ද ඇතුළුව ක්‍රීඩාව සඳහා 8263.70 ක් වෙන් කර ඇත. 2017 වසරට සාපේක්ෂව 2018 වසරේදී 42.85% ක රාජ්‍ය ආයෝජනයෙහි වර්ධනයක් පෙන්නුම් කරයි.

පසුගිය වසර කිහිපයක ක්‍රීඩා අමාත්‍යාංශය වෙත රජයේ ආයෝජන වෙන් වූ ආකාරය වගු අංක 01 මඟින් දක්වා ඇත.

**වගු අංක 01**

| ප්‍රතිපාදන | 2018 | 2017 | 2016 | 2015 | 2014 | 2013 |
|---|---|---|---|---|---|---|
| මූලධන (රු.මි) | 6,593.85 | 4,484.37 | 2980.50 | 3033.00 | 2550.00 | 2015.00 |
| පුනරාවර්තන(රු.මි.) | 1,669.85 | 2,335.10 | 1014.18 | 1131.00 | 932.00 | 842.00 |
| මුළු (රු.මි.) | 8,263.70 | 6,819.47 | 3994.68 | 4164.00 | 3482.00 | 2857.00 |

## අමාත්‍යාංශය තුළ පිහිටුවා ඇති අංශ

### පරිපාලන අංශය

අමාත්‍යාංශයේ මානව සම්පත් කළමණාකරණය,මෙහෙයවීම,ඇගයීම් සහ අවශ්‍ය පුහුණුවීම් සඳහා යොමු කිරීම,අභ්‍යන්තර පරිපාලනය හා භෞතික සම්පත් පාලනය මෙම අංශයේ ප්‍රධාන කාර්ය වේ.එසේම අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති අංශ හා ආයනවල නිලධාරින්ගේ මානව සම්පත් ප්‍රවර්ධන අවශ්‍යතා හඳුනාගැනීම,සේවක විනය පාලනය සහ ඒ අනුව අදාළ සේවාවන් මෙහෙයවීම සහ සම්බන්ධීකරණය ද ප්‍රවාහන සේවා සහ නඩත්තු කිරීම පරිපාලන අංශය මඟින් ඉටු කරනු ලබයි.

### ගිණුම් හා මූල්‍ය අංශය

අමාත්‍යාංශය සඳහා වාර්ෂිකව වෙන්වන මූල්‍ය ප්‍රතිපාදන එම අනුමත කාර්යයන් සඳහාම යොදවමින් මූල්‍ය කළමණාකරණය ,පාලනය ඒ සම්බන්ධ ලේඛන පවත්වා ගැනීම,ගිණුම් අංශයේ ප්‍රධාන කාර්ය වේ.එසේම අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්හී එකී කාර්යයන් අධීක්ෂණය,සම්බන්ධිකරණය සහ අවසාන වාර්තා පිළියෙල කිරීමද ගිණුම් අංශයේ කාර්යයන් අතර වේ.එසේම ක්‍රීඩා සංවර්ධන අරමුදලේ මූල්‍ය කළමණාකරණය ද අමාත්‍යාංශ ගිණුම් අංශය මඟින් සිදු කෙරේ.

### සැලසුම් අංශය

අමාත්‍යාංශය සඳහා වාර්ෂිකව වෙන්කරනු ලබන ප්‍රතිපාදන අතුරින් සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වාර්ෂික සැලසුම් සකස් කිරීම,එය ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය මැන බැලීම හා ප්‍රගති වාර්තා සැකසීම,ඇගයීම් හා මෙහෙය වීම් සැලසුම් අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.එසේම ප්‍රතිපත්තිමය තීරණ ගන්නා පාර්ශවයට සහ ඉහළ කළමණාකරණයට අවශ්‍ය නිවරදි තොරතුරු සම්පාදනය සහ මඟ පෙන්නවීම සැළසුම් අංශයේ කාර්යයන් අතර ප්‍රධාන වේ.එසේම විදේශිය ආධාර ලබා ගත හැකි ආයෝජකයින් වෙත ව්‍යාපෘති වාර්තා සකස්කර ඉදිරිපත් කිරීම සහ සම්බන්ධීකරණයද මෙම අංශයේ කාර්යභාරය වේ.

### සංවර්ධන අංශය

සැමට ක්‍රීඩාව යන තේමාව යටතේ ප්‍රජාව වෙත මානව සම්පතෙහි යහ ක්‍රියාකාරිත්වය සඳහා සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස මංතිරු ඉදිකිරීමේ ව්‍යාපෘතිය මෙන්ම ජාතික වශයෙන් ක්‍රියාත්මක කරන මහජන හිතකාමී ව්‍යාපෘති සම්බන්ධීකරණය කරනු ලබයි.සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව බලපාන අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම හා අදාළ සම්බන්ධිකරණ කටයුතුද මෙම අංශයේ කාර්යයන් අතර වේ.

### ක්‍රීඩා අංශය

ක්‍රීඩා ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා ජාතික ක්‍රීඩා අරමුදල යෙදවීම,මෙහෙයවීම ,ප්‍රගති පාලනය හා විදේශිය තරඟ සඳහා සහ පුහුණුවීම් සඳහා සහභාගිවන දේශිය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට රාජ්‍ය අනුග්‍රහය හා පහසුකම් සපයාදීම මෙම අංශයේ කාර්යයන් අතර ප්‍රධාන වේ.එසේම ක්‍රීඩා සංගම්/සම්මේලන සම්බන්ධීකරණය මෙම වැදගත් කාර්යයන් අතර ප්‍රධාන වේ.තවද රජය විසින් වරින් වර පිරිනමන බදු සහිත ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ යෙදවීමද ඉන් ප්‍රතිලාභ ක්‍රීඩක /ක්‍රීඩිකාවන් වෙත ලබාදීමද ක්‍රීඩා අංශය විසින් ඉටු කරනු ලබයි.

## විගණන අංශය

අමාත්‍යාංශයේ අනෙකුත් අංශ වලින් ස්වාධීනව ලේකම්තුමා වෙත සෘජුවම වගකියන අභ්‍යාන්තර විගණන අංශය , විදුලි සංදේශ,විදේශ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ පවතින සියළුම ආයතනයන්හි පරිපාලන මූල්‍ය හා ආයතනික විනය ආරක්ෂා කිරීම සඳහා යහපත් මඟ පෙන්නවීමක් සමඟින් ඉහළ කළමණාකරණය නිවරදිව හසුරුවීම විගණන අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.මෙම අංශය මඟින් මුදල් අමාත්‍යාංශය ,විගණකාධිපති දෙපාර්තමේන්තුව සහ විදුලි සංදේශ,විදේශ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන සමඟ විගණන හා කළමණාකරණ කමිටු 4ක් 2017 වර්ෂය තුළ පවත්වා ඇත.

## මාධ්‍ය අංශය

මාධ්‍ය අංශය විසින් ක්‍රීඩා සංස්කෘතියක් බිහි කිරිමෙහිලා විශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි.ඒ අනුව විවිධ සමාජ ස්ථර ඔස්සේ වයස් බේදයකින් තොරව තරුණ,බාල හා ජ්‍යෙෂ්ඨ පුද්ගලයින් හා ක්‍රීඩාව බැද තැබීමට මාධ්‍ය හැසිරවීම වඩාත් බලවත් වේ.එසේ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මඟින් තනි තනි පුද්ගලයින් මෙන්ම සමාජ කණ්ඩායම් දැනුවත් කිරීම ක්‍රීඩාවේ ව්‍යවහාරයට යහපත් ලෙස මඟ පාදයි. විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ඔස්සේ ක්‍රීඩා වැඩසටහන් ප්‍රචාරය කිරීම,ක්‍රීඩාව ගොඩ නැංවීම සඳහා නිවරදි මාධ්‍ය භාවිතය,ක්‍රීඩා පිළිබද ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් පැවැත්වීම,ක්‍රීඩාවේ නිවරදි භාවිතය සමඟින් මාධ්‍ය සමුළු පැවැත්වීම,ක්‍රීඩා මාධ්‍යවේදීන් ඇගයීම හා ක්‍රීඩාවට අදාළව දත්ත හා තොරතුරු ඒකරාශි කිරීම මාධ්‍ය අංශයේ කාර්යභාරය වේ.

## ප්‍රසම්පාදන අංශය

ප්‍රසම්පාදන අංශය විසින් විදුලි සංදේශ,විදේශ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනවල සියළුම භාණ්ඩ මිලදී ගැනීම හා සේවා සැපයීම්වලට අදාලව ප්‍රසම්පාදන කටයුතු ඉටු කරනු ලබයි.එහිදි භාණ්ඩ හා සේවා සපයන නියෝජිත ආයතන සමග මනා සම්බන්ධීකරණයෙන් යුතුව කටයුතු කෙරේ.එසේම , විදුලි සංදේශ,විදේශ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය සඳහා විවිධ අංශ යටතේ සුදුසුකම් ලත් සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ කටයුතු සිදුකරන අතර , විදුලි සංදේශ,විදේශ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතනවලට අදාලව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම කිරීම හා ප්‍රගති සමාලෝචනය ද සිදු කෙරේ.තවද, විදුලි සංදේශ,විදේශ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන වල වාර්ෂික ප්‍රසම්පාදන කමිටු පත්කිරීම හා විවිධ ප්‍රසම්පාදනයන්ට අදාලව තාක්ෂණික ඇගයීම් කමිටු පත්කිරීම සිදුකරයි.

## නීති ඒකකය

විදුලි සංදේශ,විදේශ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය සහ එහි විෂය පථයට අයත් රාජ්‍ය ආයතන වල නීතිමය කටයුතු සඳහා උපදෙස් ලබාදීම පනත් කෙටුම්පත් ,රෙගුලාසි වැනි නීතිමය ලියවිලි සකස් කිරීම,නීතිපති දෙපාර්තමේන්තුව හා සම්බන්ධීකරණය ,මානව හිමිකම් පැමිණිලි සම්බන්ධව ක්‍රියා කිරීම සහ අමාත්‍යාංශයේ සහ එහි විෂය පථයට අයත් රාජ්‍ය ආයතන වල නිලධාරීන්ගේ රාජකාරි විෂය පථයට අදාල කරුණක් මත වග උත්තරකරුවන් වන නඩු සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම හා නඩු කටයුතු සඳහා අමාත්‍යාංශය නියෝජනය කරමින් සහභාගීවීම නීති ඒකකය මඟින් සිදු කෙරේ.

## ක්‍රීඩා අංශය යටතේ පිහිටුවා ඇති ආයතන

1. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව
2. සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය
3. ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය
4. ක්‍රීඩා වෛද්‍ය ආයතනය
5. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය
   එක් එක් ආයතන සඳහා වෙන් කළ ප්‍රතිපාදන මත ව්‍යාපෘති ආයෝජන වියදම පහත පරිදි වේ.

විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශයේ තිබෙන අනෙක් ආයතන අතර **2018.12.31**

| # | ආයතනය | අයවැය යෝජනා | | අතිරේක ප්‍රතිපාදන | එකතුව |
|---|---|---|---|---|---|
| | | මූලධන | පුනරාවර්තන | | |
| **1** | ගරු ක්‍රීඩා අමාත්‍යතුමාගේ කාර්යාලය | - | - | | **-** |
| **2** | විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශය (ක්‍රීඩා) | 1,500.00 | | 179.55 | **1679.55** |
| 3 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 400.00 | 50.00 | 5.70 | **455.70** |
| **4** | සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය | 600.00 | - | | **600.00** |
| **5** | ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය | - | - | | **-** |
| **6** | ක්‍රීඩා වෛද්‍ය ආයතනය | 75.00 | - | **3.45** | **78.45** |
| **7** | ශ්‍රී ලංකා උත්තේජක මර්ධන නියෝජ්‍යායතනය | 25.00 | - | | **25.00** |
| එකතුව | | **2,600.00** | **50.00** | **188.70** | **2,838.70** |

දිනට අරමුදල් බෙදීයාම හා ප්‍රගතිය

විදුලි සංදේශ, විදේශ රැකියා හා විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා අංශය වෙත ලබා දුන් අතිරේක ප්‍රතිපාදන

| ආයතනය | වෙන් කිරීම (රු.මි.) | | | **2018.12.31** වන විට වියදම (රු.මි.) | | |
|---|---|---|---|---|---|---|
| | මූලධන | පුනරාවර්තන | එකතුව | මූලධන | පුනරාවර්තන | එකතුව |
| ගරු ක්‍රීඩා අමාත්‍යතුමාගේ කාර්යාලය | 8.40 | 51.80 | **60.20** | 6.15 | 27.01 | **33.16** |
| ක්‍රීඩා අමාත්‍යාංශය | 2,538.90 | 139.77 | **2,678.89** | 721.36 | 126.05 | **847.41** |
| ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 2,259.30 | 1,144.45 | **3,403.75** | 1003.40 | 922.80 | **1,926.20** |
| සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය | 1,398.00 | 200.00 | **1,598.00** | 223.07 | 183.50 | **406.57** |
| ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය | 74.90 | 28.81 | **103.71** | 47.48 | 25.02 | **72.50** |
| ක්‍රීඩා වෛද්‍ය ආයතනය | 139.25 | 68.80 | **208.05** | 60.86 | 49.27 | **110.13** |
| ශ්‍රී ලංකා උත්තේජක මර්ධන නියෝජ්‍යායතනය | 175.10 | 36.00 | **211.10** | 113.55 | 31.68 | **145.23** |
| එකතුව | **6,593.85** | **1,669.85** | **8,263.70** | **2,175.87** | **1,365.33** | **3,541.20** |

**2018 වසරේ ලද අතිරේක ප්‍රතිපාදනයන්හි මූල්‍ය ප්‍රගතිය (රු. මි.)**




2018 වර්ෂය තුළ ක්‍රීඩා ක්ෂේත්‍රයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා අයවැය යෝජනා මත රුපියල් මිලියන 2,650.00 ක අතිරේක ප්‍රතිපාදන විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශය (ක්‍රීඩා අංශය) වෙත වෙන් කර ඇත. එහි ප්‍රගතිය පහත දැක්වේ.

| ආයතනය | ව්‍යාපෘතිය | වෙන් කළ මුදල (රු.මි.) | 2018.12.31 දිනට වැය කළ මුදල (රු.මි.) | 2018.12.31 දැනට ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශය -ක්‍රීඩා අංශය | දියගම මහින්ද රාජපක්ෂ ජාතික ක්‍රීඩා ඇකඩමිය | 1400.00 | 154.38 | 11 |
| | ග්‍රාමීය ක්‍රීඩාංගන සංවර්ධනය | 100.00 | 99.79 | 99 |
| | **උප එකතුව** | **1,500.00** | **254.17** | **17** |
| ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | මාතර කොටුවිල ක්‍රීඩාගාරය ඉදිකිරීම | 100.00 | 0.00 | 0 |
| | පොළොන්නරුව නේවාසිකාගාරය ඉදිකිරීම | 100.00 | 0.00 | 0 |
| | කල්මුනේ සන්දාන්ගනී ක්‍රීඩාගාරය ඉදිකිරීම | 100.00 | 0.00 | 0 |
| | මාතලේ හොකී ක්‍රීඩාංගනය | 100.00 | 0.00 | 0 |
| | ප්‍රවීන හා වෙනස් හැකියාවන්ගෙන් යුක්ත ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට සහය දැක්වීම | 50.00 | 22.51 | 45 |
| | **උප එකතුව** | **450.00** | **22.51** | **5** |
| සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය | සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගනය නවීකරණය කිරීම | 100.00 | 27.01 | 27 |
| | සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනය නවීකරණය කිරීම | 500.00 | 0.00 | 0 |
| | **උප එකතුව** | **600.00** | **27.01** | **5** |
| ක්‍රීඩා වෛද්‍ය ආයතනය | මානව කාර්ය සාධන පරීක්ෂණාගාරයේ ඉදිකිරීම් | 75.00 | 24.61 | 33 |
| | **උප එකතුව** | **75.00** | **24.61** | **33** |
| ශ්‍රී ලංකා උත්තේජක මර්ධන නියෝජ්‍යායතනය | මත් ද්‍රව්‍ය විරෝධි ජාතික වැඩසටහන් හා මත්ද්‍රව්‍ය පරීක්ෂණ හා පර්යේෂණාගාරයක් ඉදි කිරීම | **25.00** | **15.75** | **63** |
| | **උප එකතුව** | **25.00** | **15.75** | **63** |
| එකතුව | | **2,650.00** | **344.05** | **13** |

| අමාත්‍ය මණ්ඩල සංදේශ | | | | | | |
|---|---|---|---|---|---|---|
| අංකය | අමාත්‍ය මණ්ඩල සංදේශයේ විස්තර | ඉදිරිපත් කළ දිනය | අනුමැතිය ලද දිනය | කැබිනට් තීරණ අංකය | අමාත්‍ය මණ්ඩල තීරණය | මේ වන විට ප්‍රගතිය හා ගත් ක්‍රියාමාර්ග |
| 2018/01 | ක්‍රීඩා අමාත්‍යාංශය සඳහා උපදේශකවරයෙකු පත් කිරීම | 2018.01.08 | 2018.01.30 | අමප/18/0028/747/001 | අනුමත කරන ලදී. | මිල්ටන් අමරසිංහ මහතා පත් කර ඇත. |
| 2018/02 | පළාත් හා දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ පරිපාලනය සඳහා ඒකාබද්ධ වැඩපිළිවෙලක් සකස් කිරීම | 2018.01.05 | 2018.03.20 | අමප/18/0036/747/002 | එවකට පළාත් සභා,පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යතුමාගේ නිරීක්ෂණ සඳහා කල් තබන ලදී. | එවකට පළාත් සභා,පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යතුමාගේ නිරීක්ෂණ සඳහා කල් තබන ලදී. |
| 2018/03 | කොළඹ මහ නගර සභාව සතු හෙන්ද්‍රි පේදිරිස් ක්‍රීඩා පිටිය ක්‍රීඩා අමාත්‍යාංශය වෙත පවරාගෙන හෝ දීර්ඝ කාලීන බදු පදනම මත ලබාගෙන එහි පරිපාලනය සිදු කිරීම සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීම. | 2018.01.26 | 2018.02.14 | අමප/18/0195/747/004 | සංදේශයේ සඳහන් යෝජනා පිළිබඳව අධ්‍යාපන ඇමතිතුමා හා එවකට පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අධ්‍යාපන ඇමතිතුමා හා ඒකාබද්ධව අමාත්‍ය මණ්ඩලයට යෝජනාවක් ඉදිරිපත් කිරීමට යෝජනා කරන ලදී. | අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සාකච්ඡා පවත්වන ලදී. |
| 2018/04 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් පත් කිරීම. | 2018.03.09 | 2018.04.02 | අමප/18/0475/747/005 | එච්.එම්.බී.පී. හේරත් මහතා සය මසකට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ධූරයට පත් කිරීමට අනුමත කරන ලදී. | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ධූරයට එම්.එම්.බී.පී.හේරත් මහතා පත් කරන ලදී. |
| 2018/05 | 2013 අංක 33 දරණ ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 34(1) වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම. | නව අංකය යටතේ නැවත ගැසට් විය.(CP/2018/28) | 2018.04.05 | අමප/18/0538/747/006 | CP/2018/56 යන අංකය යටතේ 2018.10.07 දින අමාත්‍ය මණ්ඩල සටහනක් ඉදිරිපත් කරන ලදී. | අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩල සටහන සමඟ ගැසට් නිවේදන 90 ක් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී. |
| 2018/06 | ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ 2014/2015 වර්ෂයන්හි වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම. | 2018.04.09 | 2018.06.12 | අමප/18/0747/747/007 | අනුමත කරන ලදී. | පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2018/07 | සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ ක්‍රිකට් ක්‍රීඩාංගණයේ බදු ගිවිසුම සංශෝධනය කිරීම. | 2018.04.08 | 2018.05.10 | අමප/18/0756/747/008 | | |
| 2018/08 | සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ පාපන්දු ක්‍රීඩා පිටිය නඩත්තු කර පවත්වාගෙන යාම සඳහා උපදේශන සේවාව ලබා ගැනීම. | 2018.04.09 | නැවත නව අමාත්‍යතුමාගේ අනුමැතිය යටතේ ඉදිරිපත් කරන ලෙස එවන ලදී. | - | - | - |
| 2018/09 | සූර්යය උත්පාදක බලශක්ති පද්ධති (SOLAR POWER SYSTEM) ස්ථාපිත කිරිම. | ඉදිරිපත් කර නැත. | - | - | - | - |
| 2018/11 | යෝජිත මාතලේ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය සඳහා මීටර් 400, මංතීරු 9 කින් යුතු 2වන පන්තියේ කෘතිම ධාවන පථයක් සැලසුම් කර ඉදිකිරිම.(නව අංකය CP/2018/45 යටතේ ඉදිරිපත් කරන ලදී.) | 2018.09.20 | අනුමැතිය ලැබී නැත. | - | නැවත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමට දන්වන ලදී. | නැවත ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා යොමු කර ඇත. |
| 2018/12 | රත්නපුර පළාත් ක්‍රීඩා සංකීර්ණයෙහි මීටර් 400 මංතීරු නවයකින් යුතු දෙවන පන්තියේ කෘතිම ධාවන පථය ඉදිකිරිම..(නව අංකය CP/2018/45 යටතේ ඉදිරිපත් කරන ලදී.) | 2018.09.20 | අනුමැතිය ලැබුනි. | අමප/12/2332/837/022/ටීබීආර් | රත්නපුර පළාත් ක්‍රීඩා සංකීර්ණයෙහි ඉදිකිරීමට සැලසුම් කල මීටර් 400 මංතීරු නවයකින් යුතු දෙවන පන්තියේ කෘතීම ධාවන පථයට අදාල ප්‍රසම්පාදන කටයුතු අවලංගු කිරීමට හා ඇඹිලිපිටිය මහවැලි ක්‍රීඩාංගනය මෙම කෘතීම ධාවන පථය ඉදිකිරීම සඳහා වඩාත් සුදුසු බවට යෝජනාව සඳහා අනුමැතිය ලැබුනි. | ධාවන පථය සකස් කිරීම සඳහා පිරිවිතර සකස් කරමින් පවතී. |
| **අමාත්‍ය මණ්ඩල සංදේශ** | | | | | | |
| CP/2018/30 | 1973 අංක 25 දරණ ක්‍රීඩා නීතියේ 41 වන වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් පනවන ලද නියෝගය-අමාත්‍ය මණ්ඩල සටහනක් ඉදිරිපත් කරන ලදී. | 2018.07.11 | 2018.08.24 | අමප/18/01528/837/007 | අංක 2073/15 දරණ 2018/05/31 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය අනුමැතිය පිණිස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරිම සඳහා අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී. | පාර්ලිමේන්තුවේ සභාගත කිරිමට ඉදිරිපත් කරන ලදී. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| CP/2018/32 | ක්‍රීඩා කෞශලායයන් සඳහා ප්‍රවේශය සහතික කිරීමේ ව්‍යාපෘතියෙහි ක්‍රීඩා උපදේශක සුසන්තිකා ජයසිංහ මහත්මිය | 2018.07.31 | 2018.09.18 | 18/1724/837/010 | ක්‍රීඩා කෞශලායයන් සඳහා ප්‍රවේශය සහතික කිරීමේ ව්‍යාපෘතියෙහි ක්‍රීඩා උපදේශක ලෙස රු. 80,000 ක දීමනාව යටතේ සුසන්තිකා ජයසිංහ මහත්මිය 2018 ජූලි මස සිට ක්‍රීඩා උපදේශක තනතුරට පත් කිරිමට අනුමැතිය ලබා දෙන ලදී. | සුසන්තිකා ජයසිංහ මහත්මිය ක්‍රීඩා උපදේශක තනතුරට පත් කරන ලදී. |
| CP/2018/33 | දකුණු ආසියානු ක්‍රීඩා උළෙල, නේපාලය-2019 | 2018.09.20 | අනුමැතිය ලැබි නැත. | - | - | මෙවැනි අරමුණු උදෙසා “දක්ෂතා සංවර්ධනය” යන ව්‍යාපෘතිය යටතේ වාර්ෂිකව රු.මි. 600ක් ප්‍රතිපාදන ඇති හෙයින් එම ප්‍රතිපාදන තුල කළමනාකරණය කරගැනීමට මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යවරයා විසින් නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී. |
| CP/2018/35 | ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ පර්යේෂණ ඒකකය සඳහා පරියේෂණාගාර උපකරණ මිලදීගැනීම. | 2018.09.11 | 2018.10.03 | අමප/18/2199/837/019 | ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ ස්ථාපනය කිරීමට යෝජිත ජාත්‍යන්තර ප්‍රමිතීන්ගෙන් යුතු පර්යේෂණ ඒකකය සඳහා ඉහත යෝජනාව මගින් දක්වන ලද පර්යේෂණ උපකරණ මිලදී ගැනීමට අවශ්‍ය වන රු.මි. 101 ක (බදු සහිත) මුදල් රජයේ ඒකාබද්ධ අරමුදලෙන් වෙන් කර ගැනීමට හා එම ප්‍රතිපාදන ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත 2019 වර්ෂයේ ප්‍රතිපාදන යටතේ ලබා දීම සඳහා අනුමැතිය ලැබුණි. | ප්‍රසම්පාදන පිරිවිතරයන් සකස් කරමින් පවතී. |
| CP/2018/41 | ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරිම. | 2018.09.06 | අනුමැතිය ලැබි නැත. | | - | - |

විගණන තොරතුරු

1.1. ශීර්ෂය - 136 - ක්‍රීඩා අමාත්‍යාංශය

1.2. විෂයය - ශීර්ෂය 136 ක්‍රීඩා අමාත්‍යාංශය පිළිබඳව

1.3. විගණකාධිපති වාර්තාව - 2017 වර්ෂය

උක්ත විගණන විමසුම සඳහා පිළිතුරු පහත පරිදි වේ.

**2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

--------------------------------------------

**2.3 කාර්ය සාධනය**

-------------------------------------------

**2.3.1 කාර්යභාරයන් ඉටුකිරීම**

-----------------------------------------

**(අ) ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය**

-----------------------------------------

2017 අතැති බිල්පත් සඳහා ක්‍රීඩාංගන 67 ක් වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් වෙත ප්‍රතිපාදන නිදහස් කල අතර අවිච්ඡේද ව්‍යාපෘති සඳහාද ප්‍රතිපාදන නිදහස් කර එම ව්‍යාපෘති අවසන් කරන ලදී. 2018 වර්ෂයේ ව්‍යාපෘති 250 ක් හඳුනාගෙන අදාල ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත නිදහස් කර ඇත.

**(ආ) සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණයේ ධාවන පථය**

-----------------------------------------------

2018 වර්ෂයේදි මීටර් 200 සහ මීටර් 400 ධාවන පථ සාදා නිම කරන ලද අතර එය ජාතික හා ජාත්‍යන්තර තරඟ පැවැත්වීම සඳහාද භාවිතා කරනු ලැබේ.

**(ඇ) ශ්‍රී ලාංකිකයින් දිනාගත් ජාත්‍යන්තර ජයග්‍රහණ**

--------------------------------------------

2018 තුන්වන කාර්තුව අවසානයේදි ජාත්‍යන්තර තරඟ ඉසව් 11 කට සහභාගි වී ලබා ගත් පදක්කම් සටහන පහත පරිදි වේ.

| අංකය | ක්‍රීඩාව | තරගාවලිය | පැවැත් වූ රට | පදක්කම් | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | | | | රන් | රිදී | ලෝකඩ | |
| 01 | වුෂූ | දකුණු ආසියානු වුෂූ තරගාවලිය | පකිස්ථානය | 06 | 01 | 03 | 10 |
| 02 | බර ඉසිලීම | පොදුරාජ්‍ය මණ්ඩලීය මළල ක්‍රීඩා උළෙල | ඕස්ට්‍රේලියාව | - | 01 | 02 | 03 |
| 03 | බොක්ෂිං | | | - | - | 03 | 03 |
| 04 | මීටර ) 400ගෘහස්ථ( | 8 වන ආසියානු ගෘහස්ථ මළල ක්‍රීඩා තරඟාවලිය | ඉරානය | 01 | - | 01 | 02 |
| 05 | දුර පැනීම | | | - | - | 01 | 01 |
| 06 | මීටර 800 | | | - | - | 01 | 01 |
| 07 | මීටර 800 | තායිලන්ත විවෘත මළල ක්‍රීඩා තරගාවලිය | තායිලන්තය | 01 | - | - | 01 |
| 08 | දුර පැනීම | | | 01 | - | 01 | 02 |
| 09 | උස පැනීම | | | 01 | - | - | 01 |
| 10 | හෙල්ල විසි කිරීම | | | 01 | - | - | 01 |
| 11 | මීටර 400 | | | 01 | - | - | 01 |
| 12 | මීටර 200 | | | - | 01 | - | 01 |
| 13 | මීටර කඩුලු 400 | තායිලන්ත විවෘත මළල ක්‍රීඩා තරගාවලිය | තායිලන්තය | - | 01 | - | 01 |
| 14 | සත්ප්‍රයාම | | | - | - | 01 | 01 |
| 15 | මීටර කඩුලු 100 | | | - | - | 01 | 01 |
| 16 | මීටර ) 100පිරිමි( | 18 වන ආසියානු ක්‍රීඩා උළෙලට සමගාමීව පැවැත්වූ ආරාධිත තරඟාවලිය | ඉන්දුනීසියාව | 01 | - | - | 01 |
| 17 | මීටර ) 400කාන්තා( | | | - | - | 01 | 01 |
| 18 | මීටර ) 400පිරිමි( | | | 01 | - | 01 | 02 |
| 19 | හෙල්ල විසි කිරීම (පිරිමි) | | | - | 01 | - | 01 |
| 20 | හෙල්ල විසි කිරීම (කාන්තා) | | | 01 | - | - | 01 |
| 21 | දුර පැනීම (පිරිමි) | 18 වන ආසියානු ක්‍රීඩා උළෙලට සමගාමීව පැවැත්වූ ආරාධිත තරඟාවලිය | ඉන්දුනීසියාව | - | - | 01 | 01 |
| 22 | මීටර ) 1500කාන්තා( | | | - | 01 | - | 01 |
| 23 | මීටර බාධක 300 දිවීම (කාන්තා) | | | 01 | - | - | 01 |
| 24 | දශප්‍රයාම (පිරිමි) | | | - | 01 | - | 01 |
| 25 | තුන් පිම්ම (කාන්තා) | | | - | 01 | 01 | 02 |
| 26 | මීටර 5000 (පිරිමි) | | | - | - | 01 | 01 |
| 27 | මීටර බාධක 3000 (පිරිමි) දිවීම | | | 01 | - | - | 01 |
| 28 | මීටර ) 800කාන්තා( | | | - | 01 | 01 | 02 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 29 | මීටර 400x 4(පිරිමි) | | | - | - | 01 | 01 |
| 30 | මීටර 100x 4(පිරිමි) | | | - | 01 | - | 01 |
| අංකය | ක්‍රීඩාව | තරගාවලිය | පැවැත් වූ රට | පදක්කම් | | | එකතුව |
| | | | | රන් | රිදී | ලෝකඩ | |
| 31 | මීටර ) 400කාන්තා( | 18 වන ආසියානු කනිෂ්ඨ මළල ක්‍රීඩා ශූරතාව | ජපානය | - | 01 | - | 01 |
| 32 | මීටර ) 400පිරිමි( | | | 01 | 01 | - | 02 |
| 33 | මීටර ) 100කාන්තා( | | | - | 01 | - | 01 |
| 34 | මීටර බාධක 3000 දිවීම (කාන්තා) | | | 01 | - | - | 01 |
| 35 | මීටර ) 800කාන්තා( | | | - | 01 | - | 01 |
| 36 | මීටර ) 200කාන්තා( | | | - | 01 | - | 01 |
| 37 | මීටර 400x 4 (කාන්තා) | | | - | - | 01 | 01 |
| 38 | මීටර 400x 4(පිරිමි) | | | 01 | - | - | 01 |
| 39 | මීටර ) 100පිරිමි( | මැලේසියානු විවෘත මළල ක්‍රීඩා තරගාවලිය | මැලේසියාව | 01 | - | - | 01 |
| 40 | මීටර ) 100කාන්තා( | | | - | 01 | - | 01 |
| 41 | මීටර ) 400පිරිමි( | | | 01 | - | - | 01 |
| 42 | මීටර කඩුලු 400 | | | 01 | - | - | 01 |
| | එකතුව | | | **23** | **16** | **22** | **61** |
| 01 | කැරම් (පිරිමි) | ජාත්‍යන්තර කැරම් ශූරතාවලිය | කොරියාව | ශූරතාව | | | |
| 02 | කැරම් (කාන්තා) | | | අනු ශූරතාව | | | |
| 03 | නෙට්බෝල් | ආසියානු නෙට්බෝල් ශූරතාවලිය | සිංගප්පූරු | ශූරතාව | | | |

## 2.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

--------------------------------

**නුවරඑළිය ක්‍රීඩා නිවහන ඉදිකිරීම**

----------------------------------

2018.10.31 දින වන විට වහලය දක්වා ඉදිකිරීම් අවසන් කර ඇති අතර අවසන් වැඩ නිම කිරීමට (Finishing Work) ඇත. ප්‍රමාණාත්මක විචලතාවයක් මත අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව වෙත බිල් අංක 12 සහ 13 සමඟ ලියකියවිලි ඉදිරිපත් කර ඇති අතර 2019.02.28 දක්වා කාලය දීර්ඝ කර ඇත.

**පාසල් 100 ක ක්‍රිකට් ක්‍රීඩාව නැංවීම**

--------------------------------------

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිර්දේශ මත Hard ball ක්‍රිකට් ක්‍රීඩාවෙහි යෙදෙන තෝරාගත් පාසල් සඳහා ක්‍රිකට් භාණ්ඩ කට්ටල 680ක්,පිට්ටනි ආවරණ 60ක්,මැටින් 220 ක්, සහ ක්‍රිකට් නෙට් 50 ක් සඳහා 2018 දී රුපියල් මිලියන 95.60 ක් ගෙවා ඇත.

**2.3 වත්කම් කළමණාකරණය**

**---------------------**

**(අ) වාහන උපයෝජනය**

**---------------------**

**ඉන්ධන දහනයවීම පරික්ෂා නොකිරීම**

**--------------------------------------**

PD-4920 අංක දරණ කැබ් රථය 2018.08.19 දිනෙන් පසු කාර්මික දෝශ නිසා ධාවනය කල නොහැකි වී ඇත.අළුත්වැඩියාවන් ඉටුකල වහාම ඉන්ධන පරික්ෂා කිරීමට කටයුතු කරනු ලැබේ.

YV-8356 - ත්‍රීවිල් රථයයේ ඉන්ධන පරික්ෂාව 2018.04.02 දින ඉටුකරන ලදී.

**(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

**--------------------------------------**

මෙම වාහනය නැවත අමාත්‍යාංශයට භාර දීමට කටයුතු කරන ලෙසට සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය වෙත 2018.09.11 දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇති අතර සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ සභාපතිතුමාගේ වාචික ඉල්ලීම පරිදි 2019.09.28 දින තෙක් එම වාහනය භාවිතා කිරීම සඳහා අවසර ලබා දී ඇත .

**2.4 කාර්යභාරයන් ඉටුකිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම**

**---------------------------------------------------------------------------------------------**

අනෙකුත් වර්ෂවලට සාපේක්ෂව 2017 වර්ෂයේදි ක්‍රීඩා අමාත්‍යාංශය අපේක්ෂිත මූලධන ව්‍යාපෘති සඳහා විශාල ප්‍රතිපාදනයක් අයවැය ඇස්තමේන්තු වලින් හා අයවැය සාකච්ඡාවේදි ලැබුණු අතර පහත සඳහන් හේතුන් මත අනෙකුත් වර්ෂවලට සාපේක්ෂව ප්‍රතිපාදනවල ඉතිරිවීමේ ප්‍රතිශතය වැඩිවී ඇත.

(අ) (ආ) **මූලධන වියදම්**

පහත සඳහන් හේතුන් නිසා මූලධන වියදම් ඉතිරිවීම් සිදුවී ඇත.

**01-01-** **අමාත්‍ය කාර්යාලයේ ව්‍යාපෘතියේ මූලධන වියදම් ඉතිරිවීමට හේතු**

2001 - අමාත්‍ය කාර්යාලය අමාත්‍යාංශ ගොඩනැගිල්ලේම පැවතීම

2002 - යන්ත්‍ර උපකරණ අළුතික් මිලදී ගැනීම නිසා පුනරුත්තාපනය සීමා වීම

**01-02 - ආයතන හා පරිපාලන සේවා ව්‍යාපෘතියේ මුලධන වියදම් ඉතිරිවීමට හේතු**

2001 - අමාත්‍යාංශ ගොඩනැගිල්ල අළුතින් ඉදිකරන ලද එකක් වීම නිසා වැඩිදියුණු කිරීම් සීමාවීම

2103 - බැඳීම් පැවති නමුත් බිල්පත් ඉදිරිපත් නොවීම

3-2201 - ප්‍රමාණවත් පරිදි අක්මුදල් නොලැබීම

4-2201 - ප්‍රමාණවත් පරිදි අක්මුදල් නොලැබීම

**02-03 - ක්‍රීඩා සංවර්ධන ව්‍යාපෘතියේ මුලධන වියදම් ඉතිරිවීමට හේතු**

1-2506 - ප්‍රාදේශිය ලේකම් කාර්යාල යටතේ පවතින ව්‍යාපෘති සඳහා අවශ්‍ය ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත යවා තිබුනද වර්ෂ අවසානයේදි අක්මුදල් නොලැබීම මත ප්‍රතිපාදන ඉතිරි වී ඇත

2-2104 - අදාල ප්‍රසම්පාදනයේදි අභියායවනා ඉදිරිපත් වීම හේතුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලියේදි දක්වා තිබු කාලරාමුව ප්‍රමාද වීම සහ 2017.12.31 අක් මුදල් නොමැතිවීම මත ප්‍රතිපාදන ඉතිරිව ඇත.

5-2104 - විදේශ ණය ආධාර මත ක්‍රියාත්මක කරන ව්‍යාපෘතියක් බැවින් දෙරට ණය ගිවිසුමකට බැඳිය යුතු අතර ශ්‍රී ලංකාව සහ ව්‍යාපෘති යෝජක ආයතනය සමඟ ණය ගිවිසුමකට බැඳීම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ නීතිපති දෙපාර්තමේන්තුව විසින් ණය කොන්දේසි සකස් කරමින් පවතී.එම කටයුතු අවසන් නොමැති වීම නිසා වියදම් දරා නොමැත.

7-2506 , 7-2401,7-2509 ,7-2103 -

ක්‍රිකට් ක්‍රීඩාව සඳහා යටිතල පහසුකම් සැපයීමට පාසල් තෝරාගෙන අදාල දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ප්‍රතිපාදන නිදහස් කරනු ලැබුවද අක්මුදල් වර්ෂ අවසානයේදි දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ලැබී නොමැත. තවද පාසල් තුළ රජයේ විභාගයන් පැවැත්වෙන කාල සීමාවන් තුළ ඉදිකිරීම් කටයුතු සඳහා බාහිර පාර්ශවයන්ට ඇතුල්වීමට අවසර නොමැති බැවින් ඉදිකිරීම් ප්‍රමාද වි ඇත. ඉදිකිරීම් සම්බන්ධ තාක්ෂණික දැනුම ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ලබාදුන්නද මෙම ව්‍යාපෘතිය නව වැඩ ක්ෂේත්‍රයක් බැවින් තාක්ෂණික නිලධාරින්ට ඉදිකිරීම් සම්බන්ධ දැනුම ප්‍රමාණවත් නොවීම ඇතුළු කරුණු හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරිවීම් සිදුව ඇත.

8-2104 - මේ යටතේ දියගම ක්‍රීඩාංගණය වැඩිදියුණු කිරීම සඳහා අයවැය යෝජනා යටතේ අනුමත වු රු. මිලියන 500ක් ප්‍රතිපාදන පැවති නමුත් අදාල ප්‍රසම්පාදනයේදි අභියායවනා ඉදිරිපත් වීම හේතුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලියේදි දක්වා තිබු කාලරාමුව ප්‍රමාද වීම හේතුවෙන් ඉතිරිවීම් සිදුව ඇත.

9-2401 - මේ යටතේ ක්‍රීඩා පාසල් සඳහා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අයවැය යෝජනා යටතේ රු.මි.20 ක් ප්‍රතිපාදන පැවති නමුත් මේ යටතේ දුනු ශිල්ප හා වෙඩි තැබීමේ පුහුණු පිටි ඉදිකිරීමට අවශ්‍ය පියවර ගෙන තිබුණද ක්‍රීඩාවේ විශේෂඥතාවය මත අවශ්‍ය සැලසුම් ශිල්පියෙකු ලබා ගැනීම අපහසු වූ බැවින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකිරීමට අවශ්‍ය ලිපි ලේඛන(ප්‍රමාණ පත්‍ර,සැලසුම් සහ ඇස්තමේන්තු) ලබාගැනීම ප්‍රමාද වූ අතර වර්ෂ අවසානයේ අක්මුදල් හිඟය මත ප්‍රතිපාදන ඉතිරි විය

10-2104 - මෙම ප්‍රතිපාදනය අයවැය යෝජනා යටතේ නුවරඑළිය ඉහළ උණතාංශ ක්‍රීඩා සංකීර්ණ සඳහා නියමිත විදේශ ණය ආධාර මත ක්‍රියාත්මක කරන ව්‍යාපෘතියක් බැවින් දෙරට ණය ගිවිසුමකට බැඳිය යුතු අතර ශ්‍රී ලංකාව සහ ව්‍යාපෘති යෝජක ආයතනය සමඟ ණය ගිවිසුමකට බැඳීම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ නීතිපති දෙපාර්තමේන්තුව විසින් ණය කොන්දේසි සකස් කරමින් පවතී.එම කටයුතු අවසන් නොමැති වීම නිසා වියදම් දරා නොමැත.

13-2001 -මෙම ව්‍යාපෘතිය අයවැය ව්‍යාපෘතියේ දිශානතිය ජාත්‍යන්තර ප්‍රමිතින්ට අනුව සැලසුම් කර නොතිබුනෙන් මූලික සැලසුම් වෙනස් කිරීමට සිදුවීම. ඒ අනුව ව්‍යාපෘතියේ කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි විය.

**02-04 - ක්‍රීඩා විද්‍යායතනයේ මූලධන වියදම් ඉතිරිවීමට හේතු**

2002-නව යන්ත්‍ර මිලදී ගැනීම නිසා ඉතිරි වී ඇත.

2003 -බිල්පත් ඉදිරිපත් නොවීම

2103 - බැඳීම් පැවති නමුත් බිල්පත් ඉදිරිපත් නොවීම

2104 - බැඳීම් පැවති නමුත් බිල්පත් ඉදිරිපත් නොවීම

2401 - බැඳීම් පැවති නමුත් බැඳීම් පැවති නමුත් හා ඉඩකඩ මදිවීම හේතුවෙන් පවත්වනු ලබන පාඨමාලා සීමිත වීම

**02-05 - ක්‍රීඩා වෛද්‍යායතනයේ ව්‍යාපෘතියේ මූලධන වියදම් ඉතිරිවීමට හේතු**

2001 -නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම හේතුවෙන් දැනට භාවිතා කරන ගොඩනැගිල්ලේ නඩත්තු වියදම් සීමා වීම

2002 -නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සැලසුම් කිරීම නිසා අවශ්‍යතා සීමා වීම

2003 -බැඳීම් පැවති නමුත් බිල්පත් ඉදිරිපත් නොවීම

2102 -ගොඩනැගිල්ල සාදා නිම කිරීමෙන් අනතුරුව අවශ්‍ය ගෘහ භාණ්ඩ මිලදී ගැනීමට සැලසුම් කිරීම

2103 - බැඳීම් පැවති නමුත් බිල්පත් ඉදිරිපත් නොවීම

2104 - බැඳීම් පැවති නමුත් බිල්පත් ඉදිරිපත් නොවීම

2-2507-අක්මුදල් නොමැතිවීම

3-2104 - බැඳීම් පැවති නමුත් බිල්පත් ඉදිරිපත් නොවීම හා වැඩ අවසන් නොවීම

3-2103 - බැඳීම් පැවති නමුත් බිල්පත් ඉදිරිපත් නොවීම

**2.5 රජයේ නිලධාරින්ට අත්තිකාරම් බී ගිණුම**

**-----------------------------------------**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ සීමාවන්**

**-------------------------------------------**

**හිඟහිටි ශේෂ අයකර නොගැනීම**

**---------------------------------**

**(අ) එම්.ජේ.කොඩිතුවක්කු - රු.116,015.00**

රාජ්‍ය සේවා කොමිසන් සභාව විසින් අංක PSC/APL/6/25/2015 හා 2018 අගෝස්තු මස ලිපියට අනුව අනිවාර්ය විශ්‍රාම ගැන්වීමට තීරණය කර ඇති බැවින් විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

**එන් කවීතා - රු.1,000.00**

ණය ශේෂය අයකර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී.

**ජේ.එන්.ජයරත්න - රු.134,731.50**

ණය ශේෂය අය කර ගැනීම සඳහා නීතිපති මඟින් කටයුතු කරමින් පවතී.

**2.6 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**------------------------------------**

2017 දෙසැම්බර් 31 දිනට අනුව බැංකු ප්‍රකාශයේ ශේෂයක් නොමැති බව දන්වා ඇත්තේ එම දිනට බැංකුව විසින් බැංකු ගිණුමේ රඳවා තබන මුදල් ප්‍රමාණයක් බැවිනි. තවද මේ පිළිබඳව බැංකුවෙන් විමසා ලිපි යවා ඇති අතර මෙතෙක් පිළිතුරු ලැබී නොමැත.පිළිතුර ලද පසු විගණනයට ඉදිරිපත් කරනු ලැබේ.

## 2.7 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

-----------------------------------------

### (අ) ස්ථාවර වත්කම් ලේඛනය

--------------------------

ස්ථාවර වත්කම් පරිගණකගත ලේඛනයක් සකස් කිරීමට මෘදුකාංගයක් ලබාගෙන ඇති අතර ආරම්භක ශේෂයද සමඟ මෙම මෘදුකාංගය යටතේ පරිගණකගත කොට සම්පූර්ණ කර යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කරමින් පවතී

### (ආ) ඇප ලේඛනය

--------------

ඇප ලේඛනය සකස් කර ඇත. යාවත්කාලීන කිරීමට පියවර ගනු ලැබේ.

## 2.8 අභ්‍යන්තර විගණනය

---------------------

ඉදිරි විගණන කටයුතු වලදී ගෙවීම් වව්චර් නියැදි පරික්ෂා කටයුතු මෙන්ම කාර්යාල විගණන කටයුතුද අභ්‍යන්තර විගණන අංශය මඟින් ඉටුකිරීමට අවශ්‍ය පියවර යොදා ඇත.

## 2.9 මානව සම්පත් කළමණාකරණය

---------------------------------

**අනුයුක්ත කාර්ය මණ්ඩලය,තත්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

-------------------------------------------------------------------------------------

විගණනය පෙන්වා දුන් සේවක සංඛ්‍යාව නිවැරදි වන අතර වර්ථමාන තත්ත්වය පහත පරිදි වේ.

| කාණ්ඩය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 32 | 19 | 13 |
| තෘතියික මට්ටම | 15 | 09 | 06 |
| ද්විතියික මට්ටම | 109 | 96 | 13 |
| ප්‍රාථමික මට්ටම | 83 | 74 | 09 |

| | | | |
|---|---|---|---|
| වෙනත් (අනියම්/තාවකාලික/කොන්ත්‍රාත්) | 04 | 04 | 0 |
| **එකතුව** | **243** | **202** | **41** |

**(i)** 2017.12.31 දිනට පැවති පුරප්පාඩු වලින් පුරප්පාඩු 20 ක් සම්පූර්ණ කිරීමට කටයුතු කර ඇති අතර ඉතිරි පුරප්පාඩු ඉදිරියේදී සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ලැබේ.

## ක්‍රීඩා යටිතල පහසුකම්

### නුවර එළිය ක්‍රීඩා නිවහන ඉදිකිරීම



නුවර එළිය නගරයේ සුවිශේෂී පහසුකම් සහිතව ඉදිකිරීමට නියමිත දෙමහල් ගොඩනැගිල්ල වර්ග අඩි 11,500 කට ආසන්න වන අතර ඉහළ මාලයේ විශේෂ අමුත්තන්ගේ කාමර හතරක්, පහළ මාලයේ නිදන කාමර 5ක් සහ විශේෂ පහසුකම් සහිත 10 දෙනෙකු සඳහා නිදන ශාලා පහසුකම් වලින් සමන්විත වේ.

මේ වන විට වහලය දක්වා ඉදිකිරීම් අවසන් වී ඇති අතර නිම කිරීමේ වැඩ, භූමි අලංකරණය, ගෘහ භාණ්ඩ මිලදී ගැනීම ආදි මූලික අවශ්‍යතාවන් ඉටුකරමින් පවතී. 2019 මුල් කාර්තුවේදී එය ජනතා අයිතියට පැවරීමට අපේක්ෂා කෙරේ. මේ සඳහා 2018 වර්ෂයේ දී රුපියල් මිලියන 50 ක් වෙන් වීතිබුණි. ඉන් 60% ක් පමණක් වියදම් දැරීමට හැකිවිය.

### ඉහළ උන්නතාංශ ක්‍රීඩා පුහුණු සංකීර්ණය ඉදිකිරීම

නුවරඑළිය දිස්ත්‍රික්කයේ නුවරඑළිය නගරයේ ක්‍රීඩා අමාත්‍යාංශයට අයත් හෙක්ටයාර් 34.5 ක් වන ඉඩමේ යෝජිත ඉහළ උන්නතාංශ ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීමට අපේක්ෂා කෙරේ. ඉහළ උන්නතාංශ ක්‍රීඩා පුහුණු මධ්‍යස්ථානයක් ඉදිවිය යුත්තේ මුහුදු මට්ටමෙන් මීටර් 1,500-3,500 උසින් වන අතර යෝජිත නුවරඑළිය ඉහළ උන්නතාංශ ක්‍රීඩා_සංකීර්ණය පිහිටුවන භූමිය මුහුදු මට්ටමේ සිට මීටර 1,895ක උසින් පිහිටා ඇත.

උන්නතාංශය වැඩිවත්ව එවැනි පසුබිමක පුහුණුවීම් ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දරා ගැනීමේ හැකියාව (Endurance) වර්ධනය වේ. ඒ නිසා මලල ක්‍රීඩාවල යෙදෙන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දරා ගැනීමේ හැකියාව ඉහළ නංවා ගැනීමට මෙය ඉවහල් වන අතර කබඩි, දැල්පන්දු, හොකී, පිහිනීම, පාපැදි, රගර්, වොලිබෝල් වැනි එළිමහන් හා ගෘහස්ථ ක්‍රීඩා පුහුණුවීම් සඳහා මෙවැනි පසුබිමක් වාසිදායක වන අතර දරා ගැනීමේ හැකියාව වැඩි වේ.

එකග වූ ණය නියමයන් හා කොන්දේසි අනුව ශ්‍රී ලංකා රජය හා අදාල ණය හිමියන් සමග ණය ගිවිසුමකට බැඳීමට නියමිත අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් හා ප්‍රංශයේ Ellipse Project SAS ආයතනය සමග වානිජ ගිවිසුමක සහ කොන්ත්‍රාත් ගිවිසුමට අත්සන් තබා ඇත. මෙම ව්‍යාපෘතියෙ හි ණය ගිවිසුම මුදල් අමාත්‍යාංශය සමඟ ඉදිරියේදි අත්සන් කිරීමට නියමිතය. 2018.12.31 වන විට මෙම ව්‍යාපෘතිය සඳහා කළ වියදම මිලියන 2.21 ක් ලෙස සඳහන් කළ හැකිය.මේ යටතේ ඉදිකිරීමට යෝජිත පහසුකම් පහත පරිදි වේ.

- ගෘහස්ථ ක්‍රීඩා සංකීර්ණය
- උණුසුම් පිහිනුම් තටාක
- ක්‍රීඩා හෝටලය
- හොකී රගර් සහ පාපන්දු පිටි
- ටෙනිස් ක්‍රීඩාංගණය
- අනවසරව පදිංචි පවුල් 55ක් සඳහා මූලික පහසුකම් සහිත නිවාස
- කාය වර්ධන මධ්‍යස්ථානය (Gymnasium) සහ ශක්ති වර්ධන මධ්‍යස්ථාන (Physical fitness training center)
- දේශන ශාලාව වෛද්‍ය මධ්‍යස්ථානය සහ ක්‍රීඩා පර්යේෂණ ඒකකය
- මීටර් 400 කෘතිම ධාවන පථය හා මීටර 400 තණකොල සහිත (ස්වභාවික) ධාවන පථය
- ක්‍රිකට් ක්‍රීඩා පිටිය
- නුවරඑළිය නගර ශාලාව නවීකරණය
- අනෙකුත් ක්‍රීඩා යටිතල පහසුකම්

## ග්‍රාමීය ක්‍රීඩාංගන සංවර්ධනය - 2018

ග්‍රාමීය ක්‍රීඩාංගන සංවර්ධනය කිරීම සඳහා 2018 වර්ෂයේදී දිස්ත්‍රික්ක 25 ක ක්‍රීඩා පිටි 337 ක් (අවිච්ඡේද 67ද ඇතුළුව) සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 350.55 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ලබාදී තිබෙන අතර ග්‍රාමීය ක්‍රීඩාංගන හා පාසල් ක්‍රීඩාංගන සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියට ඇතුළත් වේ. ඊට අමතරව පළාත් පාලන ආයතන හරහාද ව්‍යාපෘති කඩිනම් කිරීමේ අදහසින් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදි. එසේ වුවද වර්ෂය අවසානයේ රුපියල් මිලියන 70 කට අධික මුදලක් අතැති බිල්පත් ලෙස ගෙවීමට අක්මුදල් හිඟතාව මත වගකීම් ලෙස ඉතිරිවී ඇත.

## පාසල් ක්‍රිකට් ක්‍රීඩාව සංවර්ධනය කිරීම.

2017 වසරේ දී දුරස්ථ පාසල් තුළ ක්‍රිකට් ක්‍රීඩාව නැංවීමේ අරමුණින් අයවැය යෝජනාවකින් ආරම්භ කළ මෙම සංවර්ධන ව්‍යාපෘතිය දුරස්ථ ප්‍රදේශයන් හි පාසල් සඳහා අවශ්‍ය ක්‍රිකට් ක්‍රීඩා අයිතම සැපයීම 2018 වර්ෂයේ දී ද ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමයේ සහය ඇතිව ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව පාසල් පිළිබඳ ශක්‍යතා අධ්‍යයනය කර අඛණ්ඩව ක්‍රිකට් ක්‍රීඩාවෙහි යෙදෙන පාසල් සඳහා ක්‍රිකට් ලණු පැදුරු 200ක් ද , තණකොළ කපන යන්ත්‍ර 100ක්ද, 01 ටොන් අත්රෝලර් 100ක්ද, අත් ට්‍රැක්ටර් 100ක් හා Boundary rope 200ක් බෙදා දීමට නියමිතය. මේ සඳහා අදාළ භාණ්ඩ මිලදී ගැනිමට අවශ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය මේ වන විට සිදුකරමින් පවති. 2018 දෙසැම්බර් 31 වන විට වියදම් කළ මුදල රුපියල් මිලියන 103.42 කි. අක්මුදල් ඌනතාවය මත මෙම ව්‍යාපෘතියේද අතැති බිල්පත් ඉතිරි වී ඇත.

## දුනු විදීමේ පිටි සහ වෙඩිපිටි ඉදිකිරීම.

ආසියානුවන්ගේ ශක්තිමත් බාහු සහ තියුණු ඇස් වල පිහිටීම දුනු ශිල්පය සහ වෙඩි තැබීම වැනි ක්‍රීඩාවන්හි යෙදීමට අනුබලයක් වේ. ඒ තුළින් පදක්කම් දිනාගැනීමට යොමු විය හැකි බව විද්‍යාත්මක පර්යේෂණ තුළින් අනාවරණය වී ඇත. ශ්‍රී ලාංකිකයන්ගේ සහජ කුසලතා තුළින් ජාත්‍යන්තරය ජය ගැනීමට ලද මහඟු අවස්ථාවක් සේ සලකා දුනු ශිල්පය කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත.

ඒ අනුව දුනු ශිල්පය සඳහා සාම්ප්‍රදායික හුරුවක් ඇති ඌව පළාත තුළ උතුරු කැබිල්ලෙවෙල ප්‍රදේශයේ දුනු විදිමේ පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමට මූලික පියවර ගෙන ඇත. ඉන් අනතුරුව ජාතික මට්ටමේ දුනු ශිල්ප පිටිය වෝටර්ස් එජ්හි ඉදිකිරීමට අවශ්‍ය මූලික පියවර ගෙන ඇති අතර ඊට අමතරව කුරුණෑගල මලියදේව පිරිමි විද්‍යාලයේ දුනු විදිමේ පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීමේ කටයුතු මෙම වසරේ ආරම්භ කර ඇත. තවද දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථාන 20ක් සහ පාසල් පුහුණු මධ්‍යස්ථාන 30ක් සඳහා දුනුවිදීමේ උපකරණ මිලදී ගැනීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවති. 2018 වසර තුළදි පාසල් දුනුවිදීමේ සංගමය ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. 2018 දෙසැම්බර් 31 වන විට වියදම් කළ මුදල රුපියල් මිලියන 11.22 කී.

## කුමාර් ආනන්දන් පිහිණුම් තටාකය ඉදි කිරීම.

ජාත්‍යන්තර පිහිණුම් පදක්කම්ලාභී කුමාර් ආනන්දන් සිහිවනු වස් යාපනයේ වැලිවැට්තුරේ ඉදිකරමින් පවතින මංතීරු 6කින් හා මීටර 25කින් යුත් පිහිනුම් තටාකයේ ව්‍යුහාත්මක ඉදිකිරීම් අවසන් වී ඇති අතර ජලකාන්දු පරීක්ෂාව සිදුවේ. ප්‍රාදේශීය ක්‍රීඩක/ක්‍රීඩිකාවන්ට පුහුණු අවස්ථාව ලබාදීම මෙහි අරමුණු වේ. 2018 දෙසැම්බර් 31 වන විට වියදම් කළ මුදල රුපියල් මිලියන 20.90 ක් වන අතර 2019දී අවසන් කිරීමට අපේක්ෂිතය.

## ජාතික ක්‍රීඩා සතිය.

ජාත්‍යන්තර ක්‍රීඩා දිනය යෙදෙන අප්‍රියෙල් 06 වෙනිදාට සමගාමීව ක්‍රීඩා සතියක් මැයි මස 21 සිට 25 දින දක්වා සියළුම ජන කොටස් ආවරණය වන පරිදි ශ්‍රී ලංකාව පුරා ආයතනික මට්ටමින් සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකාවේ අවුරුදු 68ට අඩු මරණ වලින් 65%ක් බෝනොවන රෝග නිසා සිදුවන අතර එම තත්වය කෙරෙහි ශාරීරික ක්‍රියාකාරිත්වය (physically low active) අඩුවීම විශාල බලපෑමක් ඇති කරයි. එම තත්වය පිළිබඳව ප්‍රජාව අවබෝධ කරලමින් සෑම ජ නකොටසකටම නිවැරදි

සෞඛ්‍ය පුරුදු හා ව්‍යායාම් ක්‍රම පිළිබඳ අවබෝධය ලබාදී එම ක්‍රියාකාරකම් වසර පුරාවටම අඛණ්ඩව ක්‍රියාකරවීම තුළින් නිරෝගී පරපුරක් බිහිකරලීම මෙහි අරමුණ වේ. ඒ අනුව සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් වෙත, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත වැඩසටහන සාර්ථක කරගැනීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දී සාර්ථකව වැඩසටහන දිවයින පුරා ජනගත කිරීමට හැකිවිය. ඒ අනුව රුපියල් මිලියන 30ක ආයෝජන තුළින් සාර්ථක ප්‍රතිලාභ ලබාකර ගැනීමට හැකිවිය.

2018 වර්ෂයේ ක්‍රීඩා හා ශරීර සුවතා ප්‍රවර්ධන ජාතික සතිය ක්‍රියාත්මක කිරීමේ හා මූල්‍ය ප්‍රගතිය මේ වන විට පළාත්,දිස්ත්‍රික්ක හා ප්‍රදේශිය ලේකම් කාර්යාල වලින් ලබා දී ඇති අතර ඒ සඳහා පහත සඳහන් පරිදි ප්‍රතිපාදන ලබා දී ඇත. පළාත් 09 සඳහා රු. 900,000.00 දිස්ත්‍රික්ක සඳහා 25 සඳහා රු. 1,250,000.0 ක් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 331ක් සඳහා රු.16, 550,000.00 බැගින් රු18,700,000.00 ප්‍රතිපාදන ලබා දී ඇත.

## ඇවිදීමේ මංතීරු ඉදිකිරීම.

2016 වර්ෂයේ සිට සෞඛ්‍ය අමාත්‍යාංශය, නාගරික සංවර්ධන අධිකාරිය සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල ඒකාබද්ධව ක්‍රියාත්මක කරන මෙම වැඩසටහන සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ප්‍රතිපාදන ලබාදී ක්‍රියාත්මක කරනු ලැබේ. බෝනොවන රෝග ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා නාගරික හා අර්ධ නාගරික ජනාකීර්ණ ප්‍රදේශ ආශ්‍රිතව ක්‍රියාත්මක කරන මෙම ව්‍යාපෘතිය යටතේ වැඩසටහන් 18ක් ක්‍රියාත්මක වේ. දැනට අවසන් කර ඇති ව්‍යාපෘති සඳහා ව්‍යායාම උපකරණ කට්ටල අදාල පළාත් පාලන ආයතනයට හෝ රජයේ ආයතනයට ගිවිසුමක් මඟින් භාරදෙන ලදී. මෙම වැඩසටහන සාර්ථකව ජනගත කිරීමට සමත් වූ අතර ඒ සඳහා වෙන්කර ඇති මුදල රුපියල් මිලියන 50කි. සෑම ප්‍රා දේශීය ලේකම් කොට්ඨාසයකටම එක් ඇවිදීමේ මං තීරුවක් ලබා දීමට සැලසුම් කර ඇත. දැනටමත් දිස්ත්‍රික්ක 10ක් ආවරණය කිරීමට සමත් වී ඇත.

## දියගම ජාත්‍යන්තර ක්‍රීඩා සංකීර්ණය ක්‍රීඩා ඇකඩමියක් හා අන්තර් ජාතික ක්‍රීඩාංගණයක් ලෙස සංවර්ධනය කිරීම.

කොළඹ දිස්ත්‍රික්කයේ හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි අක්කර 120 කින් සමන්විත දියගම ජාත්‍යන්තර ක්‍රීඩාංගනය හා ඇකඩමිය ශ්‍රී ලාංකීය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ අධ්‍යාත්මික, විද්‍යාත්මක, මානසික හා පුහුණු යන අංශ ආවරණය වන ආකාරයට මානව කුසලතා සංවර්ධනය කිරීමට යෝජිත ව්‍යාපෘතියකි. 2021දී ආසියානු ක්‍රීඩා උළෙල සඳහා ශ්‍රී ලංකාවට සත්කාරකත්වය ලබාගැනීමේ අපේක්ෂාවෙන් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

මෙම ක්‍රීඩාංගණ පරිශ්‍රයෙහි දැනටමත් මීටර් 400 කෘතිම ධාවන පථයක්, බේස් බෝල් පිටියක්, රගර් පිටියක්, හා අඩක් නිම කළ මීටර් 50 පිහිණුම් තටාකයක් හා ගෘහස්ථ ක්‍රීඩාගාරයකින් ද සමන්විත වේ. මෙය අංග සම්පූර්ණ ගෘහස්ථ ක්‍රීඩාංගණයක්, පිහිණුම් තටාකයක්, මීටර් 400 කෘතිම ධාවන පථයක්, මීටර් 200 පුහුණු ධාවන පථයක් ඇතුළු ජාත්‍යන්තර පහසුකම් වලින් සමන්විත ක්‍රීඩා ඇකඩමියක් හා ක්‍රීඩා පාසලක් ලෙස සංවර්ධනය කිරීමට දැනටමත් සැලසුම් කර ඇත. තවද, එය ක්‍රීඩාගාර, දේශණ ශාලා, සම්මන්ත්‍රණ ශාලා, පරිපාලන ගොඩනැගිලි හා නිල නිවාස, ක්‍රීඩකයන් හා පුහුණුකරුවන් සඳහා නේවාසිකාගාර ඉදිකිරීමට ද නියමිතය. එයට අමතරව ක්‍රීඩා වෛද්‍යායතනය, ක්‍රීඩා විද්‍යායතනය, ක්‍රීඩා පර්යේෂණ අංශයක්, ක්‍රීඩාව හා අධ්‍යාපනය සමබරව පවත්වාගෙන යාහැකි පරිදි ක්‍රීඩා විද්‍යාලයක්ද ස්ථාපනය කිරීමට අපේක්ෂිතය.

මෙම ක්‍රීඩා ඇකඩමිය හා ක්‍රීඩා පාසල ස්ථාපිත කිරීමෙන් ජාතික මට්ටමෙන් ක්‍රීඩාවේ උන්නතිය ලබාකර ගැනීමටත්, වැඩි පිරිසක් ක්‍රිඩාව කෙරෙහි යොමු කර ගැනීමත්, ඒ තුළින් ක්‍රීඩා කුසලතා දක්වන දරුවන්ට ඉහළ අපේක්ෂාවන් තැබිය හැකි ප්‍රවේශයක් සකස් කිරීමටත් බලාපොරොත්තු වේ.

2017 දී දේශීය අරමුදලින් රුපියල් මිලියන 500ක් වෙන් කර දැනට පවතින සංවර්ධන ව්‍යාපෘති කිහිපයක නවීකරණ කටයුතු ආරම්භ කරන ලදී. ඒ අනුව 2018 වර්ෂයේදී මූලික අවශ්‍යතා ලෙස වැසිකිලි කැසිකිලි පද්ධතිය ඉදිකිරීම, මීටර 400 කෘතිම ධාවන පථය ඉදිකිරීම ආරම්භ කරන ලද අතර මේ වන විට එම වැඩසටහන් අවසන් අදියරේ හි පවතී. එසේම කණිෂ්ඨ ප්‍රේක්ෂකාගාරයේ නවීකරණ කටයුතු ද ආරම්භ කර ඇත. මේ සඳහා 2018 වර්ෂයේදී රුපියල් මිලියන 1500 ක මුදලක් වෙන් කර ඇති අතර එම වැඩසටහන් වලට අදාලව මූලික සැලසුම්, ඇස්තමේන්තු හා ප්‍රමාණපත්‍ර සකස් කර අවසන් වී ඇති අතර ප්‍රසම්පාදන කටයුතු සඳහා සූදානම්ව පවතී. ඒ අනුව 2018 වර්ෂය සඳහා වෙන් කළ මුදලින් 2018 දෙසැම්බර් 31 වන විට වියදම් කළ මුදල රුපියල් මි.ලි. 154.38 කි.

**ක්‍රීඩා අංශයේ නිලධාරීන් සඳහා ලබා දුන් විදේශීය පුහුණු වැඩසටහන පිළිබඳ විස්තර (2018.12.31) දක්වා**

| # | පාඨමාලාවේ නම | රට | නිලධාරීන් ගණන |
|---|---|---|---|
| 01 | කළමනාකරණ විගණනය පිළිබඳව රාජ්‍ය අංශ අභ්‍යන්තර විගණකවරුන් සඳහා වන විදේශ වැඩසටහන | මැලේසියාව | 01 |
| 02 | 2018 Seminar on Major Sports Events Organization for Developing Countries | චීනය | 02 |
| 03 | PIM International Programme in Management | ඉන්දුනිසියාව | 02 |
| 04 | Training Course for Fiber optic Technology and cabling installation | මැලේසියාව | 01 |

**ක්‍රීඩා අංශයේ නිලධාරීන් සඳහා ලබා දුන් දේශීය පුහුණු වැඩසටහන පිළිබඳ විස්තර (2018.12.31) දක්වා**

| # | පාඨමාලාවේ නම හා රට | ආයතනය | නිලධාරීන් ගණන |
|---|---|---|---|
| 1 | පෞද්ගලික ලිපිගොනුවක් ඵලදායි ආකාරයෙන් පවත්වාගෙන යාම. එක් දින පුහුණු වැඩසටහන | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 2 |
| 2 | සංවර්ධන නිලධාරි සේවයේ II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017 දෙදින සුවිශේෂී සම්මන්ත්‍රණය | නිපුණතා සංවර්ධන අරමුදල | 2 |
| 3 | ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිබඳව රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ එක් දින පුහුණු වැඩසටහන් | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | 1 |
| 4 | ගබඩාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (දින 05 කි.) | ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය | 1 |
| 5 | Advance Excel පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2 |
| 6 | නවක කළමනාකරණ සහකාරවරුන්ගේ වෘත්තීය සංවර්ධනය.(දින 04 කි.) | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 13 |
| 7 | Higher National Diploma in Public Procurement and Contract Administration (HNDIPPCA) 2018/2019 | Sri Lanka Institute of Development | 2 |

| | | | |
|---|---|---|---|
| | | Aadministration (SLIDA) | |
| 8 | සික්ස් සිග්මා පුහුණු වැඩමුළුව. එක් දින පුහුණුවකි. | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | 1 |
| 9 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මඟින් පවත්වනු ලබන අභ්‍යන්තර විගණනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව-2018 (දින 04 ක පාඨමාලාවකි.) | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 2 |
| 10 | ඵලදායී රාජ්‍ය සේවයක් සඳහා ගිණුම්කරණය පිළිබඳ දෙදින පුහුණු වැඩමුළුව | නිපුණතා සංවර්ධන අරමුදල | 3 |
| 11 | ඵලදායිතාව සඳහා තොරතුරු තාක්ෂණය පිළිබඳ එක් දින වැඩසටහන | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | 1 |
| 12 | ප්‍රාථමික ශ්‍රේණියේ (IV මට්ටම) නිලධාරීන් සඳහා පැය 50 දෙමළ භාෂා පාඨමාලාව | ක්‍රීඩා අමාත්‍යාංශය | 43 |
| 13 | කථන දෙමළ පාඨමාලාව | ක්‍රීඩා අමාත්‍යාංශය | 30 |
| 14 | ලිඛිත දෙමළ පාඨමාලාව | ක්‍රීඩා අමාත්‍යාංශය | 10 |
| 15 | Diploma course in contract management & Procurement management for construction and Procurement Professionals | SLIDA | 1 |
| 16 | ගබඩා කළමනාකරණය හා මිලදී ගැනීම් ක්‍රමවේදය පිළිබඳ දෙදින පුහුණුව | නිපුණතා සංවර්ධන අරමුදල | 1 |
| 17 | රියදුරු මහතුන්ගේ ආකල්ප හා වෘත්තීය දැනුම ඉහළ නැංවීම | නිපුණතා සංවර්ධන අරමුදල | 1 |
| 18 | කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි | නිපුණතා සංවර්ධන අරමුදල | 1 |

## ක්‍රීඩා සංගම් නිලධාරින් හා ක්‍රීඩකයින් විදේශගතවීම

**විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශය අනුමැතිය මත විදේශගත වූ ක්‍රීඩකයන් සම්බන්ධ තොරතුරු පහත පරිදි වේ.**

| අනු අංකය | සංගමයේ/සම්මේලනයේ නම | නිලධාරීන් ගණන | ක්‍රීඩකයින් ගණන | මුළු ගණන |
|---|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා ක්‍රිකට් | 17 | 307<br>අතිරේක ක්‍රීඩකයින් - 54 | 378 |
| 02 | ශ්‍රී ලංකා දුනුවිදීමේ සංගමය | 11 | 21 | 32 |
| 03 | ශ්‍රී ලංකා පැසිපන්දු සම්මේලනය | 17 | 89 | 106 |
| 04 | ශ්‍රී ලංකා බ්‍රිජ් සම්මේලනය | 03 | 08 | 11 |
| 05 | ශ්‍රී ලංකා කඹ ඇදීමේ සම්මේලනය | 08 | 20 | 28 |
| 06 | ශ්‍රී ලංකා සර්ෆින් සම්මේලනය | 03 | 08 | 11 |
| 07 | ශ්‍රී ලංකා කැරම් සම්මේලනය | 03 | 08 | 11 |
| 08 | ජාතික වෙඩි තැබීමේ සම්මේලනය | 09 | 15 | 24 |
| 09 | ශ්‍රී ලංකා බේස්බෝල් සහ මෘදු පන්දු සංගමය | 34 | 108 | 142 |
| 10 | ජාතික ජිම්නාස්ටික් සංගමය | 16 | 31 | 47 |
| 11 | ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය | 83 | 151 | 234 |
| 12 | ජාතික පැරාලිම්පික් කමිටුව | 22 | 60 | 82 |
| 13 | ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමය | 62 | 211 | 273 |
| 14 | ශ්‍රී ලංකා හොකී සම්මේලනය | 60 | 122 | 182 |

| | | | | |
|---|---|---|---|---|
| 15 | ශ්‍රී ලංකා කාය වර්ධන හා ශාරීරික යෝග්‍යතා සම්මේලනය | 01 | 02 | 03 |
| 16 | ශ්‍රී ලංකා මුයිතායි සංගමය | 17 | 20 | 37 |
| 17 | ශ්‍රී ලංකා සැම්බෝ සම්මේලනය | 04 | 04 | 08 |
| 18 | ශ්‍රී ලංකා ආධුනික සෙපැක්ටැක්රෝ සංගමය | 12 | 18 | 30 |
| 19 | ශ්‍රී ලංකා මොඩර්න් පෙන්ටැත්ලෝන් සම්මේලනය | 01 | 02 | 03 |
| 20 | ශ්‍රී ලංකා මෝටර් සයිකල් සම්මේලනය | 06 | 05 | 11 |
| 21 | ශ්‍රී ලංකා බිලියඩ් හා ස්නූකර් සංගමය | 09 | 11 | 20 |
| 22 | ශ්‍රී ලංකා නෙට්බෝල් සම්මේලනය | 35 | 72 | 107 |
| 23 | ශ්‍රී ලංකා කබඩි සම්මේලනය | 09 | 18 | 27 |
| 24 | ශ්‍රී ලංකා වුෂු සම්මේලනය | 20 | 36 | 56 |
| 25 | ශ්‍රී ලංකා මේසපන්දු සංගමය | 11 | 79 | 90 |
| 26 | ශ්‍රී ලංකා ටයිකොන්ඩෝ සම්මේලනය | 01 | 08 | 09 |
| 27 | ශ්‍රී ලංකා රග්බි | 82 | 173 | 255 |
| 28 | ශ්‍රී ලංකා බොක්ෂිං සංගමය | 69 | 40 | 109 |
| 29 | ශ්‍රී ලංකා රුවල් ඔරු සංගමය | 4 | 10 | 14 |
| 30 | ශ්‍රී ලංකා ස්ක්‍රැබල් සංගමය | 01 | 10 | 11 |
| 31 | ශ්‍රී ලංකා කුඩෝ සංගමය | 01 | 05 | 06 |
| 32 | ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනය | 69 | 44 | 113 |
| 33 | ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සම්මේලනය | 13 | 57 | 70 |
| 34 | ශ්‍රී ලංකා ජල ක්‍රීඩා සම්මේලනය | 07 | 23 | 30 |
| 35 | ශ්‍රී ලංකා පාපැදි සම්මේලනය | 05 | 06 | 11 |
| 36 | ශ්‍රී ලංකා ජීවිතාරක්ෂක සම්මේලනය | 05 | 11 | 16 |
| 37 | ශ්‍රී ලංකා යුනිෆයිට් සම්මේලනය | 05 | 11 | 16 |
| 38 | ශ්‍රී ලංකා ජුඩෝ සම්මේලනය | 08 | 27 | 35 |
| 39 | ශ්‍රී ලංකා කරාතේ සම්මේලනය | 20 | 29 | 49 |
| 40 | ශ්‍රී ලංකා සවි එසවීමේ සම්මේලනය | 04 | 14 | 18 |
| 41 | ශ්‍රී ලංකා කැනොයින් හා කායකින් සම්මේලනය | 09 | 11 | 20 |
| | **එකතුව** | **776** | **1905**<br>අතිරේක ක්‍රීඩකයින් - 54 | **2735** |

## ශ්‍රී ලාංකේය ක්‍රීඩාවේ උන්නතිය සඳහා විදේශීය රටවල් සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම.

විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශය ක්‍රීඩා අංශය විසින් විදේශීය රාජ්‍යයන් සමඟ ඇති කර ගත් අවබෝධතා ගිවිසුම් සම්බන්ධ ප්‍රගතිය සලකා බැලීමේදී 2018.12.31 දින වන විට රටවල් 11ක් සමඟ අවබෝධතා ගිවිසුම් 12ක් අත්සන් කර ඇත. ඒ අනුව, විදේශීය රටවල් සමඟ එළඹි අවබෝධතා ගිවිසුම් වල ප්‍රගතිය පහත පරිදි දක්වා ඇති අතර එවකට ක්‍රීඩා බාර ගරු අමාත්‍යතුමාගේ හා අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් ඉහත විදේශීය රාජ්‍යයන්හි තානාපති හා මහකොමසාරිස්වරුන් සමඟ පවත්වා ඇත.

01. **කෙන්යාව**

මෙම අමාත්‍යාංශය හා කෙන්යා රජය අතර ඇති කර ගෙන ඇති අවබෝධතා ගිවිසුමෙහි එකඟතාවයන්ට අනුව මෙරට දිගු හා මැදි දුර පුහුණුකරුවන් දහසයදෙනෙකු (16) 2017.01.23 වන දින සිට 2017.02.05 වන දින දක්වා කෙන්යාවේදී පැවති පුහුණු වැඩසටහනක් සඳහා සහභාගි විය. ඒ අනුව, ඉහත පුහුණු වැඩසටහන සඳහා සහභාගි වූ පුහුණුකරුවන් දහසයදෙනා තම සමකාලීන පුහුණුකරුවන් පස්දෙනෙකුට

(05) හා සියලුම පුහුණුකරුවන් තමන් යටතේ පුහුණුව ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන් 10 දෙනෙකුට එම පුහුණුව ලබාදීමේ වැඩසටහනක් ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන අතර එහි ප්‍රගතිය පිළිබඳව සාකච්ඡා මට්ටමින් පවතී.

**02. සීෂෙල්ස්**

මෙම අමාත්‍යාංශය සහ සීෂෙල්ස් රජය අතර ඇතිකර ගෙන ඇති අවබෝධතා ගිවිසුමෙහි ප්‍රතිඵලයක් ලෙස 2014 වර්ෂයේදී සීෂෙල්ස් රජයේ බොක්ෂිං හා මලල ක්‍රීඩකයින් පිරිසකට මෙරට පුහුණු අවස්ථා ලබාගැනීමට හැකියාව ලැබිණි. ඒ අනුව, අත්සන් කර ඇති අවබෝධතා ගිවිසුමට අනුව මෙරට පිහිණුම් හා බැඩ්මින්ටන් ක්‍රීඩකයින් සඳහා ද සීෂෙල්ස් රාජ්‍යයේ පුහුණු අවස්ථා ලබා ගැනීම සම්බන්ධව සීෂෙල්ස් රාජ්‍යය වෙත ඍජුව හා මෙරට විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ලිපි ඉදිරිපත් කර ඇතත් මේ වනතෙක් ඒ සඳහා යහපත් ප්‍රතිචාර ලැබී නොමැත. එබැවින්, මෙරට ක්‍රීඩකයින් සඳහා සීෂෙල්ස් රාජ්‍යයේ පුහුණු අවස්ථා නැවත ලබා ගැනීමට අවස්ථාව ලබා ගැනීම සඳහා කටයුතු සකස් වෙමින් පවතී.

**03.පකිස්ථානය**

ක්‍රීඩකයින් සඳහා පුහුණු අවස්ථා, හොකී ක්‍රීඩා උපකරණ ලබා ගැනීම, ස්කොෂ් තරඟාවලි පැවැත්වීම ආදිය සඳහා පකිස්ථානු රජය වෙතින් මෙම අමාත්‍යාංශය අවස්ථා ගණනාවකදී සිදු කළ ඉල්ලීම් වල ප්‍රතිඵලයක් ලෙස මේ වන විට යහපත් ප්‍රතිචාර ලැබී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස පකිස්ථානු ක්‍රීඩා මණ්ඩලය විසින් ශ්‍රී ලංකා රජය වෙත රුපියල් මිලියන 52ක මූල්‍ය පරිත්‍යාගයක් ලබා දීමට නියමිත බව දැනුම් දී ඇති අතර එය සාකච්ඡා මට්ටමින් පවතී.

**04 දකුණු කොරියාව** (අවබෝධතා ගිවිසුම් 02ක් අත්සන් කර ඇත)

මෙම අමාත්‍යාංශය හා දකුණු කොරියාව අතර ඇති කර ගෙන ඇති අවබෝධතා ගිවිසුමෙහි එකඟතාවයන්ට අනුව 2018.04.13 වන දින සිට 2018.05.01 වන දින දක්වා කොරියානු ටයිකොන්ඩෝ පදනම මඟින් සංවිධානය කරන ලද පුහුණු වැඩසටහනක් සඳහා මෙරට ටයිකොන්ඩෝ ක්‍රීඩකයන් එකොළහක් (11) හා නිළධාරියෙකු (01) දකුණු කොරියාව බලා පිටත් විය. ඔවුන් සඳහා ශ්‍රී ලංකා රජය විසින් ගුවන් ටිකට්පත් ලබා දුන් අතර අනෙකුත් වියදම් දකුණු කොරියානු රජය විසින් දරන ලදී. එම පුහුණු වැඩසටහනට සහභාගිවූ ක්‍රීඩකයන්ගේ ප්‍රගතිය පරීක්ෂා කිරීම සාකච්ඡා මට්ටමින් පවතී. දකුණු කොරියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින මිත්‍රත්වය මත කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයේ (KOICA) මූල්‍ය දායකත්වයෙන් ජාතික ටයිකොන්ඩෝ පුහුණු මධ්‍යස්ථානයක් සහ කොරියානු සංස්කෘතික මධ්‍යස්ථානයක් (National Taekwondo and Korean Culture Centre) බත්තරමුල්ල වෝටර්ස් ඒජ් භූමියෙහි ස්ථාපනය කිරීමට යෝජිත අතර එහි ඉදිරි කටයුතු කිරීම පිළිබඳව මේ වන විට සාකච්ඡා මට්ටමින් පවතී.

**05 තජිකිස්ථානු ජනරජය**

මෙම අමාත්‍යාංශය සහ තජිකිස්ථානු ජනරජය අතර ඇතිකර ගෙන ඇති අවබෝධතා ගිවිසුමෙහි ප්‍රතිඵලයක් ලෙස බොක්ෂිං, පාපන්දු, මල්ලවපොර, ජිම්නාස්ටික් යන ක්‍රීඩා සඳහා පහත සඳහන් ඉල්ලීම් ලබා දෙන ලෙස දන්වා විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත.

- පුහුණුකරුවන් සඳහා දිගුකාලීන හා කෙටිකාලීන පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම
- ක්‍රීඩා කළමනාකරණ පාඨමාලා සඳහා පුහුණුකරුවන්ට අවස්ථාව සලසා දීම
- තජිකිස්ථානු බොක්ෂිං පුහුණුකරුවකුගේ සේවය මාස 06ක කාලයක් සඳහා ලබා ගැනීම

**06. බහරේන්**

මෙම අමාත්‍යාංශය සහ බහරේන් රජය අතර ඇතිකර ගෙන ඇති අවබෝධතා ගිවිසුමට අනුව ඉදිරි මූලික කටයුතු සිදු වෙමින් පවතී.

**07.** කටාර්

මෙම අමාත්‍යාංශය හා කටාර් රජය අතර ඇති කර ගෙන ඇති අවබෝධතා ගිවිසුම සඳහා හඳුනා ගත් ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් කටාර් රාජ්‍යයේ අවශ්‍ය සහයෝගය ලබා ගැනීම සඳහා සම්බන්ධීකරණ කටයුතු කර දෙන ලෙස දන්වා 2017.03.09 වන දින විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කර ඇත.

**08.** ඕස්ට්‍රේලියාව

මෙම අමාත්‍යාංශය සහ ඕස්ට්‍රේලියා රජය අතර ඇතිකර ගෙන ඇති අවබෝධතා ගිවිසුමෙහි ප්‍රතිඵලයක් ලෙස ඕස්ට්‍රේලියාවේ අදාළ පාර්ශවයන් සමඟ සම්බන්ධීකරණයෙන් අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. ක්‍රීඩාවේ සංවර්ධනය උදෙසා වසර 05ක සැලැස්මක් අදාළ පාර්ශව සමඟ සම්බන්ධීකරණයෙන් සකස් කරමින් පවතී.

**09.** මාලදිවයින

මෙම අමාත්‍යාංශය සහ මාලදිවයින රජය අතර ඇතිකර ගෙන ඇති අවබෝධතා ගිවිසුමෙහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාව විසින් ක්‍රිකට් ක්‍රීඩාව සඳහා මාලදිවයිනට සහය ලබා දීමට කැමැත්ත පළ කර ඇත.

**10.** ඇෆ්ඝනිස්තානය

මෙම අමාත්‍යාංශය සහ ඇෆ්ඝනිස්තාන රජය අතර ඇතිකර ගෙන ඇති අවබෝධතා ගිවිසුමෙහි ප්‍රතිඵලයක් ලෙස ගොල්ෆ් ක්‍රීඩාව සම්බන්ධයෙන් ඇෆඝනිස්තානයට සහය ලබා දීමට ඇති හැකියාව පිළිබඳව විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් මෙම අමාත්‍යාංශයෙන් විමසා ඇත. ඒ අනුව එලෙස සහය ලබා දීමට ඇති හැකියාව පිළිබඳව මෙම අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා ගොල්ෆ් සංගමය වෙත විමසා යවා ඇත.

**11.** ජර්මනිය

මෙම අමාත්‍යාංශය සහ ජර්මනිය රජය අතර ඇතිකර ගෙන ඇති අවබෝධතා ගිවිසුමෙහි ප්‍රතිඵලයක් ලෙස හෙල්ල විසි කිරීමේ ක්‍රීඩාව සඳහා ජර්මනි රාජ්‍යයේ සහය ලබා ගත හැකි බව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙම අමාත්‍යාංශය වෙත දන්වා ඇත.

## ක්‍රීඩා අරමුදල.

ශ්‍රී ලංකාවේ ක්‍රීඩාව සඳහා ධෛර්ය දීම, ක්‍රීඩාව දියුණු කිරීම, සංවර්නය කිරීම සඳහා ආධාර හා අනුබල දීමේ අරමුණින් 1973 අංක 25 දරණ ජාතික ක්‍රීඩා පනතේ විධි විධාන අනුව ජාතික ක්‍රීඩා අරමුදල පිහිටුවා ඇත. ක්‍රීඩා අරමුදල සඳහා විවිධ ආකාර වූ ආදායම් ප්‍රභවයන් පැවැතියද ජාතික ලොතරැයි මණ්ඩලයේ අලෙවි ආදායමෙන් 2018 හතරවන කාර්තුව අවසාන වන විට රුපියල් 25,000,000/- ක ආදායමක් ලැබී ඇත. එහි දී ක්‍රීඩාව සංවර්ධනය කිරීම, ක්‍රීඩාව දියුණු කිරීම සඳහා ආධාර හා අනුබල දීම වෙනුවෙන් ක්‍රීඩා අරමුදලේ මුදල් ආයෝජනය කරනු ලැබීය. ඉන් කිහිපයක් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| ක්‍රීඩකයින් සඳහා උපහාර | රු. | 23,975,000.00 |
| ජාතික මහ ක්‍රීඩා උළෙල | රු. | 7,233,800.00 |
| පෝෂණ දීමනා | රු. | 21,075,000.00 |
| **එකතුව** | **රු.** | **52,283,800.00** |

## ජනාධිපති ක්‍රීඩා සම්මාන උළෙල - 2018

2016 වසරේ දී ආරම්භ වූ ජනාධිපති ක්‍රීඩා සම්මාන උළෙල 2016 සහ 2017 වර්ෂ තුළ අඛණ්ඩව පැවැත්වූ අතර මෙම සම්මාන උළෙල සඳහා සම්මාන ලබා දීම පිණිස පාදක කර ගත් නිර්ණායක වශයෙන් ඒ සඳහා ඉල්ලුම් කර ඇති අයදුම්කරුවන්ගෙන් අදාල ඉසව්වේ හෝ ක්ෂේත්‍රයේ ඉහළතම දක්ෂතා දක්වන ලද හෝ ප්‍රවීණතාවය විදහාපාන ලද පුද්ගලයන් සැලකිල්ලට ගන්නා ලදි.

මෙහිදි ක්‍රීඩා මාධ්‍ය, ක්‍රීඩා පරිපාලනය , ක්‍රීඩා වෛද්‍ය, ආදී ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය වන පරිදි සම්මාන ලබා දීම සිදු කරන අතර විනිශ්චය මණ්ඩලය විසින් සම්මාන සඳහා පුද්ගලයන් තෝරා ගැනීමේ නිර්ණායක පිළිබඳව පොදුවේ ඒකමතිකව එකඟතාවයකට එළඹෙන ලද අතර සියළුම සම්මානලාභීන් විනිශ්චය මණ්ඩලය විසින් වැඩි වශයෙන් ඒකමතිකව සහ යම් වෙනස්වීම් ඇතිවූ අවස්ථාවන්හිදී වැඩි ඡන්දයෙන්ද, එහෙත් විනිශ්චය මණ්ඩලයේ එකඟතාවයෙන් යුතුවද තෝරා ගනු ලබන අතර 2018 වර්ෂයේ ජනාධිපති ක්‍රීඩා සම්මාන උළෙල නොපැවැත්විණ.

## 2019/2020 සඳහා යෝජිත නව ව්‍යාපෘති

1. ශ්‍රී ලංකා තහනම් උත්තේජක නිවාරණ ආයතනයේ උත්තේජක පර්යේෂණ සඳහා අවශ්‍ය පර්යේෂණාගාරයක් සහ ඊට අවශ්‍ය පර්යේෂණ උපකරණ මිලදී ගැනීම.
2. දියගම ක්‍රීඩා ඇකඩමියේ යෝජිත වැඩ අවසන් කිරීම සහ 2021 දී යෝජිත ආසියානු ක්‍රීඩා උළෙල පැවැත්වීම සඳහා අවශ්‍ය අවම පහසුකම් ( මීටර 400 කෘතිම ධාවන පථය, පිහිණුම් තටාකය, ගෘහස්ථ ක්‍රීඩාගාරය) සම්පූර්ණ කිරීම.
3. දියගම ක්‍රීඩා සංකීර්ණය තුළ රගර් ක්‍රීඩාව සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ඉදිකිරීම.
4. සෑම පළාත් හා දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ආශ්‍රිතව වෙරළ ක්‍රීඩා පිටි ( Volley ball හා Kabaddi) ඉදි කිරීම.
5. විදුලිබලය අරපිරිමැසුම්දායකව භාවිතා කිරීම සඳහා සූර්ය බලශක්ති පද්ධතියක් සෑම පළාත් හා දිස්ත්‍රික් ක්‍රිඩා සංකීර්ණයකම ගෘහස්ථ ක්‍රීඩාංගනයේ සවිකිරීම.
6. ශ්‍රී ලංකා පොලිසියට අයත් බොරලන්ද පුහුණු ඒකකයෙහි මංතීරු හයකින්(6කින්) සමන්විත මීටර් 25 පිහිණුම් තටාකය ඉදි කිරීම.
7. පළාත් ක්‍රීඩා සංකීර්ණයන් හි ගෘහස්ථ ක්‍රිඩාගාර තුළ බාස්කට් බෝල් Back Board Support (Shooting Post) 9 ක් ඉදි කිරීම.

වෝටර්ස් එජ් පරිශ්‍රය තුළ ජාතික ටයිකොන්ඩෝ පුහුණු මධ්‍යස්ථානය සහ කොරියානු සංස්කෘතික මධ්‍යස්ථානය ඉදි කිරීම.(කොරියානු විදේශ ආධාර මත ක්‍රියාත්මක කිරීමට යෝජිතය)

## ක්‍රීඩා අමාත්‍යාංශය අනුමත තනතුරු පිළිබඳ තොරතුරු - 2018

| # | තනතුර | සේවය / ශ්‍රේණිය | වැටුප් කාණ්ඩය | සේවා මට්ටම | තනතුරු සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | අනුමත | ස්ථිර | කොන්ත්‍රාත් | තාවකාලික | පුරප්පාඩු |
| 01 | ලේකම් | | SL 4 | 1 | 1 | 1 | | | 0 |
| 02 | අතිරේක ලේකම් (පාලන හා ප්‍රසම්පාදන) | ශ්‍රී ලං.ප.සේ. (විශේෂ) | SL 3 | 1 | 1 | 1 | | | 0 |
| 03 | අතිරේක ලේකම් (සංවර්ධන) | ශ්‍රී ලං.ප.සේ. (විශේෂ) | SL 3 | 1 | 1 | 0 | | | 0 |
| 04 | ප්‍රධාන මූල්‍ය නිලධාරි | ශ්‍රී ලං.ග.සේ. (විශේෂ) | SL 3 | 1 | 1 | 0 | | | 1 |
| 05 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී ලං.ප.සේ. I | SL 1 | 1 | 1 | 0 | | | 1 |
| 06 | අධ්‍යක්ෂ (සංවර්ධන) | ශ්‍රී ලං.ප.සේ. I | SL 1 | 1 | 1 | 1 | | | 0 |
| 07 | අධ්‍යක්ෂ (සැලසුම්) | ශ්‍රී ලං.ක්‍ර.සේ. I | SL 1 | 1 | 1 | 1 | | | 0 |
| 08 | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී ලං.ග.සේ. I | SL 1 | 1 | 1 | 1 | | | 0 |
| 09 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී ලං.ග.සේ. I | SL 1 | 1 | 1 | 1 | | | 0 |
| 10 | ගණකාධිකාරී (ගෙවීම්) | ශ්‍රී ලං.ග.සේ. II/III | SL 1 | 1 | 1 | 1 | | | 0 |
| 11 | නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) | ශ්‍රී ලං.ප.සේ. II/III | SL 1 | 1 | 1 | 1 | | | 1 |
| 12 | නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | ශ්‍රී ලං.ක්‍ර.සේ. II/III | SL 1 | 1 | 1 | 1 | | | 0 |
| 13 | නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (ක්‍රීඩා) | ශ්‍රී ලං.ප.සේ. II/III | SL 1 | 1 | 1 | 1 | | | 0 |
| 14 | සහකාර ලේකම් (පාලන) | ශ්‍රී ලං.ප.සේ. III | SL 1 | 1 | 1 | 1 | | | 0 |
| 15 | සහකාර ලේකම් (ප්‍රසම්පාදන) | ශ්‍රී ලං.ප.සේ. III | SL 1 | 1 | 1 | 0 | | | 1 |
| 16 | අධ්‍යක්ෂ(ක්‍රීඩා සහ සෞඛ්‍ය විද්‍යා පර්යේෂක) | දෙපාර්තමේන්තුගත | SL 1 | 1 | 1 | | | | 1 |
| 17 | නීති නිලධාරී | දෙපාර්තමේන්තුගත | SL 1 | 1 | 1 | 1 | | | 0 |
| 18 | නඩත්තු ඉංජිනේරු | දෙපාර්තමේන්තුගත | 50000/= | 1 | 1 | 0 | 1 | | 0 |
| 19 | පරිපාලන නිලධාරී | රා.ක.ස.සේ. (අධි ශ්‍රේණිය) | MN 7 | 2 | 1 | 1 | | | 0 |
| 20 | භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක | MN 6 | 2 | 1 | 0 | | 1* | 1 |
| 21 | තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ නිලධාරී | ශ්‍රී ලං.තො.සං.තා.සේ. 2/II | MN 6 | 2 | 1 | 0 | | | 1 |
| 22 | ලේකම්තුමාගේ සම්බන්ධීකරණ ලේකම් | තාවකාලික | 6/2006 22250/ | 3 | 1 | 0 | | 1 | 0 |
| 23 | ප්‍රවෘත්ති නිලධාරී | තාවකාලික | MN 4 | 3 | 1 | 0 | | 1 | 0 |
| 24 | සැලසුම් සහකාර | ආශ්‍රිත නිලධාරී | MN 4 | 3 | 1 | 1 | | | 0 |
| 25 | සංවර්ධන නිලධාරී | සං.නි. සේවය | MN 4 | 3 | 28 | 25 | | | 5 |
| 26 | තාක්ෂණ නිලධාරී | ශ්‍රී ලං.තා.සේ. | MN 3 | 3 | 1 | 0 | 1 * | | 1 |
| 27 | තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සහකාර | ශ්‍රී ලං.තො.සං.තා.සේ. 3/III | MT 1 | 3 | 1 | 0 | | | 1 |
| 28 | රාජ්‍ය කළමණාකාර සහකාර | රා.ක.ස.සේ. | MN 2 | 3 | 24 | 14 | | | 1 |
| 29 | නිශ්චල ඡායාරූප ශිල්පී | තාවකාලික | MT 1 | 3 | 1 | 0 | | 1 | 0 |
| 30 | කැමරා ක්‍රියාකරු | තාවකාලික | MT 1 | 3 | 1 | 0 | | 1 | 0 |
| 31 | රියදුරු | රියදුරු සේවය | PL 3 | 4 | 18 | 16 | | | 5 |
| 32 | කැමරා සහායක | තාවකාලික | PL 1 | 4 | 1 | 0 | | 1 | 1 |
| 33 | කාර්යාල සේවක සේවය | කා.සේ.සේ. | PL 1 | 4 | 13 | 13 | | | 2 |
| | එකතුව | | | | **112** | **82** | **2** | **6** | **23** |

## විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශය



## වැය විස්තරය

| වැය විෂයය | වැඩසටහන (1) | | | | | වැඩසටහන (2) | | | | | මුළු වියදම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රතිපාදනය | | | | වියදම | ප්‍රතිපාදනය | | | | වියදම | |
| | අයවැය ඇස්තමේන්තු වෙන්කිරීම් (1) | පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් (2) | මු.රෙ. 66/69 මාරුකිරීම් (3) | මුළු ශුද්ධ වෙන්කිරීම් (4)=(1)+(2)+(3) | (5) | අයවැය ඇස්තමේන්තු වෙන්කිරීම් (6) | පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් (7) | මු.රෙ.66/69 මාරු කිරීම් (8) | මුළු ශුද්ධ වෙන්කිරීම් (9)=(6)+(7)+(8) | (10) | (11)=(5)+(10) |
| පුනරාවර්තන වියදම් | **434,740,000** | **-** | **(6,950,000)** | **427,790,000** | **345,792,015** | **95,810,000** | **-** | **1,800,000** | **97,610,000** | **84,464,576** | **430,256,591** |
| **පුද්ගල පඩිනඩි** | **74,700,000** | **-** | **(1,300,000)** | **73,400,000** | **61,620,499** | **49,400,000** | **-** | **(2,175,000)** | **47,225,000** | **44,385,698** | **106,006,197** |
| 1001 වැටුප් හා වේතන | 43,500,000 | | 1,600,000 | 45,100,000 | 39,779,101 | 24,000,000 | | 2,600,000 | 26,600,000 | 25,869,075 | 65,648,176 |
| 1002 අතිකාල හා නිවාඩු දින වැටුප් | 7,800,000 | | | 7,800,000 | 5,192,603 | 7,400,000 | | (1,975,000) | 5,425,000 | 3,618,045 | 8,810,648 |
| 1003 වෙනත් දීමනා | 23,400,000 | | (2,900,000) | 20,500,000 | 16,648,795 | 18,000,000 | | (2,800,000) | 15,200,000 | 14,898,579 | 31,547,374 |
| **ගමන් වියදම්** | **8,400,000** | **-** | **-** | **8,400,000** | **3,277,111** | **2,800,000** | **-** | **75,000** | **2,875,000** | **2,134,284** | **5,411,396** |
| 1101 දේශීය | 2,000,000 | | | 2,000,000 | 837,327 | 300,000 | | 75,000 | 375,000 | 308,701 | 1,146,028 |
| 1102 විදේශීය | 6,400,000 | | | 6,400,000 | 2,439,784 | 2,500,000 | | | 2,500,000 | 1,825,583 | 4,265,368 |
| **සැපයීම්** | **18,800,000** | **-** | **5,000,000** | **23,800,000** | **12,725,419** | **17,460,000** | **-** | **400,000** | **17,860,000** | **11,650,714** | **24,376,134** |
| 1201 ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 4,800,000 | | 4,300,000 | 9,100,000 | 5,384,290 | 850,000 | | 200,000 | 1,050,000 | 856,187 | 6,240,476 |
| 1202 ඉන්ධන | 13,500,000 | | 700,000 | 14,200,000 | 7,197,630 | 1,800,000 | | 200,000 | 2,000,000 | 1,639,212 | 8,836,842 |
| 1203 ආහාර පාන හා නිල ඇඳුම් | 300,000 | | | 300,000 | 143,500 | 260,000 | | | 260,000 | 125,800 | 269,300 |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1204 වෛද්‍ය සැපයීම් | - | | | - | | 14,500,000 | | | 14,500,000 | 8,984,016 | 8,984,016 |
| 1205 වෙනත් | 200,000 | | | 200,000 | - | 50,000 | | | 50,000 | 45,500 | 45,500 |
| | | | | | | | | | | | - |
| **නඩත්තු වියදම්** | **16,500,000** | **-** | **1,300,000** | **17,800,000** | **16,271,965** | **2,950,000** | **-** | **2,610,000** | **5,560,000** | **4,708,619** | **20,980,584** |
| 1301 වාහන | 12,700,000 | | 500,000 | 13,200,000 | 12,378,686 | 1,600,000 | | 1,910,000 | 3,510,000 | 3,232,915 | 15,611,601 |
| 1302 යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 1,600,000 | | 300,000 | 1,900,000 | 1,773,075 | 900,000 | | 791,200 | 1,691,200 | 1,361,905 | 3,134,980 |
| 1303 ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 2,200,000 | | 500,000 | 2,700,000 | 2,120,204 | 450,000 | | (91,200) | 358,800 | 113,800 | 2,234,004 |
| **සේවා** | **67,740,000** | **-** | **(12,200,000)** | **55,540,000** | **43,519,273** | **23,200,000** | **-** | **890,000** | **24,090,000** | **21,585,260** | **65,104,533** |
| 1401 ප්‍රවාහන | 2,700,000 | | 350,000 | 3,050,000 | 2,472,029 | 700,000 | | | 700,000 | 611,000 | 3,083,029 |
| 1402 තැපැල් හා සන්නිවේදන | 4,000,000 | | 500,000 | 4,500,000 | 2,354,954 | 1,500,000 | | 70,000 | 1,570,000 | 1,349,402 | 3,704,356 |
| 1403 විදුලිය හා ජලය | 7,500,000 | | 2,000,000 | 9,500,000 | 9,080,191 | 8,700,000 | | | 8,700,000 | 7,583,595 | 16,663,785 |
| 1404 බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | 6,000,000 | | (1,350,000) | 4,650,000 | 2,744,000 | 4,300,000 | | (3,061,000) | 1,239,000 | 582,120 | 3,326,120 |
| 1405 වෙනත් | | | | | | | | | | | |
| 1409 වෙනත් | 47,540,000 | | (13,700,000) | 33,840,000 | 26,868,098 | 8,000,000 | | 3,881,000 | 11,881,000 | 11,459,144 | 38,327,242 |
| **මාරුකිරීම්** | **248,600,000** | **-** | **250,000** | **248,850,000** | **208,377,747** | **-** | **-** | **-** | **-** | **-** | **208,377,747** |
| 1501 සුභසාධන වැඩසටහන් | | | | | | | | | | | |
| 1502 විශ්‍රාමික ප්‍රතිලාභ | | | | | | | | | | | |
| 1503 රාජ්‍ය ආයතන | | | | | | | | | | | |
| 1-1503 ජාතික ක්‍රීඩා අරමුදල | 12,000,000 | | | 12,000,000 | 11,620,370 | | | | | | 11,620,370 |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 3-1503 සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය | 200,000,000 | | | 200,000,000 | 175,500,000 | | | | | | 175,500,000 |
| 4-1503 ශ්‍රී ලංකා උත්තේජන මර්ධන නියෝජිත ආයතනය | 36,000,000 | | | 36,000,000 | 20,522,000 | | | | | | 20,522,000 |
| 1504 සංවර්ධන සහනාධාර | | | | - | | | | | | | |
| 1505 සම්මාදම් සහ දායක මුදල් | | | | - | | | | | | | |
| 1506 රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොළී | 600,000 | | 250,000 | 850,000 | 735,377 | | | | | | 735,377 |
| **මුළු එකතුව** | **434,740,000** | **-** | **(6,950,000)** | **427,790,000** | **345,792,015** | **95,810,000** | **-** | **1,800,000** | **97,610,000** | **84,464,576.41** | **430,256,591** |
| **මූලධන වියදම්** | **966,900,000** | **625,000,000** | **3,500,000** | **1,595,400,000** | **440,908,071** | **979,500,000** | **1,945,000,000** | **1,650,000** | **2,926,150,000** | **837,909,663.99** | **1,278,817,735** |
| | | | | | | | | | | | - |
| **<u>මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම</u>** | **10,900,000** | **-** | **3,500,000** | **14,400,000** | **10,471,529** | **68,000,000** | **-** | **1,500,000** | **69,500,000** | **22,849,884** | **33,321,413** |
| 2001 ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 3,000,000 | | | 3,000,000 | 351,147 | 200,000 | | | 200,000 | 103,148 | **454,294** |
| **<u>කුමාර් ආනන්දන් පිහිනුම් තටාකය-වැල්වැටිතුරෙයි</u>** | | | | | | | | | - | | - |
| 13-2001 ගොඩනැගිලි හා ඉදිකිරීම් | | | | | | 67,000,000 | | | 67,000,000 | 20,899,815 | **20,899,815** |
| 2002 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 400,000 | | | 400,000 | 75,415 | 200,000 | | | 200,000 | 193,980 | 269,395 |
| 2003 වාහන | 7,500,000 | | 3,500,000 | 11,000,000 | 10,044,967 | 600,000 | | 1,500,000 | 2,100,000 | 1,652,941 | 11,697,908 |
| **<u>මූලධන වත්කම් අත්පත් කර ගැනීම</u>** | **5,900,000** | **-** | **-** | **5,900,000** | **1,963,690** | **197,000,000** | **1,815,000,000** | **150,000** | **2,012,150,000** | **273,889,357** | **275,853,047** |
| 2101 වාහන | - | | | | | | | | | | - |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2102 ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 4,000,000 | | | 4,000,000 | 1,494,070 | 1,000,000 | | 150,000 | 1,150,000 | 935,783 | 2,429,853 |
| 2103 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,700,000 | | | 1,700,000 | 469,620 | 3,000,000 | | | 3,000,000 | 2,465,142 | 2,934,762 |
| 2104 ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 200,000 | | | 200,000 | | 20,000,000 | 11,000,000 | | 31,000,000 | 29,006,150 | 29,006,150 |
| **රසායනාගාරය** | | | | | | | | | - | | - |
| 3-2103 යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ | | | | | | 20,000,000 | 125,000,000 | | 145,000,000 | 24,609,941 | 24,609,941 |
| 3-2104 ගොඩනැගිලි හා ඉදිකිරීම් | | | | | | 8,000,000 | 126,000,000 | | 134,000,000 | 32,017,724 | 32,017,724 |
| **දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩා ඇකඩමිය** | | | | | | | | | - | | |
| 8-2104 ගොඩනැගිලි හා ඉදිකිරීම් | | | | | | 100,000,000 | 1,400,000,000 | | 1,500,000,000 | 124,680,386 | 124,680,386 |
| **ඉහළ ඌණතාංශ ක්‍රීඩා සංකීර්ණය- නුවරඑළිය** | | | | | | | | | - | | |
| 10-2104 ගොඩනැගිලි හා ඉදිකිරීම් | | | | | | 5,000,000 | | | 5,000,000 | 3,737,799 | 3,737,799 |
| **පළාත් සහා සඳහා ධාවන පථ ඉදිකිරීම** | | | | | | | | | - | | |
| 11-2104 ගොඩනැගිලි හා ඉදිකිරීම් | | | | | | 40,000,000 | | | 40,000,000 | - | |
| 2105 ඉඩම් සහ ඉඩම් වැඩිදියුණු කිරීම් | | | | | | | | | | | |
| 7-2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම් | | | | | | | 153,000,000 | | 153,000,000 | 56,436,433 | 56,436,433 |
| 2106 මෘදුකාංග සංවර්ධනය | | | | | | | | | | | - |
| 2108 කල්බදු වාහන සඳහා ණය | | | | | | | | | | | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මුදල ආපසු ගෙවීම් | | | | | | | | | | | |
| **<u>ප්‍රාග්ධන මාරුකිරීම්</u>** | **948,100,000** | **625,000,000** | **-** | **1,573,100,000** | **426,880,000** | **-** | **-** | **-** | **-** | **-** | **426,880,000** |
| 2201 රාජ්‍ය ආයතන | | | | | | | | | | | - |
| 3-2201 සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය | 798,000,000 | 600,000,000 | | 1,398,000,000 | 318,000,000 | | | | | | 318,000,000 |
| 4-2201 ශ්‍රී ලංකා උත්තේජන මර්ධන නියෝජිත ආයතනය | 150,100,000 | 25,000,000 | | 175,100,000 | 108,880,000 | | | | | | 108,880,000 |
| 2202 සංවර්ධන සහායන්<br><br>**<u>මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම</u>**<br>2301 හිමිකම් දායක මුදල්<br>2302 ණය දීම<br><br>**<u>හැකියා වර්ධනය</u>** | **2,000,000** | **-** | **-** | **2,000,000** | **1,592,852** | **72,500,000** | **-** | **-** | **72,500,000** | **45,806,928** | **47,399,780** |
| 2401 කාර්ය මණ්ඩල පුහුණු | 2,000,000 | | | 2,000,000 | 1,592,852 | 2,500,000 | | | 2,500,000 | 2,189,911 | 3,782,763 |
| **<u>ක්‍රීඩා නව්‍යකරණ ව්‍යාපෘතිය (අධියර ii)</u>** | | | | | | | | | - | | - |
| 2-2401 කාර්ය මණ්ඩල පුහුණු | | | | | | 20,000,000 | | 3,000,000 | 23,000,000 | 21,287,513 | 21,287,513 |
| **<u>ක්‍රීඩා පුහුණුකරුවන්ගේ හැකියා වර්ධනය</u>** | | | | | | | | | - | | - |
| 12-2401 කාර්ය මන්ඩල පුහුණු | | | | | | 50,000,000 | | (3,000,000) | 47,000,000 | 22,329,504 | 22,329,504<br>- |
| **<u>වෙනත් මූලධන වියදම්</u>** | | | | | | **642,000,000** | **130,000,000** | **-** | **772,000,000** | **495,363,495** | **495,363,495** |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1-2506 ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය * | | | | | | 480,000,000 | 100,000,000 | | 580,000,000 | 421,393,137 | 421,393,137 |
| **<u>පාසල් 1000 ක්‍රිකට් ක්‍රීඩා සංවර්ධනය</u>** | | | | | | | | | - | | - |
| 7-2506 යටිතල පහසුකම් සංවර්ධනය | | | | | | 50,000,000 | | | 50,000,000 | 46,969,342 | 46,969,342 |
| **<u>ක්‍රීඩා පාසලේ යටිතල පහසුකම් සංවර්ධනය</u>** | | | | | | | | | - | | - |
| 9-2506 ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය | | | | | | 100,000,000 | | | 100,000,000 | 11,220,292 | 11,220,292 |
| 3-2509 වෙනත් | | | | | | 12,000,000 | | | 12,000,000 | 12,000,000 | 12,000,000 |
| 1-2509 වෙනත් | | | | | | | 30,000,000 | | 30,000,000 | 3,780,725 | 3,780,725<br>- |
| මුළු එකතුව | **948,100,000** | **625,000,000** | **-** | **1,573,100,000** | **426,880,000** | **979,500,000** | **1,945,000,000** | **1,650,000** | **2,926,150,000** | **837,909,664** | **1,264,789,664** |
| මුළු පුනරාවර්තන හා මූලධන වියදම්වල එකතුව | **1,401,640,000** | **625,000,000** | **(3,450,000)** | **2,023,190,000** | **786,700,086** | **1,075,310,000** | **1,945,000,000** | **3,450,000** | **3,023,760,000** | **922,374,240** | **1,709,074,326** |

# විසර්ජන ගිණුම 2018

**වියදම් ශීර්ෂ අංකය :136** **ක්‍රීඩා අමාත්‍යාංශය**

රු.

| වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය | වියදමෙහි නම | අයවැය ඇස්තමේන්තු වෙන්කිරීම් (1) | පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් (2) | මු.රෙ. 66/69 මාරු කිරීම් (3) | මුළු ශුද්ධ වෙන්කිරීම් (4)=(1)+(2)+(3) | මුළු වියදම (5) | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය /(ඉක්මවීම්) (6)=(4)-(5) |
|---|---|---|---|---|---|---|---|
| වැඩසටහන (1) | (1) පුනරාවර්තන | 434,740,000 | - | (6,950,000) | 427,790,000 | 345,792,015 | 81,997,985 |
| | (2)ප්‍රාග්ධන | 966,900,000 | 625,000,000 | 3,500,000 | 1,595,400,000 | 440,908,071 | 1,154,491,929 |
| | උප එකතුව | **1,401,640,000** | **625,000,000** | **(3,450,000)** | **2,023,190,000** | **786,700,085** | **1,236,489,915** |
| වැඩසටහන (2) | (1) පුනරාවර්තන | 95,810,000 | - | 1,800,000 | 97,610,000 | 84,464,576 | 13,145,424 |
| | (2) ප්‍රාග්ධන | 979,500,000 | 1,945,000,000 | 1,650,000 | 2,926,150,000 | 837,909,664 | 2,088,240,336 |
| | උප එකතුව | **1,075,310,000** | **1,945,000,000** | **3,450,000** | **3,023,760,000** | **922,374,240** | **2,101,385,760** |
| | | | | | | | |
| | මුළු එකතුව | **2,476,950,000** | **2,570,000,000** | **-** | **5,046,950,000** | **1,709,074,326** | **3,337,875,674** |

# ක්‍රීඩා වෛද්‍ය ආයතනය

ශ්‍රී ලාංකීය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කායික හා මානසික නීරෝගී බව පවත්වාගෙන යාම සඳහාත් ඔවුන්ගේ රෝග නිවාරනය සඳහාත් පිහිටුවා ඇති එකම ආයතනය ක්‍රීඩා වෛද්‍ය ආයතනයයි.

1991 වර්ෂයේ දී ක්‍රීඩා වෛද්‍ය ඒකකය වශයෙන් පිහිටවූ මෙය 2006 දී ක්‍රීඩා වෛද්‍ය ආයතනය ලෙස නම් කරන ලදී. පාසල් මට්ටමින් පටන්ගෙන ජාතික හා ජාත්‍යන්තර තලය දක්වා ශ්‍රී ලාංකීය ක්‍රීඩක ක්‍රීඩිකාවන් රැගෙන යාමේදී නීරෝගී ක්‍රීඩකයින් හා ක්‍රීඩිකාවන් ලොවට දායාද කිරීමට මෙම ආයතනය කැප වී සිටී.

## දැක්ම

ශ්‍රී ලංකාව තුළ ක්‍රීඩා වෛද්‍ය විද්‍යාවේ විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානය බවට පත්වීම

## මෙහෙවර

සමස්ථ ශ්‍රී ලංකාවාසී ජනතාව සෞඛ්‍ය සම්පන්න, ඵලදායී හා ඉහළ ගුණාත්මක බවින් යුතු දිවි පෙවෙතක් සඳහා යොමු කිරීමටත් ජාතික හා ජාත්‍යන්තර තරගකාරී ක්‍රීඩාව වඩා කාර්යක්ෂම හා ප්‍රතිඵලදායක තලයකට ඉහළ නැංවීමටත්, ප්‍රවර්ධන, නිවාරණ, සත්කාරක හා පුණරුත්ථාපන වෛද්‍ය සේවාවන්සැපයීම.

## අරමුණු

1. සියළුම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සෞඛ්‍ය හා කායික යෝග්‍යතාව ඉහළ නැංවීම තුළින් ඔවුන් ආසියාව තුළ ක්‍රීඩාවෙන් ඉතා ඉහළ මට්ටමකට ගෙන ඒම.
2. ක්‍රීඩා විද්‍යාව හා නවීන තාක්ෂණය උපයෝගි කර ගනිමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ හැකියාවන් හඳුනා ගැනීම හා ඔවුන් විසින්ම උරුම කරගනු ලැබූ හැකියාවන් වර්ධනය කිරීම.
3. ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා පූර්ව සහභාගිත්ව වෛද්‍ය පරීක්ෂණ පැවැත්වීම කුළින් ඔවුන්ගේ ගැටළු හඳුනා ගැනීම හා ඒ සඳහා අවශ්‍ය පිළියම් යෙදීම.
4. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කායික යෝග්‍යතාව හා පෝෂන මට්ටම මැන බැලීම, කායික යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වීම හා පෝෂණ සටහන් ලබා දීම.
5. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ මට්ටම ක්‍රීඩාවට උචිත පරිදි ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගැනීම.
6. ලංකාවේ සිටින සියළුම ක්‍රීඩක ක්‍රීඩිකාවන්, පුහුණුකරුවන් , දෙමාපියන් හා ක්‍රීඩාවට සම්බන්ධ සියළුම නිළධාරින් සඳහා ක්‍රීඩා අනතුරු වලින් ආරක්ෂා වීම, පෝෂණයේ වැදගත් කම, මානසික සෞඛ්‍ය හා තහනම් උත්තේජක යන ආදී කරුණු ඔස්සේ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හා සෞඛ්‍ය අධ්‍යාපනය ලබා දීම.
7. ක්‍රීඩාවේදි අවශ්‍ය ප්‍රථමාධාර භාවිතය පිළිබඳව පුහුණුකරුවන් හා වෛද්‍ය සහායකයන් දැනුවත් කිරීම සඳහා අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
8. දේශිය හා විදේශිය වශයෙන් පවත්වනු ලබන තරඟාවලි සඳහා ප්‍රථමාධාර හා වෛද්‍ය ආවරණ සැපයීම.
9. ක්‍රීඩා විද්‍යා ක්ෂේත්‍රයට සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම හා ඒ තුළින් මෙරට ක්‍රීඩාව උසස් මට්ටමකට ගෙන ඒම. **ක්‍රීඩා වෛද්‍ය ආයතනය මගින් මෙම වසරේදී සපයන ලද සේවාවන්**

- හදිසි ප්‍රතිකාර සේවා
- ප්‍රථමාධාර හා සියළු වෛද්‍ය ආවරණ
- ඖෂධ, විටමින් වර්ග හා අමතර පෝෂක ලබා දීම
- කායික චිකිත්සාව, භෞතික චිකිත්සාව,සම්බාහක චිකිත්සාව හා කටු චිකිත්සාව
- පෝෂණය
- කායික විද්‍යාව
- කායික යෝග්‍යතාව
- රුධිර සංසරණ හා ශ්වසන පද්ධතිය සම්බන්ධ යෝග්‍යතා පරීක්ෂණ
- වෛද්‍ය ඇගයීම්
- පර්යේෂණ
- ක්‍රීඩා විද්‍යා හා වෛද්‍ය විද්‍යා පර්යේෂණ

ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා වෛද්‍ය පහසුකම් සැපයීමේදී ඔවුන් ආයතනයේ ලියාපදිංචි කර ගෙන ක්‍රීඩා දින පොතක් සහ සායනික වාර්තා පොතක් නිකුත් කර එම සේවාව පුළුල් කරන ලදී. ඒ අනුව පහත පරිදි ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙත වෛද්‍ය සේවා සපයා ඇත.

| මාසය | නව ලියාපංදිචි කිරීම | නැවත පැමිණෙන ක්‍රීඩක ක්‍රීඩිකාවන් | | එකතුව |
|---|---|---|---|---|
| | | ජාතික සංචිතය | ජාතික සංචිත නොවන | |
| ජනවාරි | 287 | 242 | 414 | 943 |
| පෙබරවාරි | 272 | 224 | 319 | 815 |
| මාර්තු | 182 | 365 | 337 | 884 |
| අප්‍රේල් | 158 | 222 | 302 | 682 |
| මැයි | 215 | 295 | 432 | 942 |
| ජුනි | 230 | 455 | 385 | 1070 |
| ජුලි | 221 | 395 | 276 | 892 |
| අගෝස්තු | 183 | 363 | 314 | 860 |
| සැප්තැම්බර් | 138 | 263 | 320 | 721 |
| ඔක්තෝබර් | 177 | 133 | 290 | 600 |
| නොවැම්බර් | 184 | 152 | 292 | 628 |
| දෙසැම්බර් | 142 | 102 | 301 | 545 |
| **එකතුව** | **2389** | **3211** | **3982** | **9582** |

ඉහත ආකාරයට ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ ප්‍රතිකාර හා සේවා දෛනිකව සපයා ඇති අතර පැමිණෙන ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙනුවෙන් වෛද්‍ය, භෞත චිකිත්සක, රසායනාගාර හා සම්භාහක සේවා සැපයීම විධිමත්ව කර ගෙන යයි.



<u>හදිසි ප්‍රතිකාර හා සායනික අංශයේ සේවාවන්</u>

| | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| හදිසි ප්‍රතිකාර | 12 | 10 | 08 | 07 | 08 | 06 | 10 | 12 | 05 | 05 | 08 | 22 | **113** |
| අනතුරු | 24 | 23 | 25 | 17 | 14 | 08 | 11 | 13 | 09 | 04 | 21 | 23 | **192** |

<u>රසායනාගාර සේවා සැපයීම -</u>

ක්‍රීඩා වෛද්‍ය ආයතනය තුල 2018 වර්ෂයේදී අළුතින් ස්ථාපිත කරන ලද රසායනාගාරය තුලින් මේ වන විට ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ රුධිර හා මුත්‍රා පරීක්ෂණ සියල්ල සිදු කරනු ලබයි. සෞඛ්‍ය අමාත්‍යාංශයේ රසායනාගාර තාක්ෂණ ශිල්පියෙකුගේ සේවාව සතියට දින දෙකක් මේ සඳහා ලබා ගෙන ඇත.
ඒ අනුව මෙතෙක් පහත පරිදි එම සේවාව සපයා ඇත.

| **පරීක්ෂණය** | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් |
|---|---|---|---|---|---|---|---|---|---|
| Full Blood Count | 02 | 09 | 41 | 15 | 17 | 03 | 06 | 06 | 31 |
| Fasting Blood Sugar | - | 01 | 06 | 14 | 09 | 01 | 06 | 04 | 02 |
| Lipid Profile | 01 | 04 | 06 | 13 | 09 | 01 | 05 | 04 | 01 |
| Urine Full Report | - | 02 | 05 | 07 | 03 | 01 | - | 02 | 04 |
| C – Creative Protein | - | 03 | 05 | 04 | 02 | - | - | 02 | 01 |
| Serum Creatinine | - | 02 | 01 | 03 | 03 | - | - | - | 01 |
| Rheumatoid Factor | - | - | - | - | 01 | - | - | - | 01 |
| Blood Grouping | - | - | - | - | 01 | 20 | - | - | 01 |
| Total Cholesterol | - | - | - | 02 | - | - | - | - | - |
| ESR | | | 02 | 04 | 01 | 01 | - | 01 | 05 |
| PPBS | | | | | 02 | - | - | - | 01 |
| එකතුව | **03** | **21** | **66** | **62** | **48** | **27** | **17** | **19** | **48** |

<u>පෝෂණ අංශය මගින් ඉටු කරන ලද කාර්යයන්,</u>

ක්‍රීඩක ක්‍රීඩිකාවන් උසස් පෝෂණ මට්ටමක පවත්වා ගැනීම සඳහා පහත සඳහන් කාර්යයන් ඉටු කර ඇත.

- ජාතික සංචිතවල ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ තත්ත්වය මැන බැලීම.
- එක් එක් ක්‍රීඩකයා හට තමන් නියැලී ක්‍රීඩාව අනුව ලබා ගත යුතු පෝෂක තත්ත්වයන් පිළිබඳව වාර්ථාවක් ලබා දීම හා ඔවුන් සාමූහිකව කැඳවා පවත්වා ගතයුතු පෝෂක තත්ත්වයන් පිළිබඳව උපදෙස් ලබා දීම.
- ජාතික සංචිත සඳහා ඔවුන්ගේ පුහුණු වීම් සහ දෛනික ආහාර රටාව සැලකිල්ලට ගනිමින් පොදු ආහාර සටහනක් නිකුත් කිරිම.
- විදෙස් තරඟවලට සහභාගීවන අවස්ථා වලදී ලබා ගත යුතු ආහාර වර්ග ඇතුලත් ආහාර සටහන් ද නිකුත් කිරිම.
- පාසල් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ තත්ත්වය නගා සිටුවීම සඳහා පාසල් මට්ටමින් දේශන පැවැත්වීම.

- අවශ්‍යතාවය පරිදි විවිධ ක්‍රීඩා සංචිත සඳහා ඔවුන් පුහුණුවීම් සිදුකරන ස්ථානවලදී දේශන පැවැත්වීම.

මෙරට ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ මටට්ම ඉහල නැංවීමේ අරමුණින් නව ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති අතර ඒ මගින් සංචිත ක්‍රීඩක ක්‍රීඩිකාවන් වර්ගීකරණය කර ඔවුන් සඳහා දෛනිකව ලබා දෙන විටමින් වර්ගවලට අමතරව අතිරේක පෝෂණ පැකේජයක් ලබා දීමට යෝජනා ඉදිරිපත් කර ඇත.

**ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ අංශය**

මෙරට සංචිත ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ශාරීරික යෝග්‍යතා මට්ටම මැන බැලීම හා ඔවුන් නිසි යෝග්‍යතා මට්ටමට ගෙනඒම සඳහා උපදෙස් සැපයීම මෙහිදී ප්‍රධාන වේ.

| මාසය | සංචිතය | එකතුව |
|---|---|---|
| ජනවාරි | මලල ක්‍රීඩා, නෙට්බෝල්, කරාතේ, මලල ක්‍රීඩා , මල්ලව පොර | 85 |
| පෙබරවාරි | වෙරළ වොලිබෝල්, නෙට්බෝල්, බොක්සිං | 40 |
| මාර්තු | මුයිතායි, සවි එසවීම, බර ඉසිලීම, කරාතේ , කබඩි පිරිමි, කබඩි කාන්තා | 113 |
| අප්‍රේල් | වොලිබෝල් කාන්තා , වොලිබෝල් පිරිමි | 35 |
| ජූනි | ක්‍රීඩා නිලධාරීන්, ජාතික වොලිබෝල් කාන්තා, ජාතික වොලිබෝල් පිරිමි, ජාතික වොලිබෝල්, ජාතික ජූඩෝ , ඔරු පැදීම, බාස්කට් බෝල් | 126 |
| ජූලි | ජාතික නෙට්බෝල් | 20 |
| අගෝස්තු | ජීවිතාරක්ෂක | 32 |
| නොවැම්බර් | බැඩ්මින්ටන් | 15 |
| **එකතුව** | | **466** |




**ඖෂධාලීය සේවා සැපයීම**

ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා අවශ්‍ය විවිධ වූ විටමින් වර්ග ඖෂධ සහ අමතර පෝෂක සැපයීම ඖෂධාලයෙන් සිදු කරනු ලැබේ.

ආයතනයේ සිදුවන ප්‍රතිව්‍යුහගත කිරිමට අනුව ඖෂධාලය හා ඖෂධ ගබඩාව විධිමත් ලෙස බෙදා වෙන් කොට ඖෂධවේදීන් සේවා සැපයීම සඳහා යොමු කොට ඇත.

**<u>ක්‍රීඩා සම්බාහක අංශය</u>**

ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහාලබා දිය යුතු සම්බාහක ප්‍රතිකාර වෙනුවෙන් සම්බාහක අංශය විධිමත් කර ඇත. දෛනිකව වෛද්‍ය ආයතනය තුලින්ද බාහිර වෛද්‍ය හා ප්‍රථමාධාර ආවරණයන්හිදී ද වෛද්‍ය නිර්දේශ මත ප්‍රතිකාර කිරීම සිදු වේ.

| | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සම්බාහක ප්‍රතිකාර | 360 | 347 | 478 | 229 | 341 | 172 | 365 | 346 | 220 | 191 | 261 | 204 | **3514** |



**<u>භෞත චිකිත්සක අංශය</u>**

භෞත චිකිත්සක අංශය මගින් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ භෞත චිකිත්සක ප්‍රතිකාර සේවාව සපයනු ලැබේ.

| භෞත චිකිත්සක ප්‍රතිකාර | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 223 | 243 | 101 | 123 | 690 | 315 | 446 | 316 | 300 | 311 | 346 | 394 | **3808** |

**<u>වෛද්‍ය ආවරණ සැපයීම</u>**

ජාතික මට්ටමේ වෛද්‍ය ආවරණය :- පාසල් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා මෙරටදී පැවැත්වෙන ක්‍රීඩා තරගාවලි සඳහා ප්‍රථමාධාර ඇතුළු වෛද්‍ය ආවරණයන් ලබා දීමද ක්‍රීඩා වෛද්‍ය ආයතනය මගින් සිදු වේ. ඒ අනුව 2018 වර්ෂයේ මේ දක්වා ද පාසල් මට්ටමේ සිට ජාතික හා ජාත්‍යන්තර මට්ටම දක්වා මෙරට පැවති ක්‍රීඩා තරගාවලි, පුහුණු තරගාවලි හා තේරීම් තරඟ සඳහා වෛද්‍ය ආවරණයන් සපයා ඇත.

එලෙසම මෙරට හා මෙරටින් බාහිර රටවල පැවති ජාත්‍යන්තර තරගාවලිය සඳහාද වෛද්‍ය හා ප්‍රථමාධාර ආවරණ කටයුතු සාර්ථක ලෙස ආවරණය කර ඇත.

**භෞතික හා මූල්‍ය ප්‍රගතිය**

ක්‍රීඩා වෛද්‍ය ආයතනය සඳහා 2018 වර්ෂය වෙනුවෙන් රුපියල් මිලියන 207.89 ක් වෙන් කර දෙනු ලැබීය.

| ක්‍රීඩා වෛද්‍ය ආයතනය | |
|---|---|
| වැය විස්තර | **ප්‍රතිපාදන ,000** |
| ප්‍රාග්ධන වියදම් | 139.10 |
| පුනරාවර්තන වියදම් | 68.79 |
| **එකතුව** | **207,89** |

- ජෛව විද්‍යා සමීක්ෂණ පහසුකම් සහිත මානව කාර්ය සාධන විද්‍යාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම, 2018 වසර අවසානයේදී අවසන් කිරීමට නියමිත අතර මේ වන විට එහි ඉදිකිරීම් අවසන් අදියරේ පවතී.

- ශ්‍රී ලංකාවේ ක්‍රීඩා අධ්‍යාපනය, සෞඛ්‍ය, සංචාරක කර්මාන්තය සහ ආර්ථික ප්‍රවර්ධනය ඉලක්ක කර ගනිමින් ක්‍රීඩා හා ව්‍යායාම් වෛද්‍ය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය 2018/09/06 දින සිට 09 දින දක්වා කොළඹදී පවත්වන ලදී. ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව පිළිබඳ විදේශීය විද්වතුන් විසි දෙනෙකුගේ පමණ සම්පත් දායකත්වයෙන් ඉහත සම්මන්ත්‍රණය ඉතා සාර්ථකව පවත්වන ලදී.

- ශ්‍රී ලංකාවේ බෝ නොවන රෝග වර්ධනය වීමේ ප්‍රවණතාව මත ඒ පිළිබඳ අවධානය යොමු කරමින් මෙතෙක් අප රටේ නොපැවති භෞතික ව්‍යායාම් හා නිතලවාසීව ජීවත් වීමේදී විවිධ වයස් සීමාවන් සඳහා ව්‍යායාම හා ක්‍රියාකාරකම් වෙනුවෙන් නිර්ණායකයන් සැකසීම. ඊට අදාලව මේ වන විට එම නිර්ණායක සහිත වාර්තාවක් සකසා අදහස් හා යෝජනා රාජ්‍ය ආයතන හා රාජ්‍ය අංශ වෙත ඉදිරිපත් කර ඇත.

ඒ අනුව ආයතනය විසින් ලබා ගත් භෞතික හා මූල්‍ය ප්‍රගතිය පහත පරිදි වේ.

**2018/12/31 දිනට භෞතික හා මූල්‍ය ප්‍රගතිය**

| විෂය අංකය | වැය විස්තර | | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| **01.** ප්‍රාග්ධන | | **139.10** | **60.69** | **45%** |
| 2002 - 2003 | පුනරුත්තාපනය හා වැඩි දියුණු කිරිම | 2.10 | 1.65 | 80% |
| 2401 | කාර්යය මණ්ඩල පුහුණු | 1.00 | 0.97 | 100% |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1.00 | 0.89 | 85% |
| 2104 | ගොඩනැගිලි හා ඉදි කිරිම් | 20.00 | 18.26 | 90% |
| 2103 | මානව කාර්ය සාධන විද්‍යාගාරය | 95.00 | 24.60 | |
| 2104 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 8.00 | 2.32 | |
| 2509 | වෙනත් | 12.00 | 12.00 | 100% |
| **02.**පුනරාවර්තන | | **68.79** | **58.73** | **85%** |
| 1001 – 1003 | වැටුප් හා වේතන | 35.42 | 33.44 | 80% |
| 1101 – 1102 | ප්‍රවාහන වියදම් | 1.77 | 1.64 | 75% |
| 1201 - 1203 | සැපයීම් | 1.85 | 1.72 | 90% |
| 1204 | වෛද්‍ය සැපයීම් | 14.50 | 8.98 | 95% |
| 1301 – 1303 | නඩත්තු සැපයීම් | 4.05 | 3.27 | 95% |
| 1401 – 1409 | ගිවිසුම්ගත සේවා | 11.20 | 9.68 | 60% |
| | එකතුව | **207.60** | **119.42** | **58%** |

**2019 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති කාර්යයන් :-**

- ජෛව විද්‍යා සමීක්ෂණ පහසුකම් සහිත මානව ක්‍රීඩා කාර්ය සාධන විද්‍යාගාරය ස්ථාපිත කිරීම. ඒ සඳහා එක් එක් අංශවල ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වන පරීක්ෂණාගාරවලට අවශ්‍ය යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සපයා ගැනීම.
  ඒ යටතේ ජෛව යාන්ත්‍රණ රසායනාගාරය සහ දෙවන මහලේ භෞත චිකිත්සක අංශය සඳහා යන්ත්‍රෝපකරණ සපයා ගැනීම. ප්‍රසම්පාදන පටිපාටිය මේ වන විට ද ආරම්භ කර ඇත. ඒ තුලින් ඉදිරි වසරවලදී ක්‍රීඩාවේ ජාත්‍යන්තර ජයග්‍රහණ අත් කර ගැනීමට රුකුල් දීම.
- නව ගොඩනැගිල්ල සඳහා අවශ්‍ය කාර්යාල උපකරණ සහ යන්ත්‍රෝපකරණ සපයා ගැනීම, භූමි අලංකරණය හා අභ්‍යන්තර සැකැස්ම නිම කිරීම.
- ආයතනයේ සේවාවන් පුළුල් වීමත් සමග කාර්ය මණ්ඩලය සඳහා නව බඳවා ගැනීම් සිදු කිරීම හා ක්‍රීඩා වෛද්‍ය විද්‍යාවේ දියුණුවත් සමග අවශ්‍ය තාක්ෂණික දැනුම හා හැකියා වර්ධනය සඳහා කාර්ය මණ්ඩලය වෙත පුහුණු අවස්ථා ලබා දීම.
- ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව පිළිබඳ දැනුවත් කිරීම් හා ප්‍රායෝගික වැඩමුළු ක්‍රියාත්මක කිරීම හා ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව පිළිබඳ පර්යේෂණ සිදු කිරීම.
- ශාරීරික ක්‍රියාකාරකම් සහ නිතලවාසී හැසිරීමේ නිර්ණායක සංවර්ධනය කිරීම.
  ඒ යටතේ , ක්‍රීඩා , අධ්‍යාපන හා සෞඛ්‍ය අමාත්‍යාංශය එක්ව එක් එක් වයස් මට්ටම්වල පුද්ගලයින් වෙනුවෙන් දෛනිකව නිරත විය යුතු ව්‍යායාම් හඳුන්වා දී මෙරට ග්‍රාම සේවක වසම් හා පාසල් මට්ටමින් ඉහත වැඩසටහන ක්‍රියාත්මක කර නීරෝගී ක්‍රියාශීලී ප්‍රජාවක් බිහි කිරීම සඳහා දායක වීම.

**ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ තනතුරු පිළිබඳ තොරතුරු**

| | තනතුර | නිලධාරී ගණය/ ශ්‍රේණිය | වැටුප් කාණ්ඩය | අනුමත කාර්ය මණ්ඩලය | සේවයේ නියුතු කාර්යය මණ්ඩලය | පවතින පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|
| 1 | අධ්‍යක්ෂ ජනරාල් | ශ්‍රී ලංකා වෛද්‍ය සේවය I | SL 3 | 01 | 01 | - |
| 2 | වෛද්‍ය නිලධාරී | ශ්‍රී ලංකා වෛද්‍ය සේවය I, II,III | SL 2 | 08 | 06 | 02 |
| 3 | සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා පරිපාලන සේවය II, III | SL 1 | 01 | - | 01 |
| 4 | පරිපාලන නිලධාරී | රාජ්‍ය කළමණාකරණ සහකාර සේවය අධි I | MN 7 | 01 | 01 | - |
| 5 | හෙද නිලධාරී | ශ්‍රී ලංකා හෙද සේවය | MT 7 | 05 | 02 | 03 |
| 6 | භෞතචිකිත්සක | අතුරු වෛද්‍ය සේවය | MT 6 | 03 | 02 | 01 |
| 7 | ඖෂධවේදී | අතුරු වෛද්‍ය සේවය | MT 6 | 02 | 02 | - |
| 8 | වෛද්‍ය රසායනාගාර ශිල්පී | අතුරු වෛද්‍ය සේවය | MT 6 | 01 | - | 01 |
| 9 | පර්යේෂණ නිලධාරී | ආශ්‍රිත සේවා | MN 4 | 02 | 02 | - |
| 10 | පෝෂණවේදී | ආශ්‍රිත සේවා | MN 5 | 01 | - | 01 |
| 11 | වැඩසටහන් සහකාර | ආශ්‍රිත සේවා | MN 4 | 01 | 01 | - |
| 12 | සංවර්ධන නිලධාරී | සංවර්ධන නිලධාරී සේවය | MN 4 | 04 | 04 | - |
| 13 | කළමණාකරණ සහකාර | රාජ්‍ය කළමණාකරණ සහකාර සේවය | MN 2 | 02 | 02 | - |
| 14 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | ශ්‍රී ලංකා තොරතුරුතාක්ෂණ සේවය | MT 1 | 01 | 01 | - |
| 15 | රියදුරු | රියදුරු සේවය | PL 3 | 06 | 05 | 01 |
| 16 | සම්බාහක | දෙපාර්තමේන්තු | PL 2 | 25 | 19 | 06 |
| 17 | රසායනාගාර සහායක | දෙපාර්තමේන්තු | PL 1 | 04 | 03 | 01 |
| 18 | උපස්ථායක | දෙපාර්තමේන්තු | PL 1 | 05 | 05 | - |
| 19 | කාර්යාල සහායක | කාර්යාල සේවක සේවය | PL 1 | 05 | 03 | 02 |
| | එකතුව | | | **78** | **59** | **19** |

# ක්‍රීඩා වෛද්‍ය ආයතනය

## සංවිධාන ව්‍යුහය



# ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය

ක්‍රීඩා පාසල නමින් 1979 වර්ෂයේදී ආරම්භ වූ මෙම ආයතනය 1996 වර්ෂයේදී විශේෂ පාර්ලිමේන්තු පනතක් මඟින් ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය ලෙස ස්ථාපිත කරන ලදී . මෙම ආයතනය 2005 වර්ෂය දක්වා ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය යටතේ හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය. වර්තමානයේදී පළාත් සභා පළාත් පාලන හා ක්‍රීඩා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ මෙම ආයතනය ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකාවේ ක්‍රීඩා අධ්‍යාපනයේ ප්‍රමුඛ ආයතනය වෙමින් ක්‍රීඩාවේ උන්නතිය උදෙසා ප්‍රබල දායකත්වයක් ලබාදෙමින් ක්‍රීඩා දැනුම සමාජගත කිරීමේ කාර්ය ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය විසින් ඉටු කරනු ලබයි. දේශීය සහ ජාත්‍යන්තර ක්‍රීඩා ජයග්‍රහණ ළඟා කර ගැනීමට දැනුම, ආකල්ප හා කුසලතා සංවර්ධනය කිරීම, යාවත්කාලීන කිරීම මෙන්ම ක්‍රීඩාවේ විවිධ ස්ථරයන්ගේ මානව සම්පත් සංවර්ධනය කරමින් ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියෙකුටම ක්‍රියාශීලී දිවිපෙවෙතක් උරුම කර දීමට ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ කෙටිකාලීන හා දිගුකාලීන උපායමාර්ග සහ සැලසුම් තුළින් අරමුණු කෙරේ.

## දැක්ම

ක්‍රීඩා අධ්‍යාපනයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ ආයතනය වීම.

## මෙහෙවර

ක්‍රීඩා ප්‍රතිපත්ති සම්පාදනයට දායක වීම, ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියුතු පුද්ගලයන්ගේ නිපුණතා, ශාක්‍යතා, දක්ෂතා, සහ දැනුම වර්ධනය කිරීම සඳහා ක්‍රීඩා අධ්‍යාපනය ලබාදීම සහ පර්යේෂණ පැවැත්වීම තුළින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම.

## අරමුණු

1. ක්‍රීඩා ක්ෂේත්‍රයේ කාලීන අවශ්‍යතා හඳුනාගෙන ක්‍රීඩා අධ්‍යාපන සුදුසුකම් සපුරාලීම සඳහා පාඨමාලා නිර්මාණය කිරීම, සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම.
2. ක්‍රීඩා ක්ෂේත්‍රයේ සංවර්ධනයට අදාල වන පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
3. ක්‍රීඩා අධ්‍යාපනයේ සංවර්ධන ප්‍රමිතිකරණය සඳහා අවශ්‍ය විශේෂඥතාව කාලීනව විධිමත් කිරීම හා මෙහෙයවීම.

**ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය විසින් ඉටු කරනු ලබන කාර්යයන් සහ ඉලක්කගත කණ්ඩායම්**

| | සේවාවන් | ඉලක්ක කණ්ඩායම |
|---|---|---|
| 01 | ක්‍රීඩා පනතේ විධිවිධාන වලට අනුව මෙන්ම ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ IV, NVQ V, NVQ VI) සඳහා අනුකූල වන පරිදි ක්‍රීඩා පාඨමාලාවන් පැවැත්වීම. එමෙන්ම ක්‍රීඩා කළමණාකරනය, ක්‍රීඩා අභාධ කලමණාකරනය ඇතුළු ක්ෂේත්‍ර ආවරණය කරමින් පාඨමාලා පැවැත්වීම සහ ක්‍රීඩා වැඩසටහන්. | පුහුණුකරුවන්, ක්‍රීඩා නිලධාරීන්, අධ්‍යාපන අමාත්‍යාංශයේ ශාරීරික අධ්‍යාපන උපගුරුවරුන්, ආරක්ෂක අංශයන්හි ශාරීරික අභ්‍යාස උපදේශකවරුන්, ක්‍රීඩකයන්, ක්‍රීඩා මාධ්‍යවේදීන් |
| 02 | ක්‍රීඩා තොරතුරු මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම | ක්‍රීඩා ක්ෂේත්‍රයේ සියළුම පාර්ශවයන් |

| | | |
|---|---|---|
| 03 | ක්‍රීඩා යටිතල පහසුකම් සැපයීම | ක්‍රීඩා ක්ෂේත්‍රයට සම්බන්ධ සියළුම ආයතන |
| 04 | ශරීර සුවතා වැඩසටහන් පැවැත්වීම | ශරීර සුවතාව හා ඒ පිළිබඳ දැනුම ලබා ගැනීමට බලාපොරොත්තුවන රාජ්‍ය නිලධාරීන් ඇතුළු මහජනතාව |
| 05 | ක්‍රීඩා සේවයේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම | පුහුණුකරුවන් හා ක්‍රීඩා නිලධාරීන් |
| 06 | ක්‍රීඩා පුහුණුකරුවන්ගේ කුසලතා ආකල්ප සංවර්ධනය කර ඔවුන් සඳහා පුහුණුකරු ලියාපදිංචි සහතිකය නිකුත් කිරීම | සියළුම ජාතික ක්‍රීඩා සංගම් හා ඊට අයත් පුහුණුකරුවන් |



**ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ "සහතික පත්‍ර ප්‍රදානෝත්සවය - 2018" ගරු පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විය.**

**1- ක්‍රීඩා පාඨමාලාවන් හා ක්‍රීඩා වැඩසටහන් පැවැත්වීම.**

ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය විසින් ක්‍රීඩා පුහුණුකරුවන් ක්‍රීඩා නිලධාරීන්, අධ්‍යාපන අමාත්‍යාංශයේ ශාරීරික අධ්‍යාපන උපගුරුවරුන්, ශාරීරික අභ්‍යාස උපදේශකවරුන් ආරක්ෂක අංශවල නිලධාරීන්, ස්වේච්ඡා ක්‍රීඩා පුහුණුකරුවන් හා ක්‍රීඩකයින්ගේ දැනුම යාවත්කාලීන කිරීම හා ඉහල නැංවීමේ අරමුණින් ක්‍රීඩා අධ්‍යාපන පාඨමාලා හා වැඩසටහන් පවත්වාගෙන යනු ලබයි.

**2018 වර්ෂය තුළ පැවැත්වූ පාඨමාලා සහ වැඩසටහන් පිළිබඳ විස්තරය පහතින් දක්වේ.**

| | පාඨමාලාව/වැඩසටහන | ඉලක්ක කණ්ඩායම | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව - 2018/2019 | දිස්ත්‍රික් මට්ටමේ ක්‍රීඩකයින්, ක්‍රීඩා නිලධාරීන්, ක්‍රීඩා පුහුණුකරුවන්, පාසල්හි ශාරීරික අභ්‍යාස ගුරුවරුන්, ආරක්ෂක අංශ වල ශාරීරික අභ්‍යාස උපදේශකවරුන් | 45 |
| 02 | ක්‍රීඩා ආබාධ කළමනාකරණ සහතික පත්‍ර පාඨමාලාව | පුහුණුකරුවන්, ක්‍රීඩා නිලධාරීන් | 41 |
| 03 | පුහුණුකරු කුසලතා සංවර්ධන පාඨමාලාව - පිහිණුම්, මේසපන්දු, බරඉසිලීම, ක්‍රිකට් | පිහිණුම්, මේසපන්දු, බරඉසිලීම, ක්‍රිකට් පුහුණුකරුවන් | 30 |
| 04 | ක්‍රීඩා ධාවනපථ හා ක්‍රීඩාංගන සැකසීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | පුහුණුකරුවන්, ක්‍රීඩා නිලධාරීන්, ස්වේච්ඡා පුහුණුකරුවන් | 24 |
| 05 | ක්‍රීඩා විද්‍යාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (බරඉසිලීම) - අදියර II | අදියර I පාඨමාලාව සමත් බරඉසිලීම පුහුණුකරුවන් | 19 |
| 06 | ක්‍රීඩා විද්‍යාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (පැසිපන්දු) - අදියර I | පැසිපන්දු පුහුණුකරුවන්, ස්වේච්ඡා පුහුණුකරුවන් | 09 |

| | | | |
|---|---|---|---|
| 07 | ක්‍රීඩා විද්‍යාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (වොලිබෝල්) - අදියර I | වොලිබෝල් පුහුණුකරුවන්, ස්වේච්ඡා පුහුණුකරුවන් | 16 |
| 08 | ක්‍රීඩා විද්‍යාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (කඹඇදීම) - අදියර I | කඹඇදීම පුහුණුකරුවන්, ස්වේච්ඡා පුහුණුකරුවන් | 24 |
| 09 | ක්‍රීඩා දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන - රග්බි | ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ ලියාපදිංචි රග්බි පුහුණුකරුවන් | 29 |
| 10 | ක්‍රීඩා දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන - පාපන්දු | ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ ලියාපදිංචි පාපන්දු පුහුණුකරුවන් | 27 |
| 11 | ක්‍රීඩා දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන - වොලිබෝල් | ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ ලියාපදිංචි වොලිබෝල් පුහුණුකරුවන් | 11 |
| 12 | ක්‍රීඩා දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන - පිහිණුම් | ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ ලියාපදිංචි පිහිණුම් පුහුණුකරුවන් | 150 |
| 13 | ශාරීරික යෝග්‍යතා උපදේශක පුහුණු පාඨමාලාව - පස්වන කණ්ඩායම | ශාරීරික සුවතා උපදේශකයින් ශාරීරික අභ්‍යාස ගුරුවරුන්, ස්වේච්ඡා උපදේශකයින් | 64 |
| 14 | ජාතික වොලිබොල් පුහුණුකරුවන් වෙනුවෙන් පවත්වන ලද " Enhance Program for National Coaches" වැඩසටහන | වොලිබොල් පුහුණුකරුවන් | 20 |
| 15 | බොරලන්ද පොලිස් අභ්‍යාස විද්‍යාලයේදී පවත්වන ලද ශාරීරික අභ්‍යාස පිළිබඳ පුහුණුකරන්නන් පුහුණු කිරීමේ පාඨමාලාව | ශ්‍රී ලංකා පොලිස් සේවයට අනුයුක්ත ශාරීරික අභ්‍යාස පිළිබඳ පුහුණුකරන්නන් | 25 |

**1.1 ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව**

ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව වාර්ෂිකව පවත්වනු ලබන ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ ප්‍රධානතම අධ්‍යයන පාඨමාලාවයි. මෙම පාඨමාලාව ජාතික වෘත්තීය සුදුසුකම් හතරවන (NVQ 05) මට්ටමේ පාඨමාලාවක් ලෙස පවත්වනු ලබයි. ක්‍රීඩා පුහුණුකරුවන්, ක්‍රීඩා නිලධාරීන්, අධ්‍යාපන අමාත්‍යාංශයේ ශාරීරික අභ්‍යාස ගුරුවරුන්, ආරක්ෂක අංශවල ශාරීරික අභ්‍යාස උපදේශකවරුන් හා පළාත් මට්ටමේ ක්‍රීඩකයින් මෙම ඩිප්ලෝමා පාඨමාලාවේ අභ්‍යාසලාභීන් ලෙස අධ්‍යයන කටයුතු සිදුකරනු ලබයි. 2018/2019 අධ්‍යයන වර්ෂය තුල අභ්‍යාසලාභීන් 56 ක් ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව හදාරනු ලැබේ.

**ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වීමේ අරමුණු**

- ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියතු පුහුණුකරුවන් , ශාරීරික අභ්‍යාස උපදේශකවරුන්, ක්‍රීඩා නිලධාරීන් හා විද්‍යාර්ථයින් සඳහා ක්‍රීඩා විද්‍යාව පිළිබඳ න්‍යායාත්මක දැනුම හා ප්‍රායෝගික පුහුණුව ලබා දීම.
- ක්‍රීඩා ක්ෂේත්‍රයේ රැකියාවක් ලබා ගැනීමට බලාපොරොත්තුවෙන් සිටින දක්ෂතා සපිරි ක්‍රීඩකයන් සඳහා අවශ්‍ය ක්‍රීඩා අධ්‍යාපනය පිළිබඳ පදනමක් සලසා දීම.
- ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකටම ක්‍රීඩාව ව්‍යාප්ත කිරීමට අවශ්‍ය පුහුණුකරුවන් බිහි කිරීම.
- ක්‍රීඩා නිලධාරීන්ගේ දෙවන කාර්යක්ෂමතා කඩඉම සමත්වීම සඳහා ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව අනිවාර්යය කර තිබීම.

**1.2 ක්‍රීඩා ආබාධ කළමනාකරණ සහතික පත්‍ර පාඨමාලාව**

මෙම පාඨමාලාව තුලින් ලබාදෙන්නාවූ දැනුම ක්‍රීඩාවේදී ඉතා වැදගත් වන අතර එහිදී සිදුවන ආබාධයන්ගෙන් ක්‍රීඩක ක්‍රීඩිකාවන් මුදවා ගැනීමට අවශ්‍ය දැනුම පුහුණුකරුවන්ට සහ ක්‍රීඩා නිලධාරීන්ට ලබාදීම මෙහිදී සිදුකෙරේ. පාඨමාලාව සඳහා අභ්‍යාසලාභීන් 41 දෙනෙකු සහභාගීවිය.

**1.3 පුහුණුකරු කුසලතා සංවර්ධන පාඨමාලාව - පිහිණුම්, මේසපන්දු, බරඉසිලීම, ක්‍රිකට්**

පිහිණුම්, මේසපන්දු, බරඉසිලීම, ක්‍රිකට් යන ක්‍රීඩාවනහි හඳුනාගත් පුහුණුකරුවන්ගේ දැනුම වර්ධනය කිරීමේ අරමුණින් මෙම පාඨමාලාව පවත්වන ලදී. පුහුණුකරුවන්ට ක්‍රීඩාවේදී අවශ්‍ය න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබාදීමට මෙම පාඨමාලාවන්හිදී හැකිවන අතර විද්‍යාත්මක විෂයන් කෙරෙහි වැඩි නැඹුරුතාවක් දක්වමින් පාඨමාලාව පැවැත්වේ. මෙම පාඨමාලාවන් සඳහා මෙම වර්ෂයේ පුහුණුකරුවන් 30 දෙනෙකු පමණ සහභාගී වන අතර පාඨමාලාව අවසානයේ පවත්වනු ලබන පරීක්ෂණයෙන් සමත්ව සුදුසුකම් ලබන පුහුණුකරුවන් සඳහා පුහුණුකරු ලියාපදිංචි සහතික නිකුත් කරනු ලබයි.

**1.4 ක්‍රීඩා ධාවනපථ හා ක්‍රීඩාංගන සැකසීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව**

ක්‍රීඩා හා සම්බන්ධ ඉතා වැදගත් සාධකයක් ලෙස ක්‍රීඩා ධාවනපථ හා ක්‍රීඩාංගන සැකසීම පෙන්වාදිය හැකි අතර ඒ සම්බන්ධ දැනුම පුහුණුකරුවන්, ක්‍රීඩා නිලධාරීන්, ස්වේච්ඡා පුහුණුකරුවන් වෙත ලබාදීමට මෙම පාඨමාලාව පැවැත්වීම තුලින් හැකිවිය. පාඨමාලාව සඳහා 24දෙනෙකු සහභාගීවිය.

**1.5 - 8 ක්‍රීඩා විද්‍යාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - බරඉසිලීම (අදියර II), පැසිපන්දු, වොලිබෝල් සහ කබඩ්ඩි**

පැසිපන්දු, වොලිබෝල්, බරඉසිලීම, කබඩ්ඩි ක්‍රීඩකයින් හා පුහුණුකරුවන් සඳහා අදාල ක්‍රීඩාවේ මුලික දැනුම හා විද්‍යාත්මක විෂයන් පිළිබඳ දැනුම ලබාදීමේ අරමුණින් මෙම පාඨමාලාවන් පවත්වන ලදී. අදියර I හා II පාඨමාලාවන් ලෙස පැවැත්වූ මෙම පාඨමාලාවන් යටතේ 68 දෙනෙකු අධ්‍යාපනය ලබා ඇත.

**1.9-12 ක්‍රීඩා දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන - රගර්, පාපන්දු, වොලිබෝල්, පිහිණුම්**

ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය මඟින් ශ්‍රී ලංකාවේ පුහුණුකරුවන් ලියාපදිංචි කිරීමේ වැඩසටහන මීට වසර කිහිපයකට පෙර ආරම්භ කරන ලදී. මෙහිදී අදාල ක්‍රීඩාවන්ගේ පුහුණුකරුවන් හඳුනාගනිමින් ඔවුන්ගේ හැකියා, දක්ෂතා හා දැනුම ඉහළ නැංවීමේ පාඨමාලාවන් පවත්වනු ලබන අතර එම පාඨමාලාවන් සාර්ථකව හදාරා අවසන් කරන පුහුණුකරුවන් ලියාපදිංචිකර ඔවුන් වෙත පුහුණුකරු ලියාපදිංචි සහතිකය නිකුත් කරනු ලබයි. මීට අමතරව ක්‍රීඩාවේ ප්‍රවීනතාවක් ලබා ඇති පුහුණුකරුවන්ද හඳුනාගනිමින් ඔවුන්ගේ සුදුසුකම් මත ලියාපදිංචි කිරීම් සිදුකර ලියාපදිංචි සහතික නිකුත් කරනු ලබයි. එලෙස ලියාපදිංචි කර ඇති රගර්, පාපන්දු, වොලිබෝල්, පිහිණුම් පුහුණුකරුවන්ගේ දැනුම යාවත්කාලීන කර ලියාපදිංචිය අළුත්කිරීමේ වැඩසටහන් මෙම වසරේදී පවත්වන ලදී. ඒ සඳහා ඉහත ක්‍රීඩාවන්ට අදාල ලියාපදිංචි පුහුණුකරුවන් 217 දෙනෙකු සහභාගී වී ඇත.

**1.13 ශාරීරික යෝග්‍යතා උපදේශක පුහුණු පාඨමාලාව - පස්වන කණ්ඩායම**

මෙම පාඨමාලාව ජාතික වෘත්තීය සුදුසුකම් හතරවන (NVQ 04) මට්ටමේ පාඨමාලාවක් ලෙස පවත්වාගෙන යනු ලබයි. ශාරීරික සුවතා උපදේශකයින්, අධ්‍යාපන අමාත්‍යාංශයේ ශාරීරික අභ්‍යාස ගුරුවරුන්, පුහුණුකරුවන්, ක්‍රීඩා නිලධාරීන් හා ශරීර සුවතාව මනාව පවත්වාගෙන යාම සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන් වෙනුවෙන් මෙම පාඨමාලාව පවත්වාගෙන යනු ලබයි. ශරීර යෝග්‍යතාව ඉහළ මට්ටමකින් පවත්වාගෙනයාම සඳහා අවශ්‍ය පෝෂණ තත්වයන්, ශාරීරික ව්‍යායාම හා ඊට අදාල අනෙකුත් විද්‍යාත්මක දැනුම මෙම පාඨමාලාව යටතේ අභ්‍යාසලාභීන් වෙත ලබාදෙන අතර වර්ථමානයේ බහුලව පවතින බෝනොවන රෝග යම් ප්‍රමාණයකින් අවම මට්ටමකට ගෙන ඒම සඳහා අවශ්‍ය දැනුම සමාජගත කිරීමද මේ තුලින් අපේක්ෂා කෙරේ. මාස 05 ක පාඨමාලා කාලයක් සහිතව පවත්වන මෙම පාඨමාලාව කණ්ඩායම් 05 ක් සඳහා සාර්ථකව පවත්වා අවසන් කර ඇත. මෙම වර්ෂයේ පාඨමාලාව හදාරා අවසන් කර ඇති අභ්‍යාසලාභීන් ගණන 64කි.

**1.14 ජාතික වොලිබොල් පුහුණුකරුවන් වෙනුවෙන් පවත්වන ලද "Enhance Program for National Coaches" වැඩසටහන.**

වොලිබෝල් පුහුණුකරුවන් ක්‍රීඩා දැනුමෙන් සවිබලගැන්වීමේ අරමුණින් මෙම වැඩසටහන පවත්වන ලදී. ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේදී දින තුනක් තුලදී වැඩසටහන පවත්වන ලද අතර 20දෙනෙකු ඒ සඳහා සහභාගී විය.

**1.15 බොරලන්ද පොලිස් අභ්‍යාස විද්‍යාලයේදී පවත්වන ලද ශාරීරික අභ්‍යාස පිළිබඳ පුහුණුකරන්නන් පුහුණු කිරීමේ පාඨමාලාව**

මෙම පුහුණු පාඨමාලාව පොලිස් සේවයට අනුයුක්ත ශාරීරික අභ්‍යාස පිළිබඳ පුහුණුකරන්නන්ගේ දැනුම වර්ධනය කිරීමේ අරමුණින් පවත්වන ලද අතර ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ සහ බාහිරව සම්බන්ධකරගන්නා ලද සම්පත්දායකයින්ද සමඟ බොරලන්ද පොලිස් අභ්‍යාස විද්‍යාලයේදී පවත්වන ලදී. අදාල පාඨමාලාව දින තුනක් තුලදී පවත්වන ලද අතර ඒ සඳහා අභ්‍යාසලාභීන් 25 දෙනෙකු සහභාගීවිය.

**02. ක්‍රීඩා තොරතුරු මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම.**

ශ්‍රී ලංකාව තුළ ක්‍රීඩා තොරතුරු සැපයීමේ ප්‍රධාන මධ්‍යස්ථානය ලෙස ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ ක්‍රීඩා පුස්තකාලය හඳුන්වාදීමට හැකිය. මෙම පුස්තකාලය මඟින් e-book සේවාව, ක්‍රීඩාවට අදාල සංයුක්ත තැටි පිටපත් ලබා දීමේ සේවාව, පුවත්පත් හා ග්‍රන්ථ බැහැර දීමේ සේවාව, ක්‍රීඩා සම්පත්දායක තොරතුරු ලබාදීමේ සේවාව, e- Library Friend සේවාව සහ e- News Papers සේවාවන් ලබා ගත හැකිය.

ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ක්ෂේත්‍රයට ඉමහත් සේවයක් ඉටු කරන මෙම පුස්තකාලය විද්‍යුත් පුස්තකාලයක් ලෙස සංවර්ධනය කිරීමට සැලසුම් සකස් කරමින් පවතින අතර ඒ සඳහා ඓතිහාසික වැදගත්කමකින් යුතු ක්‍රීඩා ප්‍රලේඛන ඩිජිටල්ගත කිරීම සහ ග්‍රන්ථ බැහැරදීමේ සේවාව වඩා කාර්යාක්ෂමව මෙන්ම විධිමත්ව ඉටු කිරීමට පුස්තකාලය සතු සියළුම ග්‍රන්ථ බාර්කෝඩ්ගත කිරීමටත් අපේක්ෂා කෙරේ.

**03. ක්‍රීඩා යටිතල පහසුකම් සැපයීම**

ක්‍රීඩා ක්ෂේත්‍රයට සම්බන්ධ විවිධ ආයතන සහ ක්‍රීඩා සංගම් විසින් පවත්වනු ලබන වැඩමුළු, දේශන සහ පරීක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය දේශන ශාලා, විභාග ශාලා, ගෘහස්ථ ක්‍රීඩාගාර සහ ශ්‍රවණාගාර පහසුකම් සැපයීම ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය මඟින් ඉටු කරනු ලබයි. ඒ තුලින් සමස්ත ක්‍රීඩාව සංවර්ධනයට ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය ඉහළ දායකත්වයක් සපයයි.

**04. ශාරීරික සුවතා වැඩසටහන් පැවැත්වීම.**

ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය මඟින් ස්ථාපිත කර ඇති ශාරීරික සුවතා උපදේශන ඒකකය මහජනතාවගේ ශරීර සුවතාව මනාව පවත්වා ගැනීමට අවශ්‍ය සහය ලබාදෙයි. එනම් ශරීර සුවතාව පවත්වා ගැනීම පිළිබඳ න්‍යායාත්මක දේශන, ප්‍රායෝගික ක්‍රියාකාරකම් පරීක්ෂණ සිදු කරනු ලබයි.

තවද, විවිධ රාජ්‍ය ආයතන මඟින් කරනු ලබන ඉල්ලීම් මත ශරීර සුවතා වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර ආයතන පරිශ්‍රයේ දෛනිකව ව්‍යායාම් වැඩසටහන් මහජනතාව උදෙසා පවත්වනු ලබයි. මෙම වැඩසටහන වර්ථමානයේ පුද්ගලයන් තුළ බහුලව පවතින බෝනොවන රෝග අවම මට්ටමකට ගෙන ඒමට උපකාරීවනු ඇත. ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේදී සතියේ දින වල පෙ.ව. 6.30 සිට පෙ.ව. 8.00 දක්වා මහජනතාව උදෙසා ව්‍යායාම් වැඩසටහන් පවත්වනු ලබන අතර ආයතනයේ ශක්ති වර්ධන ශාලාවද අදාල සාමාජිකත්වය ලබාගෙන භාවිතා කිරීමේ අවස්ථාව ලබාදී ඇත.

**05. ක්‍රීඩා සේවයේ නිලධාරීන් සඳහා කාර්යාක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම.**

ක්‍රීඩා ඒකාබද්ධ සේවයේ හා පළාත් ක්‍රීඩා නිලධාරීන් සහ ක්‍රීඩා පුහුණුකරුවන් සඳහා අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීමේ කාර්ය ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය විසින් ඉටු කරනු ලබයි. මෙම පරීක්ෂන වර්ෂයකට දෙවතාවක් ලෙස පවත්වනු ලැබන අතර මෙම වර්ෂයේද අදාල පරීක්ෂන සාර්ථකව පවත්වනු ලැබීය.

## 06. ක්‍රීඩා පුහුණුකරුවන් ලියාපදිංචි කිරීම.

ශ්‍රී ලංකාවේ සියළුම ක්‍රීඩා ක්ෂේත්‍රයන්ට අදාල ක්‍රීඩා පුහුණුකරුවන් හඳුනා ගනිමින් ඔවුන් ලියාපදිංචි කිරීමේ සහ දැනුම, කුසලතාවයන් වර්ධනය කිරීමේ කාර්ය ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය ඉටු කරනු ලබයි. මෙහිදී ප්‍රවීණ පුහුණුකරුවන් මෙන්ම ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබන පුහුණුකරු කුසලතා සංවර්ධන වැඩසටහන යටතේ සුදුසුකම් ලබන පුහුණුකරුවන් ද ලියාපදිංචි කර ලියාපදිංචි සහතිකයක් ලබා දීමට කටයුතු කරයි. මේ වන විට ක්‍රීඩා 13ක් සඳහා එනම්, මලල ක්‍රීඩා, පාපන්දු, වොලිබෝල්, පිහිණුම්, බැඩ්මින්ටන්, ජුඩෝ, දැල්පන්දු, රගර්, කරාතේ, බොක්සිං, හොකී, ටයිකොන්ඩෝ කබඩි යන ක්‍රීඩා සඳහා මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කර ඇත.

| | ක්‍රීඩාව | ලියාපදිංචි කර ඇති පුහුණුකරුවන් ගණන |
|---|---|---|
| 01 | මලල ක්‍රීඩා | 251 |
| 02 | පිහිණුම් | 216 |
| 03 | දැල්පන්දු | 91 |
| 04 | කරාතේ | 213 |
| 05 | පාපන්දු | 80 |
| 06 | බැඩ්මින්ටන් | 69 |
| 07 | ජුඩෝ | 67 |
| 08 | වොලිබෝල් | 66 |
| 09 | බොක්සිං | 53 |
| 10 | ටයිකොන්ඩෝ | 50 |
| 11 | රග්බි | 31 |
| 12 | හොකී | 25 |
| 13 | කබඩි | 28 |
| | **එකතුව** | **1,240** |

**ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය 2018 දෙසැම්බර් මස දක්වා ලබා ඇති භෞතික සම්පත්, මානව සම්පත් සහ මුල්‍ය සම්පත් වල ප්‍රගතිය.**

**භෞතික සම්පත්-** ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ නේවාසිකාගාරය පුළුල් කිරීම හා පවතින ගෘහස්ථ ක්‍රීඩාගාරය නවීන උපකරණ එක්කරමින් සංවර්ධනය කිරීම යන කටයුතු මෙම වර්ෂය තුලදී සිදුකර අවසන් කර ඇත.

**මානව සම්පත්**

- ආයතනික කාර්ය මණ්ඩලයේ දැනුම, හැකියාවන් හා කුසලතාවයන් වර්ධනය කිරීම තුලින් සමස්ථ ආයතනයේ කාර්යක්ෂමතාව ඉහල නැංවීමට ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය ක්‍රියා කරයි. ඒ අනුව මෙම වසරේදී ආයතනික කාර්ය මණ්ඩලය සහභාගී වූ විදේශීය වැඩසටහන් හා පුහුණු පාඨමාලා පිළිබඳ විස්තර පහතින් දැක්වේ.

| පාඨමාලාව | කාලය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| පරිගණක මෘදුකාංග/දෘඩාංග හා පරිගණක ජාලකරණය පිළිබඳ පාඨමාලාව (මැලේසියාව) | මාස 01 | 01 |

- ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීම යටතේ නවක නිලධාරීන් 15දෙනෙකු බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු මෙම වර්ෂයේ සම්පාදනය කරන ලදී. මෙම බඳවා ගැනීම් සඳහා ක්‍රීඩා උපදේශක, ප්‍රදර්ශක සහ නේවාසිකාගාර පාලිකා යන තනතුරු ඇතුලත්වේ.

**මූල්‍ය සම්පත් -** 2018 දෙසැම්බර් මාසය දක්වා ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය රජයේ ඒකාබද්ධ අරමුදලට සපයා ඇති මූල්‍ය දායකත්වය පහත පරිදි වේ.

| | **විෂය** | **2018 වර්ෂය (රු.මි)** |
|---|---|---|
| 1 | පාඨමාලා ගාස්තු | 3.30 |
| 2 | පුහුණුකරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු | 0.25 |
| 3 | දේශනශාලා වෙන් කිරීම | 1.04 |
| 4 | ශාරීරික යෝග්‍යතා උපදේශන වැඩසටහනේ සාමාජික ගාස්තු හා ශක්ති වර්ධක ශාලාවේ සාමාජික ගාස්තු | 0.55 |
| 5 | නේවාසික පහසුකම් | 0.11 |
| | **එකතුව** | **5.25** |

**ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ අනුමත තනතුරු පිළිබඳ තොරතුරු - 2018**

| තනතුරු | නිලධර ශ්‍රේණිය | වැටුප් තත්ත්වය | තනතුරු සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|
| | | | අනුමත | පවතින | පුරප්පාඩු |
| අධ්‍යක්ෂ | (දෙපාර්තමේන්තුගත) | එස්.එල්.1 | 01 | 01 | - |
| කථිකාචාර්ය | (දෙපාර්තමේන්තුගත) | එස්.එල්.1 | 06 | - | 06 |
| ලේඛකාධිකාරි | (දෙපාර්තමේන්තුගත) | එම්.එන්.7 | 01 | - | 01 |
| සහකාර කථිකාචාර්ය | (දෙපාර්තමේන්තුගත) | එම්.එන්.7 | 08 | 04 | 04 |
| රාජ්‍ය භාෂා පරිවර්තක | | එම්.එන්.6 | 01 | 01 | - |
| තොරතුරු හා සන්නිවේදන නිලධාරි | ශ්‍රී ලං.තො.සං.තා.සේ | එම්.එන්.6 | 01 | 01 | - |
| සංවර්ධන නිලධාරි | සං නි සේ | එම්.එන්.4 | 09 | 06 | 03 |
| ක්‍රීඩා උපදේශක | (දෙපාර්තමේන්තුගත) | එම්.එන්.4 | 10 | 09 | 01 |
| පුස්තකාලයාධිපති | පුස්තකාලයාධිපති සේවය | එම්.එන්.3 | 01 | 01 | - |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.ක.ස.සේ. | එම්.එන්.2 | 04 | 03 | 01 |
| නේවාසිකාගාර පාලිකා | (දෙපාර්තමේන්තුගත) | එම්.එන්.1 | 01 | - | 01 |
| ප්‍රදර්ශක | (දෙපාර්තමේන්තුගත) | එම්.ටී. 1 | 02 | 02 | - |
| ප්‍රදර්ශක (කොන්ත්‍රාත් පදනම) | | එම්.ටී. 1 | 02 | - | 02 |
| රියදුරු | | පී.එල්.3 | 02 | 01 | 01 |
| කාර්යාල කාර්ය සහායක | | පී.එල්.1 | 05 | 03 | 02 |
| | | | **54** | **32** | **22** |

## ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය



# විදේශ රැකියා අංශය

## සමාලෝචනය

විගමනික ශ්‍රමිකයන් ජාතික ආර්ථිකයට දක්වන සුවිශේෂී දායකත්වය අවබෝධ කරගනිමින් 2007 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට විදේශ රැකියා ක්ෂේත්‍රය වෙනුවෙන් වෙනම අමාත්‍යාංශයක් පිහිටුවන ලදී. 2010 වර්ෂයේ විදේශ කටයුතු අමාත්‍යාංශය සමග මෙම අමාත්‍යාංශය ඒකාබද්ධ කළද මාස කිහිපයකට පසු විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශය ලෙස යළි ස්ථාපනය කරනු ලැබිණි.

විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශය, 2015 වසරේ විදේශ රැකියා අමාත්‍යාංශය, ලෙස නම් කරන ලදී. 2018 වසරේදි විදේශ රැකියා අමාත්‍යාංශය විදුලි සංදේශ හා ක්‍රිඩා අමාත්‍යාංශය සමග ඒකාබද්ධ කල අතර ගරු හරින් ප්‍රනාන්දු මහතා (ප ම) අමාත්‍යවරයා ලෙස පත් කෙරිණි. ඩබ් ඒ චූලානන්ද පෙරේරා මහතා අමාත්‍යාංශයේ ලේකම් ලෙස කටයුතු කරයි.

විදේශ රැකියා අංශය, යටතේ පවතින ආයතන ලෙස ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය නම්කල හැකිය.

විදේශ රැකියා සඳහා විගමනය, ආර්ථිකයට හා සමාජයට දිගින් දිගටම වැදගත් වීම සැලකිල්ලට ගනිමින් අමාත්‍යාංශය ශ්‍රම විගමනයට අදාළ සිය දිගුකාලීන දැක්ම, අරමුණු හා කැපවීම ක්‍රියාවට නැංවීම සඳහා ප්‍රමුඛ අවධානය ලබා දී තිබේ.

දැක්ම / මෙහෙවර සහ සේවය සඳහා වූ කැපවීම

### දැක්ම

ශ්‍රී ලංකාව ගෝලීය රැකියා වෙළෙඳපොළ වෙත නිපුණ මානව සම්පත සපයන කලාපීය ප්‍රමුඛයා බවට පත් කිරීමට පහසුකම් සැලසීම.

### මෙහෙවර

විදේශ රැකියා අවස්ථා සඳහා කාර්යශූර මානව සම්පත යොමු කිරීම හා විගමනික ශ්‍රමිකයින්ගෙ පවුල්වල ගුණාත්මකභාවය ප්‍රවර්ධනය පිණිස යෝග්‍ය ප්‍රතිපත්ති, ව්‍යාපෘති සකස්කර මෙහෙයවීම හා ඇගයීම් කිරීම මගින් සියළු පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂා ඉටු කිරීම.

## විගමනය පිලිබදව වූ ඉතිහාසමය පදනම

රැකියා සඳහා විගමනය වීමේ සංසිද්ධියේ වැදගත්කම සහ එහි ව්‍යාප්තිය සැලකීමේදි, මෙම ක්‍රියාවලිය මගින් ලොව රටවල් ගණනාවක ජාත්‍යන්තර ප්‍රජාව මිලියන ගණනකට බලපෑම් ඇතිකරනු ලබයි. විගමනික චර්යා වඩවඩාත් ව්‍යාප්ත සහ ගෝලීයකරණය වීම හේතුවෙන් රජය අද වන විට විගමන කළමනාකරණය පිළිබඳ අභියෝග ගණනාවකට මුහුණ පා ඇත. 1965 දී, ලොව පුරා විගමනිකයන් සංඛ්‍යාව මිලියන 75කට ආසන්න විය. 2002 වසර වන විට එම සංඛ්‍යාව මිලියන 175 දක්වා වර්ධනය

වී තිබේ. 1965 දී "ගමනාන්ත රටවල්" ලෙස හඳුනාගනු ලැබූයේ රටවල් ඉතා සුළු සංඛ්‍යාවකි. අද වන විට ලොව සෑම රටක්ම පාහේ යම් ප්‍රමාණයක විගමනිකයන් යවන, විගමනිකයන් ලබන හෝ ඔවුන්ගේ රටවල් වෙත ප්‍රවේශ වන ස්ථාන ඔස්සේ විගමනිකයන් ගමන් කරන තත්ත්වයට පත්ව තිබේ.එබැවින් ගමනාන්ත රටවල් වෙත විගමනය වීම මගින් බලපෑමට ලක්වූ රටවල් පිළිබඳ සම්ප්‍රදායික වර්ගීකරණය දැන් බොහෝ දුරට අර්ථශූන්‍ය වේ.

## මෑත කාලීන විගමනයෙහි ස්වරූපය

රැකියා ප්‍රවර්ධනය, තෝරාගැනීම සහ බඳවා ගැනීම, බොහෝ මූල්‍යමය වාසි සලසන සංචාරක යෝජනාක්‍රම සහ ප්‍රවාහන පහසුකම් ඇතුලුව මෙම රටවල් කරා සිදුවන විගමන ක්‍රියාදාමයේ එක් එක් අංශවලට සහායවීම පිණිස "විගමන කර්මාන්තය" සංවර්ධනය කොට ඇත. ශ්‍රමිකයින් විගමනය කල පසු ඔවුන් පදිංචි කරවීම, අලුත් ජීවිතය සහ සේවා වටපිටාවට හුරු කරවීම සඳහා පහසුකම් සැපයීම පිණිස විශාල පිළිගැනීම් මධ්‍යස්ථාන ඉදිකර පුහුණු වැඩසටහන් පවත්වා ඇත.

1960 දශකයේ මැද භාගය වන විට, සංක්‍රමණය සඳහා වූ ඉල්ලුම පහත වැටීමට පටන් ගත් අතර යුරෝපීය නොවන රටවලින් අයදුම්පත්‍ර ලබා ගැනීමට ඉඩ සලසනු පිණිස තෝරාගැනීමේ නිර්ණායක ක්‍රමයෙන් සුදුසු පරිදි වෙනස් කරන ලදී.

1970 දශකයේ මැද භාගය වන විට, අයදුම්කරුවන්ගේ වාර්ගික සම්භවය පිළිබඳ අඩුවෙන් සහ විගමනිකයන්ගේ සුදුසුකම්, කුසලතා සහ සේවා පළපුරුද්ද වෙත වැඩියෙන් අවධානය යොමු වන ආකාරයෙන් විගමන වැඩසටහන්වල අරමුණු සකස් කරන ලදී.

ගමනාන්ත රටවල ජනවිකාශනය සහ සමාජ සංයුතිය සැලකිය යුතු ආකාරයකින් පරිණාමනයට ලක්ව ඇත. ජීවන රටාවන්, හර පද්ධතීන් ද සැලකිය යුතු වෙනස්කම්වලට භාජනය වූ බව නිසැකය. ආර්ථික අංශයෙන් ගත් කළ, තත්වයන් වඩා සියුම්ව වෙනස්වූවත්, මතයේ වැඩි බර නැඹුරු වූයේ ගමනාන්ත රටවල් ආර්ථික වර්ධනයෙන් ප්‍රතිලාභ ලැබූ බවටත් සම්භව රටවල් අතිරික්ත ශ්‍රමය විගමණය වීමෙන් මෙන්ම ඔවුන් විසින් එවනු ලැබූ ප්‍රේෂණවලින් උපකාර ලබාගත් බවටත් වූ මතය කෙරෙහිය. අදාළ රටවල ආර්ථික සහ සමාජ ව්‍යුහය මත මෙම විගමනගලනයේ සමස්ත බලපෑම සම්බන්ධයෙන් පසුකාලීනව බොහෝ වාද විවාද ඇති විය.

### විදේශ රැකියා අංශයේ සේවා කැපවීම

- විදේශ රැකියා විෂයට සහ ඒ යටතේ පවතින ආයතනයන්හි (ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය) විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- සංක්‍රමණික සේවා නියුක්තිකයන්ගේ වෘත්තීමය ගැටලුවලට පිළියම් ලබාදීම සහ සුබසාධනය ඉහළ නැංවීම.

- විදේශගත ශ්‍රමිකයන්ගේ හා ඔවුන්ගේ පවුල් වල අයගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා නව නියාමනයන් හඳුන්වා දීම.
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයන්ට අදාළ කටයුතු
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන් අධීක්ෂණය කිරීම

# 1. විදේශ රැකියා ප්‍රවර්ධනය

## 1.1 ජාතික ප්‍රතිපත්ති හඳුන්වා දීම හා ක්‍රියාකාරි සැලසුම්

**<u>ශ්‍රමික සංක්‍රමණය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය</u>**

ශ්‍රමික සංක්‍රමණය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය 2009 අප්‍රේල් මස අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. (දකුණු ආසියාවේ ප්‍රථම වරට) වෙනත් රටවල රැකියාවල නිරතව සිටින ශ්‍රී ලාංකික පුරවැසියන් සම්බන්ධයෙන් රාජ්‍ය ප්‍රතිපත්තිය ප්‍රකාශ වන පරිදි ශ්‍රම සංක්‍රමණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මෙම අමාත්‍යාංශය විසින් වැඩි දියුණු කර සකස් කර ඇත. ශ්‍රම විගමනය පිළිබඳ මාර්ග සිතියමේ ප්‍රධාන අරමුණ වූයේ පාර්ශ්වකරුවන්ගේ අදහස් ලබාගැනීමේ ක්‍රියාවලියක් හරහා ජාතික ශ්‍රම විගමන ප්‍රතිපත්තිය සකස් කිරීම උදෙසා උපාය මාර්ගික දළ සැලැස්ම සකස්කිරීමයි.

ජාතික ශ්‍රම විගමන ප්‍රතිපත්තියට ප්‍රධාන අරමුණු 03 ක් පවතී.

- **විගමනය පාලනය හා නියාමනය -** විගමන ප්‍රතිපත්තිය සකස් කිරිමේදි සමාජ පාර්ශ්වකරුවන් සහ සිවිල් සමාජය සමග අදහස් විමසීමේ ක්‍රියාවලියක් මත පදනම්ව ශ්‍රම විගමනය වඩාත් හොඳින් පාලනය හා නියාමනය කිරීම
- **විගමනික ශ්‍රමිකයන් ආරක්ෂා කිරීම හා සවිබල ගැන්වීම -** විගමනික ශ්‍රමිකයන්ට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට සඵලදායක ආරක්ෂාවක් හා සේවා සැපයීම
- **විගමනය සහ සංවර්ධනය -** ආපසු පැමිණෙන විගමනික ශ්‍රමිකයන් යළි සමාජගත කිරීම, ජාතික අවශ්‍යතාවයනට අනුව ප්‍රතිපත්ති ඇතිකිරීම හා ශ්‍රම සංචලනතාවයේ දායකත්වය සංවර්ධන අරමුණු කරා ඒකරාශි කිරීම

### ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයින් සිය රට පැමිණීම හා නැවත සමාජගත කිරීම පිළිබඳ උප ප්‍රතිපත්ති සහ ජාතික ක්‍රියාකාරි සැලැස්ම

ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයින් සිය රට පැමිණීම හා නැවත සමාජගත කිරීම පිළිබඳ උප ප්‍රතිපත්ති සහ ජාතික ක්‍රියාකාරි සැලැස්ම මගින් , සංක්‍රමණික සේවකයන්ගෙන් රටටවූ දායකත්වය හඳුනාගැනීම, කුසලතා හුවමාරුකිරීම්, ඵලදායී රැකියා හා සමාජ ගැටුම් රහිත සමාජ ඒකාබද්ධ කිරීම සඳහා ඇති අවස්ථා සමඟ නැවත පැමිණීම හා සමාජගත කිරීම යන අංශ කෙරෙහි අවධානය යොමු කරනු ලබයි.

පහත සඳහන් අංශ 02ක යටතේ මෙම උප ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරි සැලැස්ම ක්‍රියාත්මක වේ.

01.නැවත පැමිණෙන අය සමාජගත කිරීම.

02 නැවත පැමිණෙන අයගේ ආර්ථිකය ශක්තිමත් කිරීම.

**ජාතික උපදේශණ සභාව;**

ජාතික ශ්‍රමික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරිම අධීක්ෂණය කිරිමේ ප්‍රධාන යාන්ත්‍රණය වනුයේ ජාතික උපදේශන කමිටුවයි. ජාතික ප්‍රතිපත්තියේ උපදේශන කමිටුව ස්ථාපිත කිරීම විස්තර කරනුයේ "විගමනය හා සම්බන්ධ සියලු ප්‍රමුඛ රාජ්‍ය ආයතන සහ අනෙකුත් රජයේ සහ රාජ්‍ය නොවන ආයතනවල නියෝජිතයන්ගෙන් සමන්විත ශ්‍රම විගමනය පිළිබඳ උපදේශන කමිටුවක් ස්ථාපිත කිරීම" ලෙසය. උපදේශන කමිටුවේ නියෝජනය විදේශ රැකියා අමාත්‍යාංශය විසින් පත්කරනු ලබන ප්‍රධාන අමාත්‍යංශ නියෝජිතයන්ගෙන් සහ සේවා, වෘත්තිය සමිති, සිවිල් සමාජය සහ රැකියා සඳහා බඳවා ගැනීමේ කර්මාන්තයේ නියෝජිතයන්ගෙන් සමන්විත වේ.

මෙම කමිටුව 2011 වසරේදි නැවත ආරම්භ කර එහි පලමු රැස්විම 2011 වසරේ අගෝස්තු මාසයේ පවත්වා ප්‍රමුඛත්වය දිය යුතු අංශ හඳුනාගන්නා ලදි. එහිදි පුහුණු සහ කුසලතා සංවර්ධනය, විගමනය සංවර්ධනය සඳහා දායක කරගැනිම, විගමනික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුල්වල අය බලගැන්විම සහ සුබසාධනය, නව ශ්‍රම වෙළඳපල පිළිබඳ පර්යේෂණ කිරිම සහ නව ශ්‍රම වෙළඳපලවල් තුලට ඇතුලු වීම, විගමනිකයින් සමාජගත කිරිම, ජාතික ශ්‍රමික ප්‍රතිපත්තියට අනුව රැකියා නියෝජිතයින්ගේ සහ උප ඒජන්ත වරුන්ගේ ව්‍යාපාරික ක්‍රියාවලිය නැවත හැඩගැස්විම යන අංශ 06 යටතේ උප කමිටු හඳුනා ගන්නා ලදි.

උපදේශන කමිටුවේ කාර්යභාරය වනුයේ ශ්‍රම විගමන ක්‍රියාදාමය සමාලෝචනය කිරීම, ගැටලු සහ අභියෝග ගවේෂණය කිරීම, ශ්‍රම වෙළඳපොළේ සිදුවන වෙනස්කම් සොයා බැලීම සහ ක්‍රියාදාමයේ සියලු අංශ පිළිබඳව උපදෙස් දීම වේ. ශ්‍රම විගමනය පිළිබඳ උපදේශන කමිටුවේ විධි නියෝගය, කාර්යභාරයේ සහ වගකීම් විස්තර කරමින්, යොමුකිරිම් විදේශ රැකියා අමාත්‍යාංශය සකස් කරනු ඇත.

## ශ්‍රම විගමනය හා ආශ්‍රිත ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරි සැලසුම්

- ශ්‍රී ලංකා සුනිසි රැකියා ප්‍රතිපත්තිය 2006
- ශ්‍රී ලංකාව සඳහා ජාතික මානව සම්පත් සහ රැකියා නියුක්ති ප්‍රතිපත්තිය, 2012
- ශ්‍රී ලංකා විගමන සෞඛ්‍යය ප්‍රතිපත්තිය, 2012
- ශ්‍රී ලංකාවේ විගමනික ශ්‍රමිකයින් සිය රටට පැමිණිම හා නැවත සමාජයට ඒකාබද්ධ කිරිම පිළිබඳ අනු ප්‍රතිපත්තිය සහ ජාතික ක්‍රියාකාරි සැලැස්ම
- ශ්‍රී ලංකාවේ මිනිස් වෙළඳාම මර්දනය කිරිම පිළිබඳ ජාතික උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම 2015- 2019
- ශ්‍රී ලංකාවේ ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාව පාදක ප්‍රචණ්ඩත්වයට පිළියම් යෙදීම පිණිස ප්‍රතිපත්ති රාමුව සහ ජාතික ක්‍රියාකාරි සැලැස්ම 2016-2020
- ශ්‍රී ලංකා ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම 2017-2021

# 1.2 රැකියා සඳහා විගමනය සම්බන්ධව ජාත්‍යාන්තර සහයෝගය.

## I. කලාපීය සංවාද

### කොළඹ ක්‍රියාදාමය

විගමණික ශ්‍රමිකයින් සම්බන්ධ තහවුරුකර ගත් ඇස්තමේන්තු අනුව මිලියන 2.5 කට වැඩි ආසියානු ශ්‍රමිකයින් සංඛ්‍යාවක් වසරකට ගිවිසුම් ගත ශ්‍රමිකයින් ලෙස ගමනාන්ත රටවලට විගමනය වේ. දකුණු හා අග්නිදිග ආසියානු රටවල වැඩි සේවක කොටසක් ගල්ෆ් කාලපිය රටවල් වෙත ඉදිකිරිම් රැකියා, ගෘහ රැකියා සහ වෙනත් සේවාවන් සඳහා විගමනය වන අතර අනෙකුත් ශ්‍රමිකයින් උතුරු අමෙරිකා, යුරෝපය සහ අසියානු රට වලට රැකියා සඳහා විගමනය වේ.

කලාපයේ බොහෝමයක් රටවල් තම රටෙහි විගමනිකයින් රැකියා සඳහා බඳවා ගන්නා අවස්ථාවන්හිදි හා රැකියා කරගෙන යැමේදි ආරක්ෂා කිරිමේ ක්‍රියාකාරකම් වල මෙන්ම, විදේශ රැකියාවේ යෙදිමට පෙරත්, යෙදි සිටින අවස්ථාවේදිත්, ඊට පසුවත් ඔවුන්ගේ අවදානම් තත්වයන් සමනය කිරිම සඳහා විශේෂ සේවාවන් සපයනු ලබයි.

විගමනික ශ්‍රමිකයින් මුහුණ දෙන ගැටළු වලට ස්ථිර විසඳුම් සෙවිම සඳහා අසියාවේ ශ්‍රම විගමන රටවල අමාත්‍ය උපදේශනයට අනුව කොළඹ ක්‍රියාදාමය ස්ථාපිත කරන ලදි.

ශ්‍රී ලංකාව එහි සභාපතිත්වය දරන ලද 2013 වර්ෂයේ ඔක්තෝම්බර් මස සිටම, කොළඹ ක්‍රියාදාමයේ ව්‍යුහය, තේමාත්මක ඉලක්ක මෙන්ම සමාජික රටවල් සහ ගමනාන්ත රටවල් සමඟ සහයෝගිතාව ශක්තිමත් කරන්නා වූ නව මුලපිරිම් ගණනාවක් සඳහා නායකත්වය ලබාදි තිබේ.

2014 වසරේ සිය සභාපතිත්වය යටතේ පැවති පළමු ජ්‍යෙෂ්ඨ නිලධාරී රැස්වීමේදී කොළඹ ක්‍රියාදාමය සඳහා උපායමාර්ගික දැක්මක් ශ්‍රී ලංකාව යෝජනා කරන ලද අතර පසුව එම රැස්වීමේදී සාමාජික රටවල් විසින් එය අනුමත කරන ලදී.



වර්තමානයේදී කොළඹ ක්‍රියාදාමය සමාජික රටවල් 12කින් සමන්විත වන අතර තවත් රටවල් 8කින් නිරික්ෂණය වේ. දැනට මෙහි සභාපතිත්වය දරන නේපාලය යටතේ ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේ රැස්වීම් නියමිත පරිදි පවත්වන අතර එම රැස්වීම් වලදී ප්‍රධාන අරමුණු 4 පිළිබඳව හා තේමාත්මක අංශ පිළිබඳව අවධානය යොමු කරනු ලබයි .ප්‍රමුඛ තේමාවන් ඉටුකර ගැනිම සඳහා ජාත්‍යාන්තර විගමනික සංවිධානය, එක්සත් ජාතින්ගේ ආයතන හා සංවර්ධන සහකරුවන් සහ ගමනාන්ත රටවල් අතර සහයෝගයෙන් සමාජික රටවල් විසින් වැඩසටහන් සහ ව්‍යාපෘති ජාතික හා කලාපිය වශයෙන් ක්‍රියාත්මක කරනු ලැබේ.

**අබුඩාබි සංවාදය (ADD)**

කලාපයේ ගිවිසුම්ගත කම්කරු ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සහ ප්‍රතිපත්තිවලට බලපෑම් කිරීම සහ ගැටලු පිළිබඳ පොදු අවබෝධය සඳහා පදනම පුළුල් කිරීමට අබුඩාබි සංවාදය 2008 දී ආරම්භ විය.එමගින් ආසියාවේ තාවකාලික ශ්‍රම බලකායේ සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා සහයෝගී ප්‍රවේශයක් දියත් කරන ලදී. මෙම සංවාදය සඳහා කොළඹ ක්‍රියාදාමයේ සමාජික රටවල් 12ක් වන ඇෆ්ගන්ස්ථානය, බංගලාදේශය, චිනය, ඉන්දියාව, ඉන්දුනිසියාව, නේපාලය, පකිස්තානය, පිලිපිනය, ශ්‍රී ලංකාව, තායිලන්තය හා වියට්නාමයද, ගමනාන්ත ගල්ෆ් රටවල් 6ක් වූ බහරේන්, කුවේට්, ඕමාන්, කටාර්, සවුදි අරාබියාව මෙන්ම මැලේසියාව යන රටවල් ඇතුලත් වේ. ජාත්‍යාන්තර කම්කරු සංවිධානය, ජාත්‍යාන්තර විගමනික සංවිධානය, පුද්ගලික අංශය හා සිවිල් සමාජීය ආයතන මෙහි නිත්‍ය නිරික්ෂකයින් ලෙස ක්‍රියා කරයි. මෙහි ස්ථිර ලේකම් හා පහසුකම් එක්සත් අරාබි එමීර් රාජ්‍ය විසින් දරණ අතර කුවේට් රාජ්‍යයට පසු 2017 වර්ෂයේදි අබුඩාබි සංවාදයේ (ADD) හි සභාපතිත්වය සඳහා ශ්‍රී ලංකාව පත් කරන ලදි.

රාජ්‍යයන් විසින් මෙහෙයවනු ලබන කලාපිය උපදේශන ක්‍රියාදාමයක් ලෙස අබුඩාබි සංවාදය මගින් ආරක්ෂිත, විධිමත් හා නිත්‍ය ශ්‍රමික සංක්‍රමන මාර්ග තුලින් සංක්‍රමන සඳහා ඉඩ සැලසිම ඉලක්ක කරයි. ශ්‍රම සංචලනය හා බැඳුණු වැඩසටහන් සම්පාදනය, ක්‍රියාත්මක කිරිම හා වාර්තා කිරිම සම්බන්ධ ඒකාබද්ධ සංවර්ධනයක් බහු පාර්ශවීය සංවාදයන් හා සහයෝගිතාවන් මත නිසි ක්‍රමවේදයන් යොදාගැනිම සහ එකිනෙකාගේ අත්දැකිම් මගින් දැනුම ලබාගැනිමට සහතික විමට අබුඩාබි සංවාදය සහයෝගය ලබාදේ, වර්තමානයේ ඉදිරිපත් කර ඇති මුලපිරිම් අනුව ගෝලිය සම්මුතියේ සන්දර්භය තුල පහත සඳහන් මුලපිරිම් සලකා බැලිමට අබුඩාබි සංවාදයේ සමාජිකයින් විසින් පහසුකම් සපයන්නන්ගේ අවධානයට යොමු කරනු ලැබේ.



- සේවා ගිවිසුමේදි ලබා දෙන කොන්දේසි හා ගමනාන්ත රටවලදි පිරිනමන කොන්දේසි අතර වූ පරස්පරතා හා කොන්ත්‍රාත් ආදේශනය අවම කිරිම සඳහා අදාල රාජ්‍යයන් විසින් ශ්‍රම සැපයුම් රාජ්‍යයන් හා ගමනාන්ත රජයන් අතර රැකියා කොන්දේසි හා කොන්ත්‍රාත් වලංගු කිරිම.
- ශ්‍රම සැපයුම් රටවල් හා ගමනාන්ත රටවල් අතර ජනතාවගේ සහසම්බන්ධතාව සඳහා අන්‍යෝන්‍ය වශයෙන් කුසලතා හඳුනා ගැනිම සහ සහතික කිරිම.
- ශ්‍රම දායකත්වය ඉහල නංවා ගැනිම, ශ්‍රමික අයිතිවාසිකම් ආරක්ෂා කිරිම හා දැනුවත් කිරිම, ගමනාන්ත අතර පහසුවෙන් හුවමාරු විම සඳහා විගමනික ශ්‍රමිකයින් හට පෙර විගමනික පුහුණු වැඩසටහන් හා පරිපූර්ණ තොරතුරු ලබා දිම.
- ගමනාන්ත රටවලදි ශ්‍රමිකයින් රැකියාව සඳහා බඳවා ගැනිම සහ යොමුකිරිමට රැකියා අයදුම්පත්‍ර සැකසිම හා අයදුම්පත්‍ර සඳහා අනුමැතිය ලබාදිම සඳහා ගමනාන්ත රටවල් හා සේවා සැපයුම් රටවල් අතර තොරතුරු හුවමාරු කර ගැනිමේ අන්තර්ජාල සහසුකම් සැපයිම.

## II. ජාත්‍යන්තර සංසඳ

### විගමනය සහ සංවර්ධනය පිළිබඳ ගෝලිය සංසදය (GFMD)

සංක්‍රමණය හා සංවර්ධන අන්තර් සම්බන්ධතාවයන් පිලිබඳ ප්‍රායෝගික සහ ක්‍රියාකාරි මාර්ග මූලික කරගනිමින් එක්සත් ජාතින්ගේ සමාජිකත්වය මත මෑත කාලින සංක්‍රමණය හා සංවර්ධනය පිළිබඳ ක්‍රියාමාර්ග සම්බන්ධව ගෝලීය සංසදය විසින් ක්‍රියා කරනු ලබයි. එය අවිධිමත් නොවන, ගැති නොවන, ස්වේච්ඡාවෙන් හා රජය මගින් මෙහෙයවන සංක්‍රමණය හා සංවර්ධනය අතර සබඳතා වර්ධනයේ කාලින අවශ්‍යතාවයන් ඉටුකරන, දශකයකටත් වැඩි කාලයක සිට ක්‍රියාත්මක වන ජාත්‍යන්තර සංසදයකි. මෙම සංසදය මගින් ගෝලිය මට්ටමේ රාජ්‍ය රාමුව තුල විගමණික ගැටළු සහ එහි බලපෑම් අතිශය ජාතිකමය ප්‍රවේශයක සිමාවන් හි පිලිගැනිම පෙන්නුම් කරයි.

මෙම ගැටළුවල සමාජිය බලපෑම් සැලකිල්ලට ගනිමින් සිවිල් සමාජ නියෝජිතයින් මෙම ක්‍රියාවලිය ආරම්භයේ සිටම සම්බන්ධ වී ඇත. ඉස්තාන්බුල්හි 2015 GFMD සමුලුවේදී GFMD ව්‍යාපාර යාන්ත්‍රණය සඳහා අනුමත කරන ලද GFMD ව්‍යාපාර යාන්ත්‍රණය මෙම සංසදයට හඬ සපයයි. ශ්‍රම වෙළඳපොළ අවශ්‍යතාවන් සැලකිල්ලට ගනිමින් වඩා විනිවිද පෙනෙන, ඵලදායී හා මානව සංක්‍රමණික ප්‍රතිපත්ති වැඩි දියුණු කිරීම සඳහා රජයන් , පුද්ගලික අංශය සහ සිවිල් සමාජය අතර අන්‍යෝන්‍ය අවශ්‍යතාවයක් පවතී.

මෙම ක්‍රියාකාරිත්වය තුළ සංවර්ධනය හා විගමනය පිලිබඳව සංකිර්ණ සබදතාවය ගැඹුරින් අවබෝධකර ගැනිම සහ මෙම තිරණාත්මක කරුණ පිලිබදව පැහැදිලි, විෂයානුබද්ධ, තර්කාන්විත ගෝලිය කතිකාවක් ගොඩනැගිමට සහයෝගය ලබාදෙනු ඇත ජර්මනිය හා මොරොක්කෝව විසින් 2017 ජනවාරි 01 සිට 2018 දෙසැම්බර් 31 වන දින දක්වා සංක්‍රමණය හා සංවර්ධනය පිළිබඳ ගෝලීය සංසදයේ (GFMD) සම සභාපතිත්වය දරයි.

2007 වර්ෂයේදි මෙම සංසදය විසින් ඉදිරිපත් කරන ලද මෙහෙයුම් මාදිලි යටතේ අන්තර ක්‍රියාකාරි සහ ප්‍රායෝගිකත්වය මුල්කර ගත් කතිකාවන් සඳහා සංසදය සෑම වසරකම රැස්වේ. රජයේ ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති සම්පාදකයින් සහභාගි වන මෙම කතිකාව වැතම් හවුස් නීති යටතේ පැවැත්වේ. සෑම කතිකාවක්ම අවසානයේ එහි ප්‍රගතිය සම්බන්ධ වාර්තාවක් පිලියෙල කරනු ලබයි.

## සුරක්ෂිත, ක්‍රමවත් හා විධිමත් විගමනය සඳහා ගෝලීය සම්මුතිය (GCM)

සුරක්ෂිත, ක්‍රමවත් හා විධිමත් විගමනය සඳහා ගෝලීය සම්මුතිය එක්සත් ජාතින්ගේ අනුග්‍රහය යටතේ ජත්‍යාන්තර විගමනයේ සියළුම අංශ සැලකිල්ලට ගෙන පරිපූර්ණ අකාරයකින් සකස් කරන ලද ප්‍රථම අන්තර් රාජ්‍ය සම්මුති ගිවිසුමක් බවට අපේක්ෂා කෙරේ. මෙම සම්මුතිය මගින් තිරසාර සංවර්ධනය උදෙසා විගමනිකයින්ගේ සහ විගමනයේ දායකත්වය ශක්තිමත් කිරිම, විගමනය පාලනය වැඩිදියුණු කිරිම, වර්තමාන විගමනික අභියෝග කළමණාකරනය කිරිම සඳහා වැදගත් අවස්ථාවක් ලබාදෙනු ලබයි. මෙම සම්මුතියේ වැඩකටයුතු 2017 වර්ෂයේ අප්‍රේල් මාසයේදි ආරම්භ විය.

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල රැස්වීමේ දී ගෝලීය මට්ටමේ සංක්‍රමණ සහ සරණාගතයන් පිළිබඳ ගැටළු සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා රාජ්‍ය හා රාජ්‍ය නායකයින් එක්ව 2016 සැප්තැම්බර් මස 19 වැනි දින පළමු වරට රැස්වූහ. සංක්‍රමන හා සරණාගත ප්‍රශ්න ජත්‍යාන්තර න්‍යාය පත්‍රයේ ප්‍රධන ප්‍රශ්න බවට පත්වීම වැදගත් දේශපාලන පණිවිඩයකි. සරණාගතයින් සහ සංක්‍රමණිකයින් සඳහා නිව් යෝර්ක් ප්‍රකාශය සම්මත කර ගැනීමේදී, එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් 193 ක මානව සංචලනය සඳහා පුළුල් ප්‍රවේශයක් සහ ගෝලීය මට්ටමේ සහයෝගීතාව වැඩිදියුණු කිරීමේ පහත අවශ්‍යතාවයන් හඳුනාගෙන තිබේ.

- සිය සංක්‍රමණික තත්ත්වය නොසලකා සෑම අවස්ථාවකදීම සියලු සංක්‍රමණිකයන්ගේ ආරක්ෂාව, ගරුත්වය සහ මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස ආරක්ෂා කිරීම.
- සරණාගාතයින් සහ විගමනිකයින් ලබාගන්නා, බේරගන්නා සහ සත්කාරකරන රටවල් සඳහා සහය විම.
- විගමනිකයින් ඒකාබද්ධ කිරිම – ඔවුන්ගේ අවශ්‍යතාවයන් සහ හැකියාවන් පිළිබඳව විගමකිකයින් ලබාගන්නා ප්‍රජාව යොමු කිරිම.– මානුෂිය සහ සංවර්ධන සහාය සඳහා රාමුවක් සහ සැලසුම්.
- සියළුම සංක්‍රමණිකයන් කෙරෙහි වෛරය, ජාතිවාදය හා වෙනස්කම් දැක්වීමට එරෙහිව සටන් කිරීම
- අවදානමට පත්වූ විගමනිකයින් සම්බන්ධයෙන් නොබැඳි ප්‍රතිපත්ති සහ ස්වේච්ඡා මාර්ගෝපදේශයන් රාජ්‍යයන් විසින් මෙහෙයවනු ලබන ක්‍රියාවලියක් තුලින් ඉදිරිපත් කිරිම සහ,
- ජාත්‍යන්තර විගමනික සංවිධානය එක්සත් ජාතින්ගේ පවුල තුලට ඇතුලත් කරගැනිම මගින් සුරක්ෂිත, ක්‍රමවත් හා විධිමත් විගමනය සඳහා ගෝලීය සම්මුතියේ සංවර්ධනයක් ඇතිකර විගමනිකයින් සම්බන්ධ ගෝලීය පාලනය ශක්තිමත් කිරිම.

රටවල් රාශියක සහභාගිත්වයෙන් 2018.12.05 දින සිට **09** දක්වා දිනයන් හි මොරොක්කෝවේ මරාකේෂ්හිදි පැවති සමුළුවේදි මෙය සම්මත කර ගන්නා ලදි.

## 1. විදේශ රැකියා ක්ෂේත්‍රයේ මෑත කාලීන උපනතින්

ශ්‍රී ලංකාව මැද පෙරදිග සහ අප්‍රිකානු ශ්‍රම වෙළඳපලට අවතීර්ණවීම, රටේ ආර්ථිකය හා සමාජ ජීවිතය යන දෙකම කෙරෙහි සාර්ව මෙන්ම සූක්ෂම මට්ටමේ බලපෑම් සහිතව සමස්ත විගමන කර්මාන්තයෙහිම සුවිශේෂී සංවර්ධනයක් සලකුනු කළ අතර පසුගිය දශක දෙකක පමණ කාලයක් තිස්සේ එහි විවිධ ධනාත්මක හා සෘණාත්මක මානයන් විවිධ පර්යේෂකයන් හා ප්‍රතිපත්ති සැලසුම්කරුවන් විසින් සාකච්ඡාවට භාජනයකර ඇත.

**විදේශ රැකියා සඳහා පිටත්වීම් 1990- 2018**

| වර්ෂය | පිරිමි | | ගැහැණු | | එකතුව |
|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | |
| 1990 | 15,377 | 36.08 | 27,248 | 63.92 | 42,625 |
| 1991 | 21,423 | 32.97 | 43,560 | 67.03 | 64,983 |
| 1992 | 34,858 | 28.00 | 89,636 | 72.00 | 124,494 |
| 1993 | 32,269 | 25.00 | 96,807 | 75.00 | 129,076 |
| 1994 | 16,377 | 27.22 | 43,791 | 72.78 | 60,168 |
| 1995 | 46,021 | 26.68 | 126,468 | 73.32 | 172,489 |
| 1996 | 43,112 | 26.52 | 119,464 | 73.48 | 162,576 |
| 1997 | 37,552 | 24.99 | 112,731 | 75.01 | 150,283 |
| 1998 | 53,867 | 33.71 | 105,949 | 66.29 | 159,816 |
| 1999 | 63,720 | 35.45 | 116,015 | 64.55 | 179,735 |
| 2000 | 59,793 | 32.82 | 122,395 | 67.18 | 182,188 |
| 2001 | 59,807 | 32.50 | 124,200 | 67.50 | 184,007 |
| 2002 | 70,522 | 34.61 | 133,251 | 65.39 | 203,773 |
| 2003 | 74,508 | 35.51 | 135,338 | 64.49 | 209,846 |
| 2004 | 80,699 | 37.59 | 134,010 | 62.41 | 214,709 |
| 2005 | 93,896 | 40.60 | 137,394 | 59.40 | 231,290 |
| 2006 | 90,170 | 44.65 | 111,778 | 55.35 | 201,948 |
| 2007 | 103,476 | 47.37 | 114,983 | 52.63 | 218,459 |
| 2008 | 128,232 | 51.19 | 122,267 | 48.81 | 250,499 |
| 2009 | 119,381 | 48.31 | 127,745 | 51.69 | 247,126 |
| 2010 | 136,850 | 51.16 | 130,657 | 48.84 | 267,507 |
| 2011 | 136,307 | 51.84 | 126,654 | 48.16 | 262,961 |
| 2012 | 144,135 | 51.03 | 138,312 | 48.97 | 282,447 |
| 2013 | 175,185 | 59.75 | 118,033 | 40.25 | 293,218 |
| 2014 | 190,217 | 63.26 | 110,486 | 36.74 | 300,703 |
| 2015 | 172,788 | 65.58 | 90,655 | 34.41 | 263,443 |
| 2016 | 160,302 | 65.99 | 82,628 | 34.01 | 242,930 |
| 2017 | 139,271 | 65.64 | 72,891 | 34.36 | 211,990 |
| 2018 | 129,774 | 61.37 | 81,687 | 38.63 | 211,461 |

විදේශ රැකියා සඳහා පිටත්වීම් වල කැපීපෙනෙන වර්ධනයක් 1990 වසරේ සිට 2014 වර්ෂය දක්වා පෙන්නුම් කරයි. 1990 වසරේදී 42,625 වූ විදේශ රැකියා සඳහා පිටත්වීම් 2014 වසර වන විට 300,703 දක්වා වර්ධනය වී ඇත. විදේශ රැකියා සඳහා පිටත්වීම් තවදුරටත් විශ්ලේෂණ කිරීමේදී පෙනී යන්නේ එහි කාන්තා සහභාගිත්වය 1988 වර්ෂයේදී ප්‍රථම වරට පිරිමින්ගේ සංඛ්‍යාව අභිබවා ගිය අතර මෙම ප්‍රවණතාවය 2007 දක්වා පවත්වා ගෙන ඇති බවයි. ගෘහ අංශයේ රැකියා හා ඇඟලුම් කර්මාන්තශාලාවල රැකියා සඳහා විගමනය වූ වැඩි සංඛ්‍යාවක් කාන්තාවන් වීම, එම ප්‍රවණතාවට හේතුවිය .කෙසේ වෙතත් වසර 20 කට පසුව 2008දී ඉතා පටු ආන්තිකයක් වන කාන්තාවන් 48.81 % කට පිරිමින් 51.19 % වශයෙන් පිරිමි ශ්‍රමිකයින් සංඛ්‍යාව කාන්තා ශ්‍රමිකයින් සංඛ්‍යාව අභිබවා ගොස් ඇත. 2010 වන විට පිරිමි විගමනය 51.16 % සහ කාන්තා විගමනය 48.84 %වශයෙන් දැක්විය හැක. 2014 වර්ෂයේදී විදේශ රැකියා සඳහා ඉතා ඉහළම ශ්‍රමික සංඛ්‍යාවක් 300,703 පිටත්වූ බවට වාර්තා වන අතර, ඒ අතුරින් 110,486 (36.74%) ක් කාන්තාවන්ද ,190,217 (63.26%) ක් පිරිමින්ද විය. නමුත් 2014 පසුව 2015,2016,2017 සහ 2018 වර්ෂවල සිට රැකියා සඳහා විගමනය විම කාන්තා හා පිරිමි යන අංශ දෙකෙන්ම පසුබෑමකට ලක්වී ඇත.

**විදේශ රැකියා සඳහා පිටත්වීම් 2017 හා 2018 - රටවල් අනුව**

| රට | පිරිමි | | | ගැහුණු (ගෘහ පාලිකා හැර) | | | ගෘහ පාලිකා | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **2017** | **2018** | **%** | **2017** | **2018** | **%** | **2017** | **2018** | **%** | **2017** | **2018** | **%** |
| සවුදි අරාබිය | 25330 | 21191 | -16.34 | 1169 | 1009 | -13.69 | 11247 | 13667 | 21.52 | 37746 | 35867 | -4.98 |
| කටාර් | 52309 | 46254 | -11.58 | 1587 | 1650 | 3.97 | 2739 | 2870 | 4.78 | 56635 | 50774 | -10.35 |
| එ ආ ඒ රාජ්‍යය | 24125 | 22116 | -8.33 | 5304 | 4635 | -12.61 | 7239 | 6085 | -15.94 | 36668 | 32836 | -10.45 |
| කුවේට් | 12173 | 13261 | 8.94 | 1600 | 1797 | 12.31 | 23634 | 31893 | 34.95 | 37407 | 46951 | 25.51 |
| ද. කොරියාව | 5756 | 5353 | -7.00 | 49 | 56 | 14.29 | 2 | | -200 | 5807 | 5409 | -6.85 |
| ඕමාන් | 2981 | 2715 | -8.92 | 557 | 337 | -39.50 | 5327 | 5294 | -0.62 | 8865 | 8346 | -5.85 |
| මාලදිවයින | 5906 | 6819 | 15.46 | 244 | 336 | 37.70 | 129 | 145 | 12.40 | 6279 | 7300 | 16.26 |
| ජෝර්දාන | 1485 | 1541 | 3.77 | 1729 | 1994 | 15.33 | 711 | 628 | -11.67 | 3925 | 4163 | 6.06 |
| බහරේන් | 1726 | 1696 | -1.74 | 196 | 250 | 27.55 | 1080 | 976 | -9.63 | 3002 | 2922 | -2.66 |
| මැලේසියා | 1389 | 1757 | 26.49 | 400 | 528 | 32.00 | 207 | 170 | -17.87 | 1996 | 2455 | 23.00 |
| ලෙබනන් | 454 | 428 | -5.73 | 24 | 15 | -37.50 | 1930 | 1786 | -7.46 | 2408 | 2229 | -7.43 |
| සයිප්‍රස් | 328 | 437 | 33.23 | 1012 | 1106 | 9.29 | 770 | 706 | -8.31 | 2110 | 2249 | 6.59 |
| ඊශ්‍රායලය | 942 | 737 | -21.76 | 1495 | 1279 | -14.45 | 50 | 17 | -66.00 | 2487 | 2033 | -18.25 |
| සිංගප්පූරුව | 687 | 695 | 1.16 | 845 | 960 | 13.61 | 263 | 262 | -0.38 | 1795 | 1917 | 6.80 |
| වෙනත් රටවල් | 3676 | 4774 | 29.87 | 631 | 795 | 25.99 | 553 | 441 | -20.25 | 4860 | 6010 | 23.66 |
| **එකතුව** | **139267** | **129774** | **-6.82** | **16842** | **16747** | **-0.56** | **55881** | **64940** | **16.21** | **211990** | **211461** | **-0.25** |

2018 වර්ෂය තුල කටාර්, කුවේට්. සවුදි අරාබියාව සහ එක්සත් අරාබි එමිර් රාජ්‍ය යන රටවල් ප්‍රධාන වශයෙන් ශ්‍රමිකයින් ඉල්ලුම් කරන ලද රටවල් වූ අතර එය සමස්ථ රැකියා සඳහා විගමනයෙන් 79%කි.

## රැකියා මට්ටම අනුව විදේශ රැකියා සඳහා පිටත්වීම් 2000 - 2018

| අවුරුද්ද | වෘත්තීය මට්ටම | | මධ්‍ය රැකියා | | ලිපිකරු හා සමාන්තර | | පුහුණු | | අර්ධ පුහුණු | | නුපුහුණු | | ගෘහ පාලිකා | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සං ඛ්‍යාව | % | සංඛ්‍යා ව | % | සංඛ්‍යා ව | % | සංඛ්‍යා ව | % | සං ඛ්‍යාව | % | සංඛ්‍යා ව | % | සංඛ්‍යාව | % | |
| 2000 | 935 | 0.51 | 3,781 | 2.08 | 5,825 | 3.2 | 36,475 | 20.02 | - | - | 35,759 | 19.63 | 99,413 | 54.57 | 182,188 |
| 2001 | 1,218 | 0.66 | 3,776 | 2.05 | 6,015 | 3.27 | 36,763 | 19.98 | - | - | 33,385 | 18.14 | 102,850 | 55.89 | 184,007 |
| 2002 | 1,481 | 0.73 | 4,555 | 2.24 | 7,239 | 3.55 | 45,478 | 22.32 | - | - | 36,485 | 17.9 | 108,535 | 53.26 | 203,773 |
| 2003 | 1,541 | 0.73 | 7,507 | 3.58 | 6,779 | 3.23 | 47,744 | 22.75 | - | - | 44,264 | 21.09 | 102,011 | 48.61 | 209,846 |
| 2004 | 1,827 | 0.85 | 6,561 | 3.06 | 6,679 | 3.11 | 45,926 | 21.39 | - | - | 43,204 | 20.12 | 110,512 | 51.47 | 214,709 |
| 2005 | 1,421 | 0.61 | 8,042 | 3.48 | 7,742 | 3.35 | 46,688 | 20.19 | - | - | 41,904 | 18.12 | 125,493 | 54.26 | 231,290 |
| 2006 | 1,713 | 0.85 | 6,638 | 3.29 | 7,911 | 3.92 | 45,063 | 22.31 | - | - | 40,912 | 20.26 | 99,711 | 49.37 | 201,948 |
| 2007 | 1,653 | 0.76 | 3,962 | 1.81 | 4,551 | 2.08 | 50,263 | 23.01 | 3,499 | 1.6 | 52,176 | 23.88 | 102,355 | 46.85 | 218,459 |
| 2008 | 2,835 | 1.13 | 8,667 | 3.46 | 6,791 | 2.71 | 59,718 | 23.84 | 5,326 | 2.13 | 59,239 | 23.65 | 107,923 | 43.08 | 250,499 |
| 2009 | 2,832 | 1.15 | 6,388 | 2.58 | 6,719 | 2.72 | 61,321 | 24.81 | 6,015 | 2.43 | 50,173 | 20.3 | 113,678 | 46 | 247,126 |
| 2010 | 3,057 | 1.14 | 6,884 | 2.57 | 7,923 | 2.96 | 71,537 | 26.74 | 4,932 | 1.84 | 60,422 | 22.59 | 112,752 | 42.15 | 267,507 |
| 2011 | 3,844 | 1.46 | 6,134 | 2.33 | 9,906 | 3.77 | 67,726 | 25.76 | 4,180 | 1.59 | 63,680 | 24.22 | 107,491 | 40.88 | 262,961 |
| 2012 | 4,448 | 1.57 | 9,280 | 3.29 | 16,184 | 5.73 | 67,150 | 23.77 | 3,467 | 1.23 | 62,907 | 22.27 | 119,011 | 42.14 | 282,447 |
| 2013 | 5,151 | 1.76 | 16,510 | 5.63 | 26,561 | 9.06 | 73,707 | 25.14 | 3,412 | 1.16 | 70,977 | 24.21 | 96,900 | 33.05 | 293,218 |
| 2014 | 5,372 | 1.79 | 20,778 | 6.91 | 29,267 | 9.73 | 73,162 | 24.33 | 3,977 | 1.32 | 79,519 | 26.44 | 88,628 | 29.47 | 300,703 |
| 2015 | 6,251 | 2.37 | 6,951 | 2.64 | 12,501 | 4.75 | 81,682 | 31.01 | 4,847 | 1.84 | 77,985 | 29.6 | 73,226 | 27.8 | 263,443 |
| 2016 | 6,574 | 2.71 | 8,235 | 3.39 | 10,864 | 4.47 | 76,559 | 31.52 | 3,930 | 1.62 | 71,641 | 29.49 | 65,127 | 26.81 | 242,930 |
| 2017 | 6,453 | 3 | 7,053 | 3.36 | 9,271 | 4.37 | 68,980 | 32.53 | 3,296 | 1.55 | 61,056 | 28.80 | 55,881 | 26.36 | 211,990 |
| 2018 | 7,210 | 3.41 | 7,748 | 4 | 10,021 | 4.74 | 67,053 | 32 | 2,770 | 1.31 | 51,719 | 24.46 | 64,940 | 30.71 | 211,461 |

විදේශ රැකියා සඳහා පිටත්වීම් සම්බන්ධව රජයේ නව ප්‍රතිපත්ති හඳුන්වා දීම හේතුවෙන් 2013 වසරේ සිට ගෘහ පාලිකා විගමනය පහත වැටී ඇති අතර වෘත්තීමය රැකියා සඳහා විගමනය වීම ඉහල ගොස් ඇත.

**විදේශ රැකියා සඳහා පිටත්වීම් – 2017 &2018**

| වර්ෂය | 2017 | 2018 |
|---|---|---|
| පිරිමි | 139,267 | 129,774 |
| කාන්තා (ගෘහ පාලිකා හැර) | 16,842 | 16,747 |
| ගෘහ පාලිකා | 55,881 | 64,940 |
| එකතුව ( කාන්තා එකතුව) | 72,723 | 81,687 |
| **සම්පූර්ණ එකතුව** | **211,990** | **211461** |

සලකා බලන කාලපරිච්ඡේදය තුල 211,461 වු සම්පූර්ණ පිටත්වීම් සංඛ්‍යාවෙන් 139,267 (61.37%) පිරිමි ශ්‍රමිකයින් වු අතර 81,687 (38.63%) කාන්තා ශ්‍රමිකයින් වේ.

**ස්ත්‍රී පුරුෂ භාවය අනුව විදේශ රැකියා සඳහා පිටත්වීම 2017 සහ 2018**




2017 වර්ෂය හා සැසඳිමේදි 2018 වර්ෂයේදි කාන්තා විගමණය 12% ඉහල ගොස් ඇති අතර පිරිමි විගමණය 6.% අඩු විමක් පෙන්නුම් කරයි.

## ජාතික ආර්ථිකයට විගමනික ශ්‍රමිකයන්ගේ දායකත්වය.

**විදේශ විනිමය ඉපැයිමේ ප්‍රධාන මූලාශ්‍රයන් 2017 සහ 2018**

| විස්තරය | 2017 (එජ ඩො මි.) | 2018 (එජ ඩො මි.) | වර්ධනය % |
|---|---|---|---|
| ශ්‍රමික ප්‍රේෂණ | 7,164 | 7,015 | -2.1 |
| සංචාරක කර්මාන්තය | 3,925 | 4,381 | 11.6 |

**(මූලාශ්‍රය . මහ බැංකුව)**

ශ්‍රී ලංකා ආර්ථියේ ඉහලම විදේශ ආදායම් ප්‍රභවය ලෙස ශ්‍රමික ප්‍රේෂණ සලකුණු වි ඇත. 1976 සිට විධිමත් මාර්ග හරහා විදේශ ගත විම් ආරම්භ වන විට ශ්‍රමික ප්‍රේෂණද වැඩි වු අතර ඒ සමගම විදේශ රැකියා අවස්ථා ලබා දිමෙන් එය තරුණ, තරුණියන්ගේ විරැකියා ගැටළුවටද සහනයක් විය.

| අවුරුද්ද | ප්‍රේෂණ | |
|---|---|---|
| | රු. මි | එ.ජ.ඩො. මි. |
| 2014 | 916,344 | 7,018 |
| 2015 | 948,957 | 6,980 |
| 2016 | 1,054,500 | 7,242 |
| 2017 | 1,092,000 | 7,164 |
| 2018 @ 180.00 | 1,262,700 | 7,015 |

**ශ්‍රමික ප්‍රේෂණ 2014-2018**

**(මූලාශ්‍රය , මහ බැංකුව)**

ශ්‍රී ලංකා මහබැංකුව විසින් නිකුත් කරන ලද දත්ත අනුව , 2018 වර්ෂය තුල විදේශිය ශ්‍රමික ප්‍රේෂණ එ.ජ. ඩොලර් මිලියන 7,015 ලෙස පෙන්නුම් කරයි.

## 2. අභ්‍යන්තර පරිපාලනය

### පාලන අංශය

විදේශ රැකියා අංශයේ ප්‍රධානතම පරිපාලන කටයුතු සම්බන්ධීකරණ අංශය වන්නේ පාලන අංශය වේ. පෞද්ගලික ලිපිගොනු, ප්‍රවාහනය, වැටුප් වර්ධක, බඳවාගැනීම්, පුරප්පාඩු පිරවීම්, අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙළ කිරීම, පාර්ලිමේන්තු ප්‍රශ්න වලට පිළිතුරු ලබා දීම,පාර්ලිමේන්තු කාරක සභා සම්බන්ධ කටයුතු, විදේශ නිවාඩු, උපයෝගිතා බිල්පත් ගෙවීම, ගොඩනැගිලි කුලී,පුහුණු කිරීම්, දූත මණ්ඩල තනතුරු සඳහා පත් කිරීම්, ස්ථාන මාරු, සේවා කාලය දීර්ඝ කිරීම්, සේවය අවසන් කිරීම්, මහජන පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය වැනි ආයතනවල පරිපාලන කටයුතු සිදු කිරීම සම්බන්ධව සහ විදේශ රැකියා අංශය මගින් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත කර සිටින සංවර්ධන නිලධාරින් හා සම්බන්ධ ස්ථාන මාරු, වැටුප් වර්ධක, සේවය ස්ථිර කිරීම්, විනය ක්‍රියාමාර්ග සහ උසස්වීම්වැනි පරිපාලන කටයුතු සම්බන්ධව වගකීම දරයි.

### ගිණුම් අංශය

වාර්ෂික අයවැය,වාර්ෂික විසර්ජන ගිණුම, අමාත්‍යාංශයේ අත්තිකාරම් 'බී' ගිණුම පිළියෙළ කිරීම, වැටුප් ගෙවීම්,වෙනත් ගෙවීම්, ප්‍රසම්පාදන,ප්‍රතිපාදන යැවීම්,ගබඩා කළමනාකරණය පිළිබඳ වගකීම දරයි.

### සංවර්ධන අංශය

සංවර්ධන ක්‍රියාකාරී සැළසුම්, ප්‍රගති සමාලෝචන රැස්වීම්, වාර්ෂික කාර්ය සාධන වාර්තා, ප්‍රගති වාර්තා, සම්බන්ධ කටයුතු සිදු කිරීම, ජාතික උපදේශන කමිටු, වැඩසටහන් උපදේශන කමිටු සහ අනෙකුත් කමිටු, සංවර්ධන විෂයට අදාළ කැබිනට් පත්‍රිකා අවබෝධතා සහ වෙනත් ගිවිසුම් වලට අදාළ කටයුතු, අබුඩාබී සංවාදය, කොළඹ ක්‍රියාදාමය, GFMD ආදී කලාපීය සහයෝගිතා සහ සංවාද සම්බන්ධ කටයුතු, සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සහ පසුවිපරම් කිරීම සහ ක්ෂේත්‍රයට අදාළ පනත් සහ ප්‍රතිපත්ති සැකසීම සහ පවුල් පසුබිම් වාර්තා හා සම්බන්ධ කටයුතු, සංවර්ධන නිලධාරින් පිළිබඳ දත්ත සමුදායක් පවත්වා ගැනීම හා යාවත් කාලීන කිරීම, විගමනික ශ්‍රමිකයන් පිළිබඳ සංඛ්‍යාලේඛන සහ විශ්ලේෂණ වාර්තා පිළියෙල කිරීම සහ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම සම්බන්ධ වගකීම දරයි.

### අභ්‍යන්තර විගණන අංශය

විගණන කළමනාකරණ කමිටු රැස්වීම් (කාර්තුමය වශයෙන් ) පැවැත්වීම, වාර්ෂික විගණන සැළසුම් සැකසීම,අභ්‍යන්තර විගණන පරීක්ෂණ හා විශේෂ පරීක්ෂණයන් පිළිබඳ වාර්තා සහ ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකිරීම හා ඉදිරිපත් කිරීම, විගණන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම් සහ විගණන විමසුම් සඳහා පිළිතුරු සැකසීම සම්බන්ධ වගකීම දරයි.

## 3.1 මානව සම්පත් කළමනාකරණය

**i.** විදේශ රැකියා අංශයේ මානව සම්පත් සංයුතිය




*අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල ය– 2018.12.31 දිනට*

### ii. සංවර්ධනය සහ පුහුණු කිරිම

අමාත්‍යාංශය නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය ඉලක්ක කර දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් ගණනාවකට ඔවුන්ව යොමුකර ඇත.

ප්‍රාදේශිය ලේකම් කාර්යාල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්ත සංවර්ධන නිලධාරීන්ගෙන් ඵලදායී සේවාවක් ලබා ගැනිම උදෙසා ඔවුන්ව පුහුණු කිරීම සහ අඛණ්ඩ අධීක්ෂණයට ලක් කිරීම සිදු කරනු ලබයි.අලුතින් බඳවා ගන්නා ලද සංවර්ධන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන්ද, මෙම අමාත්‍යාංශය මගින් දිස්ත්‍රික් සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර සිටින සංවර්ධන නිලධාරීන්ට ඔවුන්ගේ ධාරිතා වර්ධනය කර ගැනීමට සහ විගමනික ශ්‍රමිකයන්ගේ සුබ සාධනය වැඩි දියුණු කිරීම සඳහා ද එම නිලධාරීන් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. සහභාගිවන ලද පුහුණු වැඩසටහන් පහත පරිදි වේ.

පුහුණු වැඩසටහන්

| වැඩසටහන හා කාලසීමාව | සහභාගීත්වය | වැඩසටහන් ප්‍රමාණය | වියදම |
|---|---|---|---|
| **දේශීය** | | | |
| 1. මසකට අඩු | 160 | 25 | 1,121,224.00 |
| 2. මසකට වැඩි - අවුරුද්දට අඩු | 14 | 05 | 294,000.00 |
| 3. අවුරුද්දට වැඩි | 1 | 1 | 118,000.00 |
| **විදේශීය** | | | |
| 1මාසයකට අඩු | 11 | 09 | 4,481,035.50 |

සංවර්ධන නිලධාරින් සඳහා වු පුහුණු වැඩසටහන්

| වැඩසටහන | පුහුණු කාලය | සහභාගීත්වය | වැඩසටහන් ප්‍රමාණය |
|---|---|---|---|
| අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ වු වැඩසටහන් | දින 03 | 70 | 02 |
| අනෙකුත් ප්‍රතිපාදන යටතේ වැඩසටහන් (ස්විස් සංවර්ධන සහයෝගිතාව) | දින 03 | 75 | 05 |
| | දින 07 | 252 | 07 |

# 3.2 මූල්‍ය ප්‍රගතිය 2018

**182- විදේශ රැකියා අංශයේ මූල්‍යමය ප්‍රගතිය 2018.12.331**

| විස්තරය | ප්‍රතිපාදන | වියදම 2018.12.31 | ශේෂය | % යෙදවීම් |
|---|---|---|---|---|
| <u>පුනරාවර්ථන වියදම්</u><br>වැටුප් දීමනා අතිකාල | 517,250,000 | 468,406,534 | 48,843,466 | 91 |
| <u>ගමන් වියදම්</u> | | | | |
| දේශීය | 23,000,000 | 21,597,586 | 1,402,414 | 94 |
| විදේශීය | 14,000,000 | 10,454,827 | 3,545,173 | 75 |
| සැපයුම් | 21,950,000 | 14,368,573 | 7,571,427 | 65 |
| නඩත්තු වියදම් | 13,330,000 | 7,508,163 | 5,821,837 | 56 |
| සේවා | 41,900,000 | 37,315,322 | 4,384,678 | 90 |
| <u>මාරුකිරීම්</u> | | | | |
| දායකත්ව මුදල් ගෙවීම් | 1,000,000 | 730,506 | 269,494 | 73 |
| රජයේ නිලධාරි දේපල ණය පොලිය | 600,000 | 404,408 | 195,592 | 67 |
| **මුළු පුනරාවර්තන වියදම්** | **633,030,000** | **560,985,919** | **72,044,081** | **89** |
| <u>**ප්‍රාග්ධන වියදම්**</u><br>ස්ථාවර වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම | 11,900,000 | 93,550 | 11,806,450 | **1** |
| ස්ථාවර වත්කම් අත්පත්කර ගැනීම් | 32,500,000 | 292,379 | 32,207,621 | **1** |
| කාර්ය මණ්ඩල පුහුණුව | 5,000,000 | 2,017,984 | 2,982,016 | **40** |
| ලිංගිකත්වය මත පදනම් වූ හිංසනය වලක්වා ගැනීම සඳහා විගමනික පවුල් වෙත සහයවීම. | 3,625,000 | 3,529,727 | 95,273 | **97** |
| **සම්පූර්ණ ප්‍රාග්ධන වියදම** | **53,025,000** | **5,933,640** | **47,091,360** | **11** |
| **එකතුව** | **686,055,000** | **566,919,559** | **119,135,441** | **83** |
| **රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුම** | 35,000,000 | 30,374,534 | 4,625,466 | **87** |
| **මුළු එකතුව** | **721,055,000** | **597,294,093** | **123,760,907** | **83** |

# වැය විස්තරය

## අමාත්‍ය කාර්යාලය

| වැය විෂය | වැය විස්තරය/අයිතමය විස්තරය | වෙන්කිරිම් රු | මාරු කිරිම් 66 + | අතිරේක වෙන්කිරිම් | ශුද්ධ වෙන් කිරිම් | සත්‍ය වියදම | 2018.12.31 දිනට ශේෂය | % යෙදවීම් |
|---|---|---|---|---|---|---|---|---|
| | **පුද්ගල පඩිනඩි** | | | | | | | |
| 1001 | වැටුප් හා වේතන | 12,000,000 | | | 12,000,000 | 6,409,335 | 5,590,665 | 53 |
| 1002 | අතිකාල සහ නිවාඩුදින වැටුප් | 2,500,000 | | | 2,500,000 | 2,197,027 | 302,973 | 88 |
| 1003 | වෙනත් දීමනා | 11,000,000 | | | 11,000,000 | 4,154,989 | 6,845,011 | 38 |
| | | | | | | | | |
| | **ගමන් වියදම්** | | | | - | | - | |
| 1101 | දේශීය | 2,000,000 | | | 2,000,000 | 1,199,577 | 800,423 | 60 |
| 1102 | විදේශීය | 7,500,000 | | | 7,500,000 | 4,340,401 | 3,159,599 | 58 |
| | **සැපයිම්** | | | | - | | - | |
| 1201 | ලිපිද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා | 2,000,000 | | | 2,000,000 | 683,183 | 1,316,817 | 34 |
| 1202 | ඉන්ධන | 8,000,000 | (1,300,000) | | 6,700,000 | 4,112,622 | 2,587,378 | 61 |
| 1203 | අහාර සහ නිල ඇඳුම් | 100,000 | | | 100,000 | 4,000 | 96,000 | 4 |
| 1205 | වෙනත් | 1,500,000 | | | 1,500,000 | 756,804 | 743,196 | 50 |
| | **නඩත්තු වියදම්** | | | | - | | - | |
| 1301 | වාහන | 9,000,000 | (1,000,000) | | 8,000,000 | 3,840,566 | 4,159,434 | 48 |
| 1302 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 450,000 | | | 450,000 | 28,506 | 421,494 | 6 |
| 1303 | ගොඩනැගිලි සහ ඉදිකිරිම් | 280,000 | | | 280,000 | 7,000 | 273,000 | 3 |
| | **සේවා** | | | | - | | - | |
| 1401 | ප්‍රවාහනය | 700,000 | | | 700,000 | 24,780 | 675,220 | 4 |
| 1402 | තැපැල් සහ සන්නිවේදන | 1,250,000 | | | 1,250,000 | 753,566 | 496,434 | 60 |
| 1403 | විදුලිය සහ ජලය | 2,500,000 | | | 2,500,000 | 2,311,094 | 188,906 | 92 |
| 1408 | මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ සපයාගත් වාහන සඳහා කල්බදු වාරික | 11,400,000 | | | 11,400,000 | 11,195,250 | 204,750 | 98 |
| 1409 | අනෙකුත් | 1,000,000 | | | 1,000,000 | 647,820 | 352,180 | 65 |
| | | **73,180,000** | **(2,300,000)** | - | **70,880,000** | **42,666,520** | **28,213,480** | 60 |
| | **මූලධන වත්කම්වල පුනරුත්තාපනය සහ වැඩි දියුණුකිරිම්** | | | | | | | |
| 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරිම් | 5,000,000 | | | 5,000,000 | - | 5,000,000 | 0 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 400,000 | | | 400,000 | - | 400,000 | 0 |
| 2003 | වාහන | 500,000 | | | 500,000 | - | 500,000 | 0 |
| | | | | | - | | | |
| | **මුලධන වත්කම් අත්පත්කර ගැනීම්** | | | | - | | - | |
| 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලිය උපකරණ | 1,000,000 | | | 1,000,000 | - | 1,000,000 | 0 |
| 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 500,000 | | | 500,000 | - | 500,000 | 0 |
| | **මුලධන වියදම්** | **7,400,000** | | **-** | **7,400,000** | **-** | **7,400,000** | 0 |
| | **එකතුව** | **80,580,000** | **(2,300,000)** | **-** | **78,280,000** | **42,666,520** | **35,613,480** | **55** |

## 02 - පරිපාලන සහ ආයතන සේවා

| වැය විෂය | වැය විස්තරය/අයිතමය විස්තරය | වෙන්කිරිම් රු | මාරු කිරිම් 66 + | අතිරේක වෙන්කිරිම් | ශුද්ධ වෙන් කිරිම් | තත්‍ය වියදම | 2018.12.31 දිනට ශේෂය | % යෙදවුම |
|---|---|---|---|---|---|---|---|---|
| | **පුද්ගල පඩිනඩි** | | | | | | | |
| 1001 | වැටුප් හා වේතන | 300,000,000 | 14,000,000 | | 314,000,000 | 307,357,690 | 6,642,310 | 98 |
| 1002 | අතිකාල සහ නිවාඩුදින වැටුප් | 1,500,000 | 250,000 | | 1,750,000 | 1,545,331 | 204,669 | 88 |
| 1003 | වෙනත් දිමනා | 190,000,000 | (14,000,000) | | 176,000,000 | 146,742,162 | 29,257,838 | 83 |
| | | | **250,000** | **-** | | | | |
| | **ගමන් වියදම්** | | | | - | | - | |
| 1101 | දේශිය | 21,000,000 | | | 21,000,000 | 20,398,009 | 601,991 | 97 |
| 1102 | විදේශිය | 4,000,000 | 2,500,000 | | 6,500,000 | 6,114,426 | 385,574 | 94 |
| | **සැපයිම්** | | | | - | | - | |
| 1201 | ලිපිද්‍රව්‍ය සහ කාර්යාලිය අවශ්‍යතා | 7,500,000 | | | 7,500,000 | 5,774,525 | 1,725,475 | 77 |
| 1202 | ඉන්ධන | 2,500,000 | | | 2,500,000 | 1,920,115 | 579,885 | 77 |
| 1203 | අහාර සහ නිල ඇඳුම් | 150,000 | | | 150,000 | 44,000 | 106,000 | 29 |
| 1205 | වෙනත් | 1,500,000 | | | 1,500,000 | 1,073,324 | 426,676 | 72 |
| | **නඩත්තු වියදම්** | | | | - | | - | |
| 1301 | වාහන | 3,000,000 | 1,000,000 | | 4,000,000 | 3,331,331 | 668,669 | 83 |
| 1302 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 300,000 | | | 300,000 | 240,065 | 59,935 | 80 |
| 1303 | ගොඩනැගිලි සහ ඉදිකිරිම් | 300,000 | | | 300,000 | 60,695 | 239,305 | 20 |
| | **සේවා** | | | | - | | - | |
| 1401 | ප්‍රවාහනය | 1,500,000 | | | 1,500,000 | 996,592 | 503,408 | 66 |
| 1402 | තැපැල් සහ සන්නිවේදන | 3,000,000 | (450,000) | | 2,550,000 | 1,614,921 | 935,079 | 63 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 1403 | විදුලිය සහ ජලය | 4,000,000 | | | 4,000,000 | 3,254,481 | 745,519 | 81 |
| 1404 | මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ සපයාගත් වාහන සඳහා කල්බදු වාරික | 16,000,000 | | | 16,000,000 | 15,897,600 | 102,400 | 99 |
| 1409 | අනෙකුත් | 2,000,000 | (1,000,000) | | 1,000,000 | 819,218 | 180,782 | 82 |
| | | | | | | | | |
| 1505 | දායකත්ව මුදල් ගෙවීම් | 1,000,000 | | | 1,000,000 | 730,506 | 269,495 | 73 |
| 1506 | රජයේ නිලධාරීන් සඳහා දේපල ණය පොලිය | 600,000 | | | 600,000 | 404,408 | 195,592 | 67 |
| | | **559,850,000** | **2,050,000** | **-** | **562,150,000** | **518,319,399** | **43,830,601** | 92 |
| | **මූලධන වත්කම්වල පුනරුත්තාපනය සහ වැඩි දියුනු කිරිම්** | | | | - | | - | |
| 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 5,000,000 | | | 5,000,000 | - | 5,000,000 | - |
| 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 500,000 | | | 500,000 | - | 500,000 | - |
| 2003 | වාහන | 500,000 | | | 500,000 | 93,550 | 406,450 | 19 |
| | **මූලධන වත්කම් අත්පත්කර ගැනීම්** | | | | - | | - | |
| 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 30,000,000 | | | 30,000,000 | 292,379 | 29,707,621 | 1 |
| 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 1,000,000 | | | 1,000,000 | - | 1,000,000 | - |
| 2202 | ලිංගිකත්වය මත පදනම්වූ හිංසනය වලක්වා ගැනිම සඳහා විගමනික පවුල් වෙත සහාය විම | 3,625,000 | | | 3,625,000 | 3,529,727 | 95,273 | 97 |
| | | | | | | | | |
| 2401 | කාර්ය මණ්ඩල පුහුණුව | 5,000,000 | | | 5,000,000 | 2,017,984 | 2,982,016 | 40 |
| | **එකතුව** | **45,625,000** | **-** | **-** | **45,625,000** | **5,933,640** | **39,691,360** | 13 |
| | **සම්පූර්ණ එකතුව** | **605,475,000** | **2,300,000** | **-** | **607,775,000** | **524,253,039** | **83,521,961** | 86 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **අමාත්‍ය කාර්යාලය** | **80,580,000** | **(2,300,000)** | **-** | **78,280,000** | **42,666,520** | **35,613,480** | 55 |
| **අමාත්‍යාංශය** | **605,475,000** | **2,300,000** | **-** | **607,775,000** | **524,253,039** | **83,521,961** | 86 |
| **සම්පූර්ණ එකතුව** | **686,055,000** | **-** | **-** | **686,055,000** | **566,919,559** | **119,135,441** | **83** |




## 4. විගමනික ශ්‍රමිකයින් සවිබල ගැන්වීම සඳහා වූ ප්‍රධාන උපාය මාර්ග

### I. දේශීයමය වශයෙන් විගමනික ශ්‍රමිකයින් සවිබල ගැන්වීම

විගමනික ශ්‍රමිකයින්ගේ පවුලේ සමාජිකයින් ආරක්ෂා කිරිම සහ බලගැන්වීම අමාත්‍යාංශයේ ප්‍රමුඛතම කාර්යයක් වන අතර විගමනිකයින්ගේ ආරක්ෂාව මෙන්ම ඔවුන් විදෙස්ගතව සිටින කාලසීමාවේදි පවුලේ සමාජිකයින්ගේ ආරක්ෂාව උදෙසා අමාත්‍යාංශය මගින් විවිධ වැඩසටහන් දියත්කර ඇත.

<u>පවුල්පසුබිම් වාර්තා නිකුත් කිරිම</u>

වර්ෂ 2007.03.15 සහ 2013.02.01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව පහත මූලික අරමුණු ඉටුකර ගැනිමේ අරමුණින් රැකියා සඳහා විදෙස්ගතවන කාන්තාවන් සඳහා පවුල් පසුබිම් වාර්තාව හදුන්වා දි ඇත.

- විගමනික කාන්තා සේවිකාවන්ගේ බාල වයස්කාර දරුවන්ට ආරක්ෂාව සැලසිම
- නුපුහුණු කාන්තා සේවිකාවන් රැකියා සඳහා විදෙස්ගත විම අධෛර්ය කිරිම.
- ගෘහස්ථ සේවිකාවන්ගේ වෘත්තීය පරිණත බව සහතික කිරිම.

2018 වසරේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා පවුල් පසුබිම් වාර්තා 30,654 නිර්දේශ කර ඇත. එය ප්‍රතිශතයක් ලෙස ගත්කල ඉදිරිපත් වූ සම්පූර්ණ පවුල් පසුබිම් වාර්තා වලින් 93% කි. නිර්දේශ නොකරන ලද පවුල් පසුබිම් වාර්තා ප්‍රමාණය 2,219 ක් වන අතර එය ඉදිරිපත් කරන ලද පවුල් පසුබිම් වාර්තා වලින් 7%කි.




## ශ්‍රමික සුරැකුම වැඩසටහන

"සංක්‍රමණික කම්කරුවන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම" පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය අනුමත කළ රටක් ලෙස ශ්‍රී ලංකාව විගමනික ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව හා සුබසාධනය ඉලක්ක කරගනිමින් 2016 වසරේදී ශ්‍රමික සුරැකුම වැඩසටහන ආරම්භ කරන ලදි. මේ යටතේ විගමනික ශ්‍රමික ප්‍රජාවගේ ජීවන තත්ත්වය නඟ සිටුවීම අරමුණු කරගෙන 05 වසර, අ.පො.ස (සා/පෙළ) සහ අ.පොස (උ/පෙළ) සමත් විගමනික ශ්‍රමික පවුල් වල දරුවන් සඳහා ශිෂ්‍යත්ව ලබාදීම, විගමනික ශ්‍රමික පවුල් වල ආබාධිත පුද්ගලයන් සඳහා ස්වයං රැකියා ණය සහ නිවාස ණය ලබාදීම, වෘත්තීය පුහුණු වැඩසටහන් සහ වෛද්‍ය සායන පැවැත්වීම ආදීය සිදු කරයි.

ශ්‍රමික සුරැකුම වැඩසටහන යටතේ 2018 වර්ෂයේදී ලියාපදිංචි වූ විගමනික ශ්‍රමික සංඛ්‍යාව 25,386 කි. ඉන් බහුතරය වන 21,244ක් කාන්තා විගමනිකයන් වන අතර, 4,142 ක් පිරිමි විගමනිකයන් වේ.

2018 වසරේ ශ්‍රමික සුරැකුම ලියාපදිංචිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඩි විගමනික ප්‍රජාවක් ලියාපදිංචි වී ඇති අතර එය 5047 ක් වශයෙන් දත්ත වාර්තා කර ඇත. මඩකලපුව 2022, මහනුවර 1946, හා අනුරාධපුර 1677 ක් ලෙස පිළිවෙළින් ලියාපදිංචියක් සටහන් කර ඇති අතර, අවම විගමනික ශ්‍රමික ලියාපදිංචිය කිලිනොච්චි දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර එම සංඛ්‍යාව 41කි.




## පවුල් සංවර්ධන සැලසුම් සහ රැකවරණ සැළසුම්

විදේශ රැකියා අංශය මඟින් ප්‍රාදේශිය ලේකම් කාර්යාල වලට අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන්ගේ අධීක්ෂණය හා මඟපෙන්වීම යටතේ විගමනික ශ්‍රමික පවුල්වල ජීවන තත්ත්වය නගාසිටුවීම සහ දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරිම අරමුණු කරගනිමින් හඳුනාගනු ලබන පවුල් වෙනුවෙන් පවුල් සංවර්ධන සැලසුම් සකස් කෙරේ.

විගමනික ශ්‍රමික පවුල් වල හා විශේෂයෙන් සමාජීය අවදානමකට ලක්ව සිටින දරුවන්ගේ අවශ්‍යතාවයන් ඉහත සඳහන් කර ඇති සංවර්ධන නිලධාරින් විසින් හඳුනාගනු ලබයි. මෙමගින් ශ්‍රමිකයා විදෙස්ගතව සේවය කරන කාලසීමාවේදි ඔවුනගේ දරුවන්ගේ සමාජිය අවදානම අවම කිරිම මුලික කර කටයුතු කරනු ලැබේ. ශ්‍රමික සුරැකුම යටතේ 2018 වර්ෂයේ සකස් කරන ලද පවුල් සංවර්ධන සැලසුම් සංඛ්‍යාව 6,554ක් වන අතර ඒ අතරින් 5,597 වු වැඩිම ප්‍රමාණයක් කාන්තා ශ්‍රමිකයින් වු අතර පිරිමි ශ්‍රමිකයින් සඳහා සංවර්ධන සැලසුම් සංඛ්‍යාව 957කි. සලකා බැලෙන කාලවකවානුව තුල සකස්කර ඇති පවුල් රැකවරණ සැලසුම් සංඛ්‍යාව 835 කි.




## ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන

පවුල් සංවර්ධන සැලසුම් හෙවත් රැකවරණ සැලසුම් ක්‍රියාත්මක කිරීමට අමතරව විදේශ රැකියා අමාත්‍යාංශයට අනුයුක්තව සේවය කරන සංවර්ධන නිලධාරීන් විසින් විගමනික ශ්‍රමිකයන්ගේ භෞතික සහ අධ්‍යාත්මික සංවර්ධනය උදෙසා විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.ශ්‍රමික පවුල්වලින් මතුවන ගැටළු අනුව මෙම වැඩසටහන් සංවර්ධන නිලධාරීන් විසින්ම හඳුනාගෙන ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අතුරින් කිහිපයක් පහත දැක්වේ ,

1. ස්වයං රැකියා කුසලතා සංවර්ධන වැඩසටහන්,
2. මත් ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්,
3. ළමා ආරක්ෂාව සම්බන්ධව සහ අධ්‍යාපන අවශ්‍යතා පාදක කරගත් වැඩසටහන්,
4. වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන්
5. ගෘහස්ථ එලදායිතා වැඩසටහන්
6. ජංගම සේවාවන්

විගමනික පවුල් කණ්ඩායම් වශයෙන් දැනුවත් කිරීම



දැනුවත් කිරීමේ වැඩසටහන් වැඩි වශයෙන් වයඹ සහ දකුණු පළාත් වල පවත්වා ඇති අතර බහුතර විගමනික ප්‍රජාවක් ලියාපදිංචි පළාත් වීම ඒ සඳහා බලපා තිබේ. ඒ අනුව දිවයින පුරා දැනුවත් කිරීමේ වැඩසටහන් 5,519 ක් මේ වන විට පවත්වා ඇත.




<u>**විගමනික සේවකයින් සඳහා වු යෝජිත විශ්‍රාම වැටුප් ක්‍රමය**</u>

රැකියා සඳහා විගමනය වන ශ්‍රී ලාංකිකයින්ගේ ඉහල වැඩිවිමක් 1976 වසරේ සිට නිරික්ෂණය වි ඇති අතර දැනට එම ප්‍රමාණය ආසන්නව මිලියන 1.7 පමන වන බවට ඇස්තමේන්තු කර ඇත. විගමනිකයින් විසින් 2017 වර්ෂයේදි ආසන්නව ඇ එ ජ ඩො බිලියන 7.2 මුදලක් ශ්‍රමික ප්‍රේෂණ ලෙස මෙරටට එවා ඇත. එම නිසා මෙම විගමනික ශ්‍රමිකයින්ගේ අනාගත සුබසාධනය වෙනුවෙන් ඔවුන්ටම විශේෂිත වු විශ්‍රාම වැටුප් ක්‍රමවේදයක් හඳුන්වාදීමට කටයුතු කරමින් පවති. ඒ සම්බන්ධයෙන් නීති කෙටුම්පත් සම්පාදක විසින් කෙටුම්පත් කර ඇති පනත් කෙටුම්පත නීතිපති තුමාගේ අනුමැතිය සඳහා යොමුකර ඇත.

<u>**ශ්‍රමික සංක්‍රමණය පිළිබඳව ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය**</u>

මෙම ප්‍රතිපත්තිය හඳුන්වා දි මේ වන විට වසර 10ක් පමණ කාලයක් ක්‍රියාත්මක වන හෙයින් විගමනික ශ්‍රමික ක්ෂේත්‍රය පිළිබඳ වන වර්තමාන සහ අනාගත අවශ්‍යතාවයන් කෙරෙහි අවධානය යොමු කරමින් එය යාවත්කාලින කිරිම 2018 වර්ෂයේ ආරම්භ කරන ලදි. ඒ අනුව, මේ වන විට ක්‍රියාත්මකවීම සම්බන්ධව විශ්ලේෂනයක් සිදුකිරිම අවසන් කර ඇති අතර අදාල කණ්ඩායම්වල සහභාගිත්වයෙන් සාකච්ඡා කිහිපයක් පවත්වා විශේෂ අවධානය යොමුකල යුතු ක්ෂේත්‍රයන් හඳුනාගෙන ඒ අනුව 2019 වර්ෂයේදි සංශෝධිත ප්‍රතිපත්තිය හඳුන්වා දිමට සැලසුම් කර ඇත.

## II. ජාත්‍යන්තර සහයෝගිතාව තුලින් විගමනික ශ්‍රමිකයින් සවිබල ගැන්වීම

### අවබෝධතා ගිවිසුම් හා එකඟතා

මිනිස් බල ක්ෂේත්‍රය, මානව ධාරිතා සංවර්ධනය, ජාත්‍යන්තර සමාජ ආරක්ෂණ වැඩසටහන, පුහුණු වැඩසටහන්, නිති කටයුතු හා සුහඳ සබඳතා වැනි විවිධාකාරී අරමුණු ඉටුකර ගැනිම සඳහා ශ්‍රී ලංකා රජය විවිධ රටවල් සමග ගිවිසුම් ගණනාවකට එළඹි ඇත. අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය එකගතා / අවබෝධතා ගිවිසුම් 20ක් ක්‍රියාත්මක කරමින් සිටි.මෙම වර්ෂය තුළ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම් සංඛ්‍යාව 02කි.

**අත්සන් කරන ලද නව ගිවිසුම් / අවබෝධතා ගිවිසුම්**

**එක්සත් අරාබි එමීර් රාජ්‍ය**

එක්සත් ආරාබි එමීර් රජය සහ ශ්‍රී ලංකා රජය අතර මිනිස් බල ක්ෂේත්‍රය සම්බන්ධව නව අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදි.

**ජපානය**

ජපානයේ තාක්ෂණික සිමාවාසික පුහුණුව සම්බන්ධව ජපන් සෞඛ්‍ය, කම්කරු සහ සුබසාධන අමාත්‍යාංශය සමග ශ්‍රී ලංකාවේ අධිකරණ අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශ සහ විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් සහ විදේශ රැකියා අමාත්‍යාංශය සමග සහයෝගිතා ගිවිසුමක් අත්සන් කරන ලදි.

**ඒකාබද්ධ කමිටු රැස්වීම්**

- ශ්‍රී ලංකාව සහ ඕමානය අතර 3වන ඒකාබද්ධ කමිටුව 2018 ජුලි මස 03වන දින කොළඹදි පවත්වන ලද අතර එහිදි විගමනික ක්ෂේත්‍රයට අදාල කරුණු සම්බන්ධව එකිනෙකා අතර එකගතා සඳහා එළඹෙන ලදි.
- ශ්‍රී ලංකාව සහ කටාර් රාජ්‍යය අතර 5 වන ඒකාබද්ධ සමුළුව 2018 වර්ෂයේ නොවැම්බර් 26 සහ 27 යන දිනවලදි දෝහා කටාර් වලදි පැවැත්වුනි.





**කලාපිය සංවාද හා ජාත්‍යාන්තර සංසඳ සඳහා සහභාගි විම.**

## I. කොළඹ ක්‍රියාදාමය

2018 වසර තුළදී ශ්‍රී ලංකාව පහත දැක්වෙන ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම් සඳහා පුද්ගලිකව සහ බ්ලූ ජීන්ස් තාක්ෂණය ඔස්සේ සහභාගි විය.

**තේමාත්මක ක්ෂේත්‍ර ක්‍රියාකාරී කණ්ඩායම්**

| | |
|---|---|
| කුසලතා සහ සුදුසුකම් හඳුනාගැනීම | 02 |
| ආචාර ධර්මීය බඳවාගැනීම ප්‍රවර්ධනය | 03 |
| පෙර විගමනික පුහුණුකිරීම සහ සවිබල ගැන්වීම | 01 |
| ප්‍රේෂණ | 01 |
| ශ්‍රම වෙළඳපොළ විශ්ලේෂණය | 02 |



මේ යටතේ,

- කොළඹ ක්‍රියාදාමයේ සමාජික රටවල් විසින් පෙර පිටත්විම් හැඩගැස්විම් සහ විගමනිකයින් බලගැන්විමේ තේමාත්මක අංශයක් ස්ථාපිත කර ඇත. මෙම කණ්ඩායමේ ප්‍රධාන කාර්යයක් වන්නේ සම්පූර්ණ විගමනික ක්‍රියාවලිය තුලට ඇතුලත් කර ඇති සමාජ ආරක්ෂණ වැඩපිළිවෙල පිළිබඳ තොරතුරු බෙදාහැරිම පිළිබඳ ප්‍රවර්ධනයයි.
- ගෘහ සේවා අංශයේ විගමනිකයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් බව සහතික කර ගැනිම සහ වෙනස්කම් කිරිම, අනිසි කාර්ය සඳහා යොදා ගැනිම, ආත්මාර්ථව පිණිස යොදා ගැනිම යන අවස්ථාවලට මුහුණ දිම සඳහා ඔවුන් සතු අයිතින් සහ සම්පත් පිළිබඳව කොළඹ ක්‍රියාදාමය විසින් කාන්තා විගමනිකයින් ඉලක්ක කරගත් පෙර පුහුණු මොඩලයන් හඳුන්වා දිම සඳහා අධාර කරනු ලබයි,

- ගෘහ සේවා අංශය පිළිබඳව රැකියා ගිවිසුමට අවම ප්‍රමිතියක් ඇතුලත් කර ඇතිද යන්න තහවුරු කිරිම සඳහා ගෘහස්ථ රැකියා සඳහා විගමනය වන්නන් හට පිළිගත් සේවා කොන්දේසි පුළුල් කිරිම සඳහා කොළඹ ක්‍රියාදාමය විසින් අනුග්‍රහය ලබාදෙනු ලැබේ.

**කම්කරු නිලධාරින් වෙනුවෙන් පැවැත්වූ කොළඹ ක්‍රියාදාමයේ උපදේශනාත්මක සමුළුව තායිලන්තයේ බැංකොක් හිදි 2018 දෙසැම්බර් 03 සහ 04 දින වලදි පැවැත්වුනි.**

ගමනාන්ත රටවල විගමනික කම්කරු වෙළඳපොළ පිළිබඳව තොරතුරු හසුකර ගැනිමේ කම්කරු නිලධාරින්ගේ භූමිකාව පිළිබඳව උපදේශනාත්මක රැස්විම 2018 දෙසැම්බර් 03වන දින පැවැත්වූ අතර බඳවා ගැනිම් නියාමනය සහ පැමිණිලි මෙහෙයවිම සම්බන්ධ උපදේශනාත්මක සමුළුව දෙසැම්බර් 04 දින පැවැත්වුනි.

කොළඹ ක්‍රියාදාමයේ සමාජික රටවලට අයත් කම්කරු නිලධාරින් හට තමන්ගේ පොදු රැකියා ගැටළු පිළිබඳව සහ යහපත් රැකියා ක්‍රියාකාරිකම් පිළිබඳව සාකච්චා කිරිමට ප්‍රවේශයක් ලබාදිමේ අරමුණින් මෙම සමුළුව පැවැත්වුනි.

කොළඹ ක්‍රියාදාමයේ සමාජික රටවල ප්‍රතිපත්ති තිරකයින් සහ කම්කරු නිලධාරින් අතර සම්බන්ධතාව ගොඩනගමින් විගමනික ක්ෂේත්‍රයේ අභියෝගයන් සාකච්ජා කිරිමත්, සහයෝගතාව වැඩිදියුණු කිරිමටත් මෙම රැස්විම් මගින් අවස්ථාව ලබාදෙන ලදි.

**කොළඹ ක්‍රියාදාමයේ අමාත්‍ය උපදේශනාත්මක සමුළුව**

**"සැම දිනවන - සුරක්ෂිත, ක්‍රමික සහ කළමණාකරනය කරනලද විගමනය"** යන තේමාව යටතේ කොළඹ ක්‍රියාදාමයේ 6වන අමාත්‍ය උපදේශනාත්මක සමුළුව සමාරම්භය නේපාලයේ කත්මන්ඩු හිදි 2018 නොවැම්බර් 16 දින නේපාල උප අගමැති සහ ආරක්ෂක අමාත්‍ය ඊශ්වර පෝක්හාරල් මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුනි.

අමාත්‍ය උපදේශනාත්මක සමුළුවට පූර්වයෙහි 2018 නොවැම්බර් 15වන දින ජ්‍යෙෂ්ඨ නිලධාරින් රැස්විමෙහි සමාරම්භය කොළඹ ක්‍රියාදාමයේ නේපාල සභාපතිත්වය දරන ගෝකානා බිස්ටා මහතා විසින් සනිටුහන් කරන ලදි.

## II. අබුඩාබි සංවාදය

- අබුඩාබි සංවාදයේ ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේ රැස්විම 2018 මැයි මස 08 සහ 09 දින කොළඹදි පවත්වන ලදි.

  එහිදි, විගමනිකයින් සඳහා වූ සංවිධානය මගින් සවිස්තරාත්මක තොරතුරු සහ දිශානතිය පිළිබඳ වැඩසටහනෙහි (CIOP) II වන අදියර ක්‍රියාත්මක කිරිම සඳහා සාකච්ජා පවත්වා එතුලින් තෝරාගන්නා ලද රටවල් කාණ්ඩ ලෙස එකට එකතු කරන ලදි. මෙහිදි සවුදි අරාබිය,බංගලාදේශය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍ය එක් කණ්ඩායමක් ලෙසද, ශ්‍රී ලංකාව සහ පිලිපීනය එක් කණ්ඩායමක් ලෙසද ගොනු කරන ලදි.

රටවල් ගණනාවක සම්භවයක් ඇති අබුඩාබි සංවාදයේ සවිස්තරාත්මක තොරතුරු දිශානතිය තුල පවත්නා වැඩසටහන් පූර්ව රැකිය දිශානතිය. පෙර පිටත්වීමේ දිශානතිය සහ මහජන කටයුතු සම්බන්ධ නිලධාරින් එක්කර ගමනාන්ත රටවලට අයත් මධ්‍යස්ථාන සහ තානාපති කාර්යාල සමග සහයෝගිතාවයෙන් ක්‍රියාත්මක වේ.



## III. විගමනය සහ සංවර්ධනය පිළිබඳ ගෝලීය සංසදය (GFMD)

**විගමනය සහ සංවර්ධනය පිළිබඳ ගෝලීය සංසදයේ 11වන සමුළුව 2018.12.05-07 දක්වා මරකේෂ් , මොරොක්කෝ**

විගමනය සහ සංවර්ධනය පිළිබඳ ගෝලීය සංසදයේ 11වන සමුළුවේ සමාරම්භය එක්සත් ජාතීන්ගේ සමාජික රටවල් 135ක 2000කට අධික නියෝජිතයින්, ජත්‍යන්තර සංවිධාන 45ක්,සිවිල් සමාජ ආයතන, පුද්ගලික අංශය, අධ්‍යාපන ආයතන සහ විගමනික ක්ෂේත්‍රයට අදාල අනෙකුත් අයගේ සහභාගීත්වයෙන් පැවැත්වුනි.

මෙම සමාරම්භක උත්සවය සඳහා 40කට අධික අමාත්‍යවරුන්ගේ සහ උප අමාත්‍යවරුන්ගෙන් සමන්විත රාජ්‍ය නියෝජිතයින් මෙන්ම නොයෙකුත් ජාත්‍යන්තර සංවිධාන වල ජ්‍යෝෂ්ඨ නිලධාරින්ගේ සහභාගීත්වය ලබාදෙන ලදි.

ශ්‍රී ලංකාව මෙක්සිකෝ රාජ්‍ය සමග එක්ව වටමේස 3.2 සඳහා " විදේශීය ප්‍රේෂණවලින් ඔබ්බට- සංවර්ධනයේ බලපෑම් උත්තේජනය කිරිම සහ ඩයස්පෝරා හා විගමනය සඳහා අන්තර්ජාතික මැදිහත්වීම් ප්‍රවර්ධනය කිරිම” යන අංශ යටතේ සම සභාපතිත්වය දරන ලදි.

මෙහිදි විගමනය සහ සංවර්ධනය පිළිබඳ ගෝලීය සංසදයේ 2019 වර්ෂය සඳහා සභාපතිත්වය ඉක්වදෝරය වෙත ලබාදෙන ලදි.

පහත සඳහන් උපතේමාවන් සාකච්ජා කල අතර සමාජික රටවල් වෙතින් නිරික්ෂණ කැඳවන ලදී..

- තිරසාර සංවර්ධනයක් සඳහා මිනිස් ජවාරම සම්බන්ධ 2030 න්‍යාය පත්‍රය..
- මිනිස් ජවාරම පිළිබඳ අවබෝධය.
- පවත්නා ප්‍රවේශයන් සහ අඩුලුහුඩු කම්
- වැලැක්වීම්
- අරක්ෂාව සහ නඩු පැවරිම
- නිතීයේ පාලනය වැඩිදියුණු කිරිම
- ආරක්ෂාකාරි විගමනය සඳහා මග පෙන්වීම.
- අවදානම් තත්වයන් තුල සංක්‍රමණිකයින්ට සෘජු සහාය ලබාදිම තුලින් ආරක්ෂාව වැඩිදියුණු කිරිම.

## IV. සුරක්ෂිත, ක්‍රමවත් හා විධිමත් විගමනය සඳහා ගෝලිය සම්මුතිය (GCM)

2018 දෙසැම්බර් මස 08 සිට 13 දක්වා මොරොක්කෝහිදි පැවැත්වූ අන්තර් රාජ්‍ය සම්මේලනයේ දී ගෝලීය ගිවිසුම සම්මත කිරීම සඳහා ගෝලීය ගිවිසුම පිළිබඳ අන්තර් රාජ්‍ය සම්මුතිය එක්සත් ජාතීන්ගේ මූලස්ථානයේ දී පැවැත්විය.

සාකච්ජාවල ප්‍රතිඵලයක් ලෙස අවසාන කෙටුම්පත් වාර්තාව සකසා 2018 වසරේ දෙසැම්බර් මාසයේදි මොරොක්කොවේදි පැවැත්වූ ඉහත සඳහන් අවසාන රැස්වීමේදි ඉදිරිපත් කරන ලදි.

රටවල් රාශියක සහභාගිත්වයෙන් සුරක්ෂිත, ක්‍රමවත් හා විධිමත් විගමනය සඳහා ගෝලිය සම්මුතිය 2018 දෙසැම්බර් මස 08 සිට 13 දක්වා යන දිනවලදි මොරොක්කෝවේ මරකේෂ් හිදි පැවැති සමුළුවේදි සම්මත කරගන්නා ලදි

.

## V. විගමන පාලන දර්ශකය

විගමණ පාලන දර්ශකය යනු වඩා යහපත් විගමන පාලනයක් කරා රටවල ප්‍රගතිය මැණීම පිණිස වූ රාමුවකි. එක් එක් රටට නිශ්චිතවූ විගමන පාලන ව්‍යුහයන් ඇගයීම සඳහා ඒකාබද්ධ රාමුවක් සැපයීමට සහ විගමනය ආශ්‍රිත තිරසාර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම දැනුම්දීම සඳහා විභව මූලාශ්‍රයක් ලෙස ක්‍රියා කිරීම එය අරමුණු කොට ඇත.

විදේශ රැකියා අමාත්‍යාංශය ජාත්‍යාන්තර විගමනය සඳහා වූ සංවිධානයේ සහයෝගය ඇතිව 2017 දෙසැම්බර් 12 දින පවත්වන ලද ජාතික සම්මන්ත්‍රණයේදි මූලික පර්යේෂන වල ප්‍රගතිය පිලිබද සාකච්ජා කරන ලදි. ශ්‍රි ලංකාවේ විගමනය පාලනය කිරිම සඳහා බහු කොටස් කරුවන්ගේ සංවාදයක් ආරම්භ

කිරිමේ පරමාර්ථයෙන් මෙම සම්මන්ත්‍රණයේදි විගමනයේ ප්‍රධාන පාර්ශව කරුවන් වන රජය, රාජ්‍ය නොවන සහ සිවිල් සමාජ සංවිධාන එක් අරමුණකට ගොනු කරනු ලැබේ.
ජාත්‍යාන්තර විගමනය සඳහා වූ සංවිධානයේ ගෝලිය විගමනික දත්ත විශ්ලේෂණ මධ්‍යස්ථානය විසින් 2018 මැයි මසදි ශ්‍රී ලංකාවේ විගමනය පාලනය පිළිබඳ දත්ත ප්‍රකාශ කරන ලදි. මෙම දත්ත මත පදනම්ව දේශිය විගමනික පාලන දර්ශනය ප්‍රකාශයට පත් කෙරේ. මෙම වාර්තාව මගින් ශ්‍රී ලංකාවේ විගමනය පාලනයේ වාසිදායක තත්වයන්, අඩුපාඩු අවස්ථාවන් සහ අභියෝග පෙන්වා දි ඇති අතර ජාතික සමුළුවේදි සාකච්ජා කිරිමට මුල්තැන දිය යුතු අංශ පිළිබඳව ඉදිරිපත් කර ඇත.

## VI. සංවර්ධනය හා සහයෝගිතාව පිළිබඳව වූ ස්විස් නියෝජිත ආයතනය.

සංවර්ධනය හා සහයෝගිතාව පිළිබඳව වූ ස්විස් නියෝජිත ආයතනය යනු ස්විස්ටර්ලන්ත රජයේ ද්විපාර්ශවික ප්‍රතිපාදන ආයතනයකි. සංවර්ධනය වෙමින් පවත්නා රටවල දිළිඳුකම තුරන් කිරිම ඉලක්ක කර ගනිමින් රජයේ හා සිවිල් සමාජයේ සංවර්ධන කටයුතු සඳහා සහයෝගය ලබාදෙමින් මෙම සංවර්ධන සහයෝගිතා ආයතනය ක්‍රියාත්මක වේ. මෙම නියෝජිත ආයතනයේ පහත සඳහන් තේමාන්තික අංශයන් අරමුණු කරනු ලැබේ. සෞඛ්‍ය, අධ්‍යාපනය, ජලය, කෘෂිකර්මය/ ග්‍රාමිය සංවර්ධනය, පරිසරය, රැකියා සහ ආර්ථිකය, නිතිය ක්‍රියාත්මක කිරිම, ප්‍රජාතන්ත්‍ර අර්බුද වලක්වා ගැනිම හා ඉවත්කිරිම, විගමනය, ආර්ථික සමෝධානය, පාලනය හා ලිංග භේදයයි. ස්විස් සංවර්ධන සහයෝගිතාව ශ්‍රී ලංකාව තුල යහපත් රැකියා කොන්දේසි ප්‍රවර්ධනය කිරීම සඳහා සංවර්ධනය හා විගමනය පිළිබඳව ගෝලීය වැඩසටහන් පහත අදියරයන් යටතේ ක්‍රියාත්මක කරනු ලබයි. වර්තමාන වන විට මෙහි 3වන අදියර ක්‍රියාත්මක වේ.

**අදියර iii** විගමනික ශ්‍රමිකයින්ගෙ ආරක්ෂාව, සංවර්ධනය සඳහා විගමනයේ දායකත්වය ඉහල නැංවිම සහ ආරක්ෂාකාරි හා විධිමත් විගමනය සඳහා දායකත්වය ලබා දිම. ජාතික ශ්‍රමික සංක්‍රමන ප්‍රතිපත්තිය ඵලදායි ලෙස ක්‍රියාවට නැංවිම තහවුරු කිරිම. (ශ්‍රී ලංකාව වර්තමානයේ මෙම 3වන අදියරේ පවති)

සංවර්ධනය හා සහයෝගිතාව පිළිබඳව වූ ස්විස් නියෝජිත ආයතනය විසින් සිදුකරන වැඩසටහන් විදේශ රැකියා අංශය සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ හවුල්කාරිත්වය මගින් සම්බන්ධිකරන කරනු ලබයි.

4වන උපදේශන කමිටු රැස්විම 2018 ඔක්තෝම්බර් මස 18 දින පවත්වන ලදි.

## ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත සංශෝධන කිරිම

වර්තමාන සහ අනාගත ශ්‍රම වෙළඳපල සහ විගමනිකයින්ගේ අවශ්‍යතාවන්ට ගැලපෙන අයුරින් 21 / 1985 වූ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත වෙනස් කරනු ලැබේ.

මෙම පනත සංශෝධන කිරිමේදි අතරමැදියන් නියාමනය කිරිම සහ විගමනික සේවකයින්ගේ රැකවරනය සහ ආරක්ෂාව මෙන්ම කර්මාන්තයේ නියාමනය තවදුරටත් ශක්තිමත් කිරිම කෙරෙහි අවධානය යොමු කෙරේ.

විදේශ රැකියා සඳහා පුද්ගලයින් යොමු කිරිමේ ක්‍රියාවලියේදි අතරමැදියන් කිහිපදෙනෙක් ඒ සඳහා දායකත්වය ලබාදේ. බඳවා ගැනිමේ ක්‍රියාවලිය තුල මෙම අතරමැදියන් අත්‍යවශ්‍ය කාර්ය භාරයක් සිදුකරනු ලැබේ.

විදේශ සේවා නියුක්ති කාර්යාංශ අධ්‍යක්ෂ මණ්ඩලයේ නිරික්ෂණයන්ගෙන් පසු අවසාන පනත නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කරනු ලැබේ.

# ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

## 1. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ උපායමාර්ගික ගමන්මග

**දැක්ම**

"එතෙර වෙළඳපොළ සඳහා නිපුණතාවයෙන් පිරි මිනිස් සම්පත සැපයීමේ ලොව හොඳම තේරීම බවට ශ්‍රී ලංකාව පත්වීම"

**මෙහෙවර**

"දේශීය ආර්ථිකයට දායක වෙමින් හා සියලුම පාර්ශවකරුවන්ගේ යහපත සුරක්ෂිත කරමින්, ජනතාවට තම කුසලතාවයන්ගෙන් එතෙර රැකියා වෙළඳපොළෙහි යහපත් ප්‍රතිලාභ ලැබිය හැකි කාර්යක්ෂම හා සමානාත්වයෙන් යුතු මාර්ගයන් බිහි කිරීම"

## 1.1. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අරමුණු හා ප්‍රතිපත්ති

විදේශ සේවා නියුක්ති කාර්යාංශය 1985 අංක 21 දරණවිදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත යටතේ පිහිටුවා ඇත.කම්කරු විගමනික සෑම පියවරක්ම ජාතික විගමනික කම්කරු ප්‍රතිපත්තිය මගින් මාර්ගෝපදේශනය සපයයි.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙහි ප්‍රධාන අරමුණු පහත සඳහන් පරිදි සාරාංශගත කර දැක්විය හැකිය.

- විදේශ රැකියා ප්‍රවර්ධන වැඩසටහන් තුලින් ශ්‍රී ලාංකිකයන් සඳහා පලදායි එතෙර රැකියා අවස්ථා සඳහා අවස්ථාවන් ලබාදිම.
- විදෙස් රැකියා සඳහා බඳවා ගැනිමේ කටයුතු නියාමනය කිරීම.
- විගමනික ශ්‍රමිකයින් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් වෙත ආරක්ෂාව හා සුභසාධනය සැලසීම.
- 

ශ්‍රමික සංක්‍රමණය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය මගින් පහත සඳහන් ප්‍රධාන අංශ 3ක් සලකා බැලේ.

- සංක්‍රමණ ක්‍රියාවලියේ යහපාලනය
- සංක්‍රමණික ශ්‍රමිකයින් හා ඔවුන්ගේ පවුල් බලසතු කිරිම සහ රැකවරණය සැලසිම.
- විගමණික ක්‍රියාවලිය සංවර්ධනය සඳහා දායක කර ගැනිම.

## 1.2. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන මෙහෙයුම් අංශයන්

විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන මෙහෙයුම් අංශයන් පහත පරිදි වේ.

- ශ්‍රී ලාංකිකයන් එතෙර රැකියාවලට බඳවා ගැනීම පිණිස විදේශ රැකියා නියෝජිත ආයතන සඳහා බලපත්‍ර නිකුත් කිරීම.
- දේශීය නියෝජිත ආයතන වෙත විදේශ රටවලින් ලැබෙන රැකියා ඇණවුම් සඳහා අනුමැතිය ලබා දීම.
- පුද්ගලයන් බඳවා ගැනීම වෙනුවෙන් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් සිදු කෙරෙන ප්‍රවර්ධන කටයුතු සඳහා ප්‍රචාරක දැන්වීම්වලට අනුමැතිය ලබා දීම.
- ශ්‍රී ලංකාවෙන් නික්ම යාමට පෙර විගමනික ශ්‍රමිකයන් කාර්යාංශයේ ලියාපදිංචි කිරීම.
- දේශීය නියෝජිත ආයතන, විදේශීය රැකියා නියෝජිත ආයතන හා ශ්‍රී ලංකා දූත මණ්ඩලවල කම්කරු අංශය යන පාර්ශ්වයන්ගේ සහයෝගය ඇතිව, විගමනික ශ්‍රමිකයන්ගේ ආරවුල් විසඳීමට ක්‍රියාකිරීම හා එතෙරදී අවශ්‍ය සුභසාධන කටයුතු සැලසීම.
- විගමනික ශ්‍රමිකයන්ට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට ආරක්ෂාව හා සුභසාධනය සැලසීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලාංකිකයන් සඳහා එතෙර රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම.
- විවිධ වැඩසටහන් මාර්ගයෙන් එතෙර රැකියා සඳහා යාමට අපේක්ෂා කරන ශ්‍රමිකයින්ට සහාය වීම.

## 1.3. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මානව සම්පත් සංවර්ධනය

### බඳවා ගැනීම්

| තනතුර | සේවා තත්වය | සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | 2017 | 2018 |
| පරිපාලන නිලධාරි | ස්ථිර | - | 01 |
| බලාත්මක නිලධාරි | දෙවැනි නිලධාරි | 06 | 01 |
| පරිවර්තක | ස්ථිර | 03 | 01 |
| නීති නිලධාරි | කොන්ත්‍රාත් පදනම | 01 | - |
| නේවාසිකාගාර පාලිකා | | 03 | - |
| පර්යේෂණ නිලධාරි | | 01 | - |
| කළමනාකරණ සහකාර | ස්ථිර | 36 | 47 |
| කාර්යාල කාර්ය සහයක | ස්ථිර | - | 82 |
| සම්බන්ධීකාරක | කොන්ත්‍රාත් | - | 04 |
| කම්කරු | කොන්ත්‍රාත් | - | 03 |

## කාර්ය මණ්ඩල පුහුණු සහ සංවර්ධන වැඩසටහන්

| විස්තරය | සහභාගිත්වය | | වියදම (රු මි) | |
|---|---|---|---|---|
| | **2017** | **2018** | **2017** | **2018** |
| වැඩමුළු | 98 | 52 | 2.03 | 0.393 |
| පාඨමාලා | 18 | 27 | 1.70 | 1.695 |
| පුහුණු වැඩසටහන් | - | 04 | - | 0.072 |
| **එකතුව** | **116** | **83** | **3.73** | **2.16** |

## 2. යහපාලනය හා කර්මාන්තය නියාමනය කිරීම

විදේශ සේවා නියුක්ති කාර්යාංශය, විගමනික ශ්‍රමිකයන්ට ආරක්ෂාව සලසමින් විදේශ රැකියා කර්මාන්තය නියාමනය කරන අතර එහි ප්‍රවර්ධනයද සිදු කරනු ලබයි.

### විදේශ රැකියා නියෝජිත ආයතන ලියාපදිංචි කිරීම

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| නිකුත් කරන ලද නව බලපත්‍ර සංඛ්‍යාව | 7 | 27 |
| අලුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව | 989 | 839 |
| ලියාපදිංචි කළ සහ ලියාපදිංචිය අලුත් කරන ලද විදේශිය රැකියා නියෝජිත ආයතන (සත්කාරක රටවල) | 723 | 566 |

### විදේශ රැකියා ඇණවුම් සඳහා අනුමැතිය ලබා දීම

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| අනුමත කරන ලද රැකියා ඇණවුම් ප්‍රමාණය | 3,132 | 2,169 |
| අනුමත කරන ලද ප්‍රචාරක දැන්වීම් ප්‍රමාණය | 1,225 | 965 |
| ලැබූ විදේශ රැකියා ඇබෑර්තු ප්‍රමාණය | 328,641 | 335,077 |

### විදේශ රැකියා පිටත්වීම් සඳහා අනුමැතිය ලබාදීම.

| විස්තරය | පිටත්වීම් ප්‍රමාණය | |
|---|---|---|
| | **2017** | **2018** |
| අනුමැතිය ලබා දෙන ලද ශ්‍රමිකයින් සංඛ්‍යාව (බලපත්‍රලාභී රැකියා නියෝජිත ආයතන මගින් විගමනික ශ්‍රමිකයින් බඳවා ගැනීම) | 68,316 | 66,926 |
| අනුමැතිය ලබා දෙන ලද ශ්‍රමිකයින් සංඛ්‍යාව (පුද්ගල / ස්වයං මාර්ගයෙන් විගමනික ශ්‍රමිකයින් බඳවා ගැනීම ) | 143,674 | 144,535 |
| **එකතුව** | **211,990** | **211,461** |

## බලපත්‍රලාභී / බලපත්‍රලාභී නොවන නියෝජිත ආයතන වලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම

- බලපත්‍රලාභි ඒජන්සි වලට එරෙහිව මහජනතාවගෙන් ලැබුනු පැමිණිලි වලට එරෙහිව සිදු කරන ලද විමර්ශණ

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | 1,987 | 1,706 |
| විසදන ලද පැමිණිලි සංඛ්‍යාව | 3,763 | 3,598 |

- නීති විරෝධි විදේශ රැකියා ඒජන්සි කරුවන්ට විරුද්ධව ලද පැමිණිලි සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශන

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | 527 | 746 |
| විසදන ලද පැමිණිලි සංඛ්‍යාව | 239 | 730 |
| නීති විරෝධි විදේශ රැකියා ක්‍රියාකාරකම් සම්බන්ධව සිදුකරන ලද සාර්ථක වැටලීම් | 210 | 155 |



- 2009 අංක 56 හා 1994 අංක 04 දරණ පනත්වලින් සංශෝධිත 1985 අංක 21 දරණ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත යටතේ සිදුකර ඇති අපරාධසඳහා බලපත්‍රලාභී / බලපත්‍රලාභී නොවන තැනැත්තන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම.

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| විදේශ සේවා නියුක්ති කාර්යාංශයට එරෙහිව පවරන ලද නඩු සඳහා උසාවියේ පෙනී සිටීම. | 130 | 141 |
| ලියාපදිංචි ඒජන්සි කරුවන්ට හා ලියාපදිංචි නොවූ පුද්ගලයන් සඳහා ගන්නා ලද නීතිමය ක්‍රියා මාර්ග | 239 | 213 |
| අක්‍රමිකතා සිදු කර ඇති බලපත්‍රලාභී/ බලපත්‍රලාභී නොවන තැනැත්තන්ට එරෙහිව කාර්යාංශය විසින් පැවරූ නඩුසඳහා පෙනී සිටීම. | 3,637 | 3,307 |

- විදේශ රැකියා ක්ෂේත්‍රය හා ඒ හා බැඳුණු වෙනත් නීති සම්බන්ධව වි සේ නි කා සේවකයින් දැනුවත් කිරිමේ වැඩසටහන් පැවැත්විම.

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| වැඩසටහන් ප්‍රමාණය | 02 | 02 |
| සහභාගි වූ නිලධාරින් ප්‍රමාණය | 240 | 330 |

- මිනිස් ජාවාරම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| වැඩසටහන් ප්‍රමාණය | 09 | 14 |
| සහභාගි වූ නිලධාරින් ප්‍රමාණය | 1,399 | 957 |

- මිනිස් ජාවාරමට එරෙහි කාර්යාංශ ඒකකය වෙත ලද පැමිණිලි.

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | 46 | 51 |

# 3. විගමණික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් ආරක්ෂා කිරීම සහ සවිබල ගැන්වීම.

## 3.1 සුබසාධක ක්‍රියාකාරකම්

සම්පූර්ණ විගමනික ක්‍රියාවලියේ තුන් ආකාරයේදීම විගමනික සේවකයින් හා ඔවුන්ගේ පවුල්වල ආරක්ෂාව හා බලසම්පන්න කිරීමෙහි ක්‍රියාදාමය විදේශ සේවා නියුක්ති කාර්යාංශය හඳුනාගෙන තිබේ. පිටත්වීමට පෙර (තීරණ ගැනීමේ සිට පිටත්වීම සඳහා පුහුණුව) පිටත්වන අවස්ථාව (සේවකයින් රැකියා නියුක්තියේදී ඔවුන්ගේ පවුල් ඒසඳහා සූදානම් කිරීම) සහ නැවත පැමිණීම හා සමාජගත කිරීම(ඇගයීම,පිළිගැනීම සැලකිල්ලට භාජනය කරමින් සමාජගත කිරීම) විදේශ සේවා නියුක්ති කාර්යාංශය එහි පරමාර්ථ ලඟාකර ගැනීමට නිශ්චිත මිණුම් ක්‍රියාත්මක කිරීම හා වැඩසටහන් හඳුන්වා දී තිබේ.

### රක්ෂණ ප්‍රතිලාභ

- විගමනික ශ්‍රමිකයින් වෙනුවෙන් රක්ෂණ ප්‍රතිලාභ ගෙවීම:

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| රක්ෂණ වාරික සංඛ්‍යාව | 212,229 | 211,093 |
| ගෙවූ මුදල (රු මි.) | 139.01 | 138.25 |

- විගමනික සේවක රක්ෂණය යටතේ ප්‍රතිලාභ ගෙවීම (මරණ වන්දි ඉල්ලීම්, වෛද්‍ය වියදම් සහ නැවත ශ්‍රි ලංකාවට පිටත්කර හැරීමේ වියදම් පියවීම් ඇතුලුව)

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| රක්ෂණ වන්දි ප්‍රමාණය | 2,137 | 2,396 |
| ගෙවූ මුදල (රු මි.) | 170.5 | 152.24 |

### අඩු පොලී යටතේ ණය ලබාදීම

- විගමණික ශ්‍රමිකයන් හට අඩු පොලී යටතේ නිවාස ණය ලබා දී ඇත

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| අඩු පොලී ණය ලබාදුන් සංඛ්‍යාව | 201 | 55 |
| ගෙවූ ණය පොලිය (රු මි) | 0.34 | 0.57 |

## විගමණික ශ්‍රමිකයින්ගේ දූ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරිම

| විස්තරය | දරුවන් සංඛ්‍යාව | | වියදම රු මි | |
|---|---|---|---|---|
| | **2017** | **2018** | **2017** | **2018** |
| 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සමත් දරුවන් | 985 | 548 | 14.78 | 10.76 |
| සමාන්‍ය පෙළ සමත් දරුවන ප්‍රමාණය | 1,850 | 1,211 | 37 | 29.7 |
| උසස් අධ්‍යපනය සඳහා යොමු වි ඇති දරුවන් | 373 | 260 | 11.19 | 8.81 |
| එකතුව | **3,208** | **2,019** | **62.97** | **49.27** |



## ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයින් සඳහා සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම

ශ්‍රී ලංකාව "විගමනික ශ්‍රමිකයින් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ ආරක්ෂාව හා අයිතිවාසිකම් සුරැකීම" පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය හා බැඳී ඇත.මෙම සම්මුතියට අනුව විගමනික සේවකයන්ගේ හා ඔවුන්ගේ පවුල් වල අයගේ සුබසාධනය හා ආරක්ෂාව වෙනුවෙන් ප්‍රතිපත්ති කිහිපයක් සකස් කර ඒවා ඉටු කිරීමට අවශ්‍ය වැඩසටහන් කිහිපයක් හඳුන්වා දී ඇත.ඒ යටතේ පහත සඳහන් ප්‍රධාන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

- විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය ලබාගත් සෑම විගමනික ශ්‍රමිකයකු සඳහාම නොමිලේ ජීවිත රක්ෂණ ආවරණයක් ලබාදිම.
- ජාතික විභාග සහා ඉලක්ක සපිරූ විගමනික සේවකයින්ගේ දූ දරුවන් සඳහා ශිෂ්‍යත්ව පිරිනැමිම.
- රාජ්‍ය බැංකු හරහා පෙර විගමනික ණය ලබා දීම.
- දිවයින පුරා පිහිටි විදේශ සේවා නියුක්ති කාර්යාංශ පුහුණු මධ්‍යස්ථාන වලදී ගෘහස්ථ සේවයේ රැකියා සඳහා පිටත්වන කාන්තාවන්ට හා ගෘහස්ථ නොවන සේවයේ කාන්තා හා පිරිමි අය සඳහා පුහුණු පාඨමාලා පැවැත්වීම
- විදේශගත වී අතරමං වූ හා කරදරයට පත්වූ අයට නැවත පැමිණීමට ගුවන් ටිකට් පත්‍ර ලබාදිම.

- විදේශ රටවල පවත්වාගෙන යන සහන නිවාස වල නිසි පිළිසරණක් නොමැති වූ විගමනික කාන්තාවන්ට සහන සලසනු ලැබේ. නිවෙස් වලින් පලාගොස් රැකවරණය පතන කාන්තාවන් හට මෙම මධ්‍යස්ථානවලදී ඉඳුම් හිටුම්, වෛද්‍ය පහසුකම් ආහාර හා ප්‍රවාහන පහසුකම් සැපයීම.
- ශ්‍රී ලාංකික සේවකයින්ගේ යහපත සොයා බැලීම සඳහා විගමනික සේවකයන් ලබා ගන්නා සෑම රටකම පිහිටුවා ඇති දූත මණ්ඩල සඳහා සුබසාධන නිලධාරීන් පත් කිරීම .
- ගුවන් තොටුපල ආසන්නයේ පිහිටුවා ඇති සහන පියස සුබසාධන මධ්‍යස්ථාන මගින් නොයෙක් අසනීප තත්ත්වයන්ට හා කරදරයට ලක්ව නැවත පැමිණෙන සේවකයන් සඳහා සහන සැලසීම.

## සුබසාධක සේවා සැපයිම

- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත පැමිණෙන විගමනික ශ්‍රමිකයින් හා ඔවුන්ගේ පවුලේ සමාජිකයින් සඳහා අවශ්‍යතාවය මත සුභසාධක සේවා සපයනු ලැබේ. (ආහාර හා බස් ගාස්තු)

| විස්තරය | 2017 | | 2018 | |
|---|---|---|---|---|
| | පුද්ගල සංඛ්‍යාව | වියදම රු මි | පුද්ගල සංඛ්‍යාව | වියදම රු මි |
| ආහාර සැපයීම | 4,368 | 0.687 | 3,229 | 0.153 |
| බස් ගාස්තු ගෙවීම | 26 | 0.044 | 150 | 0.176 |

## විගමනික ශ්‍රමිකයින් නැවත ගෙන්වා ගැනිම

- ශ්‍රී ලංකා තානාපති කාර්යාලයන්හි ඉල්ලීම පරිදි ප්‍රශ්ණ ගත ශ්‍රමිකයින් මෙරටට ගෙන්වා ගැනිම සඳහා ශ්‍රී.ල.වි.සේ.නි.කාර්යාංශය ගුවන් ගමන් වියදම් දරනු ලැබේ.

| විස්තරය | 2017 | | 2018 | |
|---|---|---|---|---|
| | පුද්ගල සංඛ්‍යාව | වියදම රු මි | පුද්ගල සංඛ්‍යාව | වියදම රු මි |
| රක්ෂණ වැඩසටහන යටතේ | 29 | 0.78 | 18 | 0.67 |
| සේවක සුබසාධක අරමුදල යටතේ | 38 | 1.41 | 07 | 0.3 |

## සේවක සුබසාධක අරමුදල යටතේ විශේෂ සහන සැලසිම

- විගමනික ශ්‍රමිකයින්ගේ රක්ෂණය මගින් ආවරණය නොවන හෝ රක්ෂණාවරණය කල් ඉකුත් වූ පුද්ගලයින් වෙත සේවක සුබසාධක අරමුදල මගින් විශේෂ සහන සැලසීම් සිදු කරනු ලැබේ.

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| ප්‍රතිලාභී සංඛ්‍යාව | 113 | 98 |
| ගෙවූ මුදල (රු මි.) | 22.9 | 20.1 |



සේවක සුබසාධක අරමුදල යටතේ සහන සැලසීම

## විගමනික සේවකයන් සඳහා වෛද්‍ය පහසුකම් සැලසීම

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| වෛද්‍ය කදවුරු ප්‍රමාණය | 01 | 02 |
| ගෙවූ මුදල (රු මි) | 0.85 | 0.92 |



## විගමණිකයින් සඳහා අනුමත බෙහෙත් ද්‍රව්‍ය/ පෝෂණීය ආහාර සහ අනෙකුත් ද්‍රව්‍ය ලබා දීම සහ අසනීප අය සඳහා වෛද්‍ය අධාර ලබා දීම.

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| ප්‍රතිලාභින් සංඛ්‍යාව | 03 | 11 |
| ගෙවූ මුදල (රු මි.) | 0.115 | 0.099 |

## විගමනික ශ්‍රමිකයින්ගේ දූ දරුවන් සඳහා පාසැල් උපකරණ ලබා දීම

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| ප්‍රතිලාභ ලැබූ දරුවන් සංඛ්‍යාව | 56 | 545 |
| වැය වූ මුදල (රු මි.) | 0.268 | 2.59 |

## ළමා සුරැකුම් වැඩසටහන්

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| ප්‍රතිලාභ ලැබූ දරුවන් සංඛ්‍යාව | 03 | 01 |
| වැය වූ මුදල (රු මි.) | 0.035 | 0.004 |

## අබාධිත විගමණික ශ්‍රමිකයින් සඳහා නිවාස තනා දී

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| ප්‍රතිලාභි සංඛ්‍යාව | 02 | 05 |
| වැය වු මුදල (රු මි.) | 0.312 | 0.54 |

## විගමනික ශ්‍රමිකයින් සඳහා සහන පියස මගින් සහාය ලබා දීම

- විදේශයන් හි සිට නැවත ශ්‍රී ලංකාවට පැමිණ කටුනායක සහන පියස හා ප්‍රධාන කාර්යාලය වෙත පැමිණෙන විගමනික ශ්‍රමිකයින් සඳහා සුභසාධන සහාය ලබාදීම. (බස් ගාස්තු. වෛද්‍ය ප්‍රතිකාර, ප්‍රවාහන පහසුකම්, ආහාරපාන , නාවතැන් පහසුකම් ආදිය)

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| ප්‍රතිලාභ ලැබු සංඛ්‍යාව | 4,471 | 3,553 |
| වැය වු මුදල (රු මි.) | 13.09 | 5.00 |

## ගමනාන්ත රටවලදි ශ්‍රමිකයින් මුහුණදුන් ගැටළු නිරාකරණය කිරිම

## මරණ සිද්ධින්

| විස්තරය | 2017 | | 2018 | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | වියදම (රු මි) | සංඛ්‍යාව | වියදම (රු මි) |
| සේවක සුභසාධක අරමුදල යටතේ මෘතශරිර මෙරටට ගෙන්වා ගැනිම | 30 | 8.5 | 8 | 3.29 |
| මරණාධාර වියදම් ගෙවීම | 120 | 3.6 | 212 | 6.36 |

- **සේවක සුභසාධක අරමුදලේ කම්ටු රැස්වීම්**

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| පැවැත්වු කමිටු ප්‍රමාණය | 10 | 3 |
| වියදම (රු මි.) | 0.44 | 0.15 |

- **විදේශිය දුත මණ්ඩල වෙත පත්කිරිම්**

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| නව පත්වීම් | 26 | 51 |
| කොන්ත්‍රාත් කාලය දිර්ඝ කිරිම | 46 | 63 |

**දූත මණ්ඩල යැවීම් සහ දූත මණ්ඩල බාරගැනීම්**

| විස්තරය | 2017 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|
| | දූත මණ්ඩල සංඛ්‍යාව | පුද්ගල සංඛ්‍යාව | වියදම (රු මි) | දූත මණ්ඩල සංඛ්‍යාව | පුද්ගල සංඛ්‍යාව | වියදම (රු මි) |
| දූත මණ්ඩල මෙරටට පැමිණීම | 14 | 215 | 2.93 | 15 | 255 | 1.6 |
| දූත මණ්ඩල යැවීම් | 43 | 102 | 13.24 | 45 | 168 | 11.03 |

**විදේශ රැකියා සඳහා බඳවා ගැනීම් නියාමනය කිරිමේ ක්‍රම වේදය**

- විදේශිය තනාපති කාර්යාල මගින් ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් ලියාපදිංචි කරනු ලැබේ.

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| ලියාපදිංචි කල ශ්‍රමිකයින් සංඛ්‍යාව | 10,917 | 3,145 |

ගුවන් ටිකට්පත් ලබා දිම

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| ටිකට්පත් ප්‍රමාණය | 3,923 | 3,764 |
| එකතුකරන ලද මුදල (රු මි) | 274.6 | 270 |

## 3.2 විගමනික ශ්‍රමිකයින්ගේ හැකියාවන් හා කුසලතා වර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

**රැකියා අපේක්ෂකයින් සඳහා "ජාතික වෘත්තීය සුදුසුකම්III" (NVQ III) මට්ටමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම.**

2012 සැප්තැම්බර් මස තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිසම (TVEC) සමග අත්සන් කරන ලද ගිවිසුම පරිදි කාර්යාංශය මගින් පවත්වා ගෙන යනු ලබන ගෘහ පාලිකා පුහුණු වැඩසටහන"ජාතික වෘත්තීය සුදුසුකම් III"මට්ටමදක්වා ඉහළ නංවනු ලැබීය.එය ජාත්‍යන්තරව පිළිගත් මට්ටමකි.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ජාතික වෘතීය සුදුසුකම් 3වන මට්ටමේ(NVQ Level 3) පුහුණු වැඩසටහන් හඳුන්වාදිම තුලින් ගෘහ සේවා අංශයේ ශ්‍රමිකයින්ගේ හැකියාවන් දියුණු කිරිමට පියවර ගෙන ඇත. වර්තමානය වන විට මැදපෙරදිග, යුරෝපය සහ නැගෙනහිර ආසියානු රටවල් වන

සිංගප්පූරුව, හොංකොං සහ සයිප්‍රස් සහ මාලදිවයින යන රටවල් සඳහා ගෘහ සේවා අංශයේ රැකියා සඳහා මෙම මට්ටමේ පුහුණුව අනිවාර්ය වේ.

## ගෘහ පාලිකා සහකාර වරියන් හට පුහුණු වැඩසටහන් - මැදපෙරදිග අංශය (NVQ 3වන මට්ටම)

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| වැඩසටහන් ප්‍රමාණය | 138 | 228 |
| සහභාගි වූ ප්‍රමාණය | 2,440 | 4,709 |

## ගෘහ පාලිකා සහකාර වරියන් හට පුහුණු වැඩසටහන් - යුරෝපා හා නැගෙනහිර අසියානු අංශය (NVQ 3වන මට්ටම)

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| වැඩසටහන් ප්‍රමාණය | 28 | 28 |
| සහභාගි වූ ප්‍රමාණය | 517 | 547 |

## සාත්තු සේවකයින් සඳහා පුහුණු වැඩසටහන් - (NVQ 3 වන මට්ටම)

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| වැඩසටහන් ප්‍රමාණය | 17 | 29 |
| සහභාගි වූ ප්‍රමාණය | 290 | 572 |

## සාක්ෂරතා පුහුණුව

- ගෘහස්ථ රැකියා සඳහා යාමට අපේක්ෂා කරන කාන්තා ශ්‍රමිකයන් සඳහා දින 18ක සාක්ෂරතා පුහුණුව ලබා දීම (සිංහල හා දෙමළ භාෂා).

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| වැඩසටහන් ප්‍රමාණය | 11 | 24 |
| සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව | 143 | 374 |

## ගෘහස්ථ නොවන ශ්‍රමිකයින් සඳහා පුහුණුව

- සුදුසුකම් සහිත පිරිමි සහ කාන්තා ගෘහස්ථ නොවන සේවකයින් සඳහා පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ.

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| වැඩසටහන් ප්‍රමාණය | 968 | 1,124 |
| සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව | 26,456 | 24,923 |

## පෙර පළපුරුදු හඳුනාගැනීමේ පුහුණු වැඩසටහන (RPL)

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| වැඩසටහන් ප්‍රමාණය | 80 | 136 |
| සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව | 304 | 1,828 |

## ඉංග්‍රීසි භාෂා වැඩසටහන

විදේශ රැකියා අපේක්ෂිත පුද්ගලයින් සඳහා ඉංග්‍රීසි භාෂා වැඩසටහන් පවත්වනු ලැබේ.

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| වැඩසටහන් ප්‍රමාණය | 07 | 11 |
| සම්පූර්ණ කරන ලද ප්‍රමාණය | 115 | 174 |

## පෙර විගමනික පුහුණු වැඩසටහන - දකුණු කොරියාව

රැකියා බලපත්‍ර ක්‍රමය යටතේ දකුණු කොරියාවේ රැකියා අවස්ථා සඳහා පිටත්වීමට නියමිතව ගිවිසුම් අත්සන් කරන ලද රැකියා අපේක්ෂකයින් සඳහා පෙර විගමනික දැණුවත් කිරීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම.

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| වැඩසටහන් ප්‍රමාණය | 63 | 48 |
| සම්පූර්ණ කරන ලද ප්‍රමාණය | 2,441 | 2,027 |



## විදේශ රැකියා අපේක්ෂිතයින් සඳහා කායික යෝග්‍යතා පුහුණුව (කොරියාව,ජපානය,ඊශ්‍රාලය)

| විස්තරය | 2018 |
|---|---|
| වැඩසටහන් ප්‍රමාණය | 81 |
| සම්පූර්ණ කරල ලද ප්‍රමාණය | 2,562 |

# 4. රැකියා සඳහා විගමනය විම සංවර්ධන ක්‍රියාවලියට වන බලපෑම.

## 4.1. ශ්‍රී ලාංකිකයින් සඳහා වඩාත් වාසිදායක රැකියා අවස්ථා ශ්‍රී ලංකාවෙන් පිටත ප්‍රවර්ධනය කිරිම

### රැකියා බලපත්‍ර ක්‍රමය (EPS) යටතේ ශ්‍රී ලාංකිකයින් දකුණු කොරියාවේ රැකියා සඳහා පිටත්විම.

දකුණු කොරියවේ රැකියා අවස්ථා සඳහා පිටත්විම්.

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| සමාන්‍ය රැකියා බලපත්‍ර ක්‍රමය යටතේ විගමනය වූ ප්‍රමාණය | 2,035 | 1,972 |
| නැවත විදේශගත කිරිමේ වැඩසටහන යටතේ විගමනය වූ ප්‍රමාණය | 753 | 824 |
| විශේෂ බලපත්‍ර වැඩසටහන යටතේ විගමනය වූ ප්‍රමාණය | 651 | 623 |
| **එකතුව** | **3,439** | **3,419** |

### විදේශ සේවා නියුක්ති කාර්යාංශය යටතේ ඊශ්‍රායල් සහ ජපාන රැකියා සඳහා බඳවා ගැනිම්

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| ජපානය වෙත රැකියා සඳහා පිටත්විම් | - | 43 |
| ඊශ්‍රායලය සඳහා රැකියා සඳහා පිටත්විම | 13 | 15 |
| එකතුව | 13 | 58 |

### රැකියා බැංකුව

විදේශ රැකියාවන් බලාපොරොත්තු වන අය සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් පවත්වාගෙන යනු ලබන අන්තර්ජාල ගත රැකියා බැංකුවෙහි ලියාපදිංචි වීමේ පහසුකම් සපයා ඇත. ඔවුන්ට ඔවුන් විසින්ම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වෙබ් අඩවිය හරහා ලියාපදිංචි විය හැකි අතර ප්‍රධාන කාර්යාල සහ පළාත් කාර්යාල මගින් ද ලියාපදිංචි විය හැක. අයදුම්පත රැකියා බැංකුවට යොමු කිරීමෙන් පසු යොමු කල දින සිට උපරිම වසර 2 ක කාලයක් සඳහා එය වලංගු වේ. මෙම වැඩසටහන මගින් සේවා යෝජකයින් හට/ රැකියා නියෝජිත ආයතනවලට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ රැකියා බැංකුව හරහා රැකියා අපේක්ෂකයින් සොයා ගැනීමට පහසුකම් සැලසේ.

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| ලියාපදිංචි කරන ලද රැකියා අපේක්ෂකයින් | 13,034 | 11,839 |
| රැකියා බැංකුවේ ලියාපදිංචි වු අය අතරින් විදෙස් රැකියා සඳහා යොමුකල සංඛ්‍යාව | 1,419 | 1,465 |

## 4.2. ප්‍රවර්ධන වැඩසටහන්

ශ්‍රී ලාංකික රැකියා අපේක්ෂකයින් සඳහා ලංකාවෙන් පිටත රැකියා අවස්ථා ප්‍රවර්ධනය හා සංවර්ධනය කිරීම.

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| දැනුවත් කිරිමේ වැඩසටහන් සංඛ්‍යාව | 84 | 23 |
| ජංගම සේවා සංඛ්‍යාව | 12 | 24 |

### උපායමාර්ගික සම්බන්ධතා ගොඩනැගීම

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෘත්තීය පුහුණු ආයතන දේශීය රැකියා යෝජකයන් හා අනෙකුත් සියලුම පාර්ශව කරුවන් සමග උපායමාර්ගික සම්බන්ධතා ගොඩනැගීම තුළින් රැකියා විරහිත තරුණ තරුණියන්හට විදේශ රැකියා අවස්ථා ලබා දීමට මැදිහත් වී සිටියි.

## 5. සේවයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම

### ISO 9001:2008 තත්ත්ව කළමනාකරණ වැඩ සටහන ක්‍රියාවට

ඉහල ගුණාත්මක සේවාක් තුලින් සිය ගනුදෙනු කරුවන් තෘප්තිමත කිරිමේ අරමුණින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලය 2012.11.06 දින ISO 9001:2008 තත්ත්ව සහතිකය ලබා ගන්නා ලදි.

ඒ හා සමගාමීව ප්‍රධාන කාර්යාලය තුල ගුණාත්මක කළමනාකරණ ක්‍රමවේදය ස්ථාපිත කරන ලදි. එතැන් සිට ISO සහතිකය සියළුම ශාඛා කාර්යාල වල හා පුහුණු මධ්‍යස්ථාන සඳහා ලබා ගන්නා ලදි. වර්තමානය වන විට ISO 9001. 2015 තත්ව සහතිකය ලබා ගැනිම සදහා කටයුතු කරමින් සිටි.

### විදේශ රැකියා ඇණවුම් /ඇබැර්තු සහ වෙළඳ දැන්වීම් කාර්යාංශ වෙබ් අඩවියේ පල කිරීම.

බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතන සඳහා ලැබූ විදේශීය රැකියා ඇණවුම් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිල වෙබ් අඩවියේ පල කිරීමට පහසුකම් සලසා ඇත. ඊට අමතරව බලපත්‍රලාභීන් වෙත සලසන සේවාවක් පුළුල් කරනු වස් ඔවුන්ගේ ඇබැර්තු පිළිබඳ වෙළඳ දැන්වීම් කාර්යාංශ වෙබ් අඩවියේ පළ කිරීමටද පහසුකම් සලසා ඇත.

### පැමිණිලි විසඳීමේ යාන්ත්‍රණය විමධ්‍යගත කිරිම.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය එහි උපායමාර්ගික දිශානතිය වර්තමාන සේවා අවශ්‍යතාවයන්ට සහ දිවයින පුරා පුළුල් කරන ලද සේවාවන්ට ගැලපෙන පරිදි වෙනස් කර ඇත. කම්කරු ගැටළු විමධ්‍යගතකර විසඳීම යටතේ සියලුම පළාත් කාර්යාල හා දිස්ත්‍රික් කාර්යාලවල මෙම

ගැටළු විසඳීම සඳහා සමථ නිලධාරීන් පත් කර ඇත. අදාළ මධ්‍යස්ථානවලදීම පැමිණිලි පරීක්ෂණ සඳහා සහභාගී වියයුතු බවට සියලු බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතන වෙත උපදෙස් ලබා දී ඇත.

| විස්තරය | 2017 | | 2018 | |
|---|---|---|---|---|
| | ලද පැමිණිලි සංඛ්‍යාව | විසඳා ඇති පැමිණිලි සංඛ්‍යාව | ලද පැමිණිලි සංඛ්‍යාව | විසඳා ඇති පැමිණිලි සංඛ්‍යාව |
| සමථ අංශය | 6,033 | 7,618 | 4,346 | 4,566 |
| විදේශ සබඳතා I | 390 | 519 | 733 | 832 |
| **එකතුව** | **6,423** | **8,137** | **5,079** | **5,398** |

## 5.1 විශේෂ ජයග්‍රහණ

- SPAS ක්‍රමය යටතේ විදෙස්ගත කිරීමේ කාල සීමාව දින 20කට වඩා අඩුවෙන් පවත්වාගෙන යෑම.
- SPAS ක්‍රමය යටතේ සියළුම විදෙස් රැකිය බලාපොරොත්තු වන්නන් හට පෙර පිටත්වීම් පුහුණුව ලබා දී ඕනෑම අවස්ථාවක රැකියා සඳහා පිටත්වීම සඳහා සූදානම් කිරීම.
- වෛද්‍ය වාර්තාව ඉක්මනින් හා නිවැරදිව ලබාගැනීම සඳහා රජයට අනුබද්ධ ශ්‍රී ජයවර්ධනපුර හා ලංකා හොස්පිටල් යන රෝහල් මගින් වෛද්‍ය වාර්තා ලබාගැනීමේ ක්‍රමවේදයක් අනුගමනය කිරීම.

## 5.2 විගමනික සම්පත් මධ්‍යස්ථාන

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මෙහෙයුම් ධාරිතාව ඉහල නංවා විගමනික ශ්‍රමිකයින් හට පහසුකම් සැලසීම සඳහ ශ්‍රී ලංකාවේ සෑම පලාතක්ම ආවරණය වන පරිදි විගමනික සම්පත් මධ්‍යස්ථාන ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.** මතුගම විගමනික සම්පත් මධ්‍යස්ථානය 2012.04.16 දින විවෘත කරන ලදි. තංගල්ල විගමණික සම්පත් මධ්‍යස්ථානය 2013.04.16 දිනද, රත්නපුර විගමනික මධ්‍යස්ථානය සේවා කටයුතු සඳහා 2018.01.16 දිනද, හාලි ඇළ විගමණික සම්පත් මධ්‍යස්ථානය 2018.06.08 දින ද සේවා කටයුතු සඳහා විවෘත කරන ලදි. මේ අතර කතරගම සංචාරක නිවහනෙහි වැඩ කටයුතු 99.2% අවසන් කර ඇත.

### විගමනික සම්පත් මධ්‍යස්ථානය - රත්නපුර





රත්නපුර විගමණික සම්පත් මධ්‍යස්ථානය විවෘත කිරීම - 16.01.2018

## විගමනික සම්පත් මධ්‍යස්ථානය - හාලි ඇළ





හාලි ඇළ විගමණික සම්පත් මධ්‍යස්ථානය විවෘත කිරිම - 08.06.2018

## 01.01.2018 සිට 31.12.2018 දක්වා කාර්යාංශයේ ආදායම් හා වියදම් වාර්තාව

| විස්තරය | 01.01.2018 සිට 31.12.2018 (ප්‍රතිපාදන) | 01.01.2018 සිට 31.12.2018 අයවැය (සංශෝධිත) | අයවැයට අනුව ලගාකර ගැනීම් |
|---|---|---|---|
| | රු | රු | % |
| **ආදායම** | | | |
| බඳවා ගැනීමේ ගාස්තු - නියෝජිත ආයතන | 285,525,000 | 333,000,000 | 86 |
| බඳවා ගැනීමේ ගාස්තු- පුද්ගලික/කාර්යාංශ | 1,234,656,000 | 1,250,000,000 | 99 |
| කොරියානු බඳවා ගැනීම් ප්‍රවර්ධන ගාස්තු | 133,713,830 | 154,026,350 | 87 |
| පහසුකම් ගාස්තු | 40,930,000 | 41,400,000 | 99 |
| බලපත්‍ර ගස්තු | 45,200,000 | 75,000,000 | 60 |
| සෙස් ආදායම | 184,204,624 | 175,000,000 | 105 |
| කොරියානු බඳවා ගැනීමේ ආදායම | 86,383,840 | 95,834,700 | 90 |
| පුහුණු කිරිමේ අදායම | 96,448,708 | 95,000,000 | 102 |
| විදේශ තානාපති කාර්යාල අදායම | 864,494,268 | 850,000,000 | 102 |
| **මෙහෙයුම් අදායම** | **2,971,556,270** | **3,069,261,050** | 97 |
| **එකතු කලා - වෙනත් අදායම්** | | | |
| විදේශ ආධාර | - | | |
| ගුවන් ප්‍රවේශපත්‍ර අංශයෙන් ලැබු කොමිස් අදායම | 2,713,334 | 3,000,000 | 90 |
| රක්ෂණ කොමිස් මුදල්(දේශිය / විදේශිය) | 16,121,950 | 25,000,000 | 64 |
| විදේශ විනිමය හුවමාරු ලාභ / (පාඩු) | (4,896,244) | 10,000,000 | -49 |
| විවිධ ආදායම් | 49,547,198 | 40,000,000 | 124 |
| **මුළු වෙනත් අදායම්** | **63,486,238** | **78,000,000** | 81 |
| **<u>අඩුකලා:</u>** | | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | 1,440,544,015 | 1,500,237,000 | 96 |
| ආයතනික වියදම් | 458,402,734 | 500,837,000 | 92 |
| මෙහෙයුම් වියදම් | 256,489,699 | 265,031,500 | 97 |
| මූල්‍ය වියදම් | 3,251,048 | 5,500,000 | 59 |
| ප්‍රචාරණ සහ වෙළඳ දැන්වීම් | 9,465,883 | 40,480,000 | 23 |
| ව්‍යාපාර ප්‍රවර්ධන වියදම් | 51,610,004 | 52,226,000 | 99 |
| සේවක සුභසාධක අරමුදල් වියදම් | 437,360,999 | 480,840,000 | 91 |
| **මුළු වියදම** | **2,657,124,382** | **2,845,151,500** | 93 |
| ආයෝජන පොලි | 638,002,629 | 775,000,000 | 82 |
| සේවක ණය පොලි | 17,518,163 | 30,000,000 | |
| | **655,520,792** | **805,000,000** | 81 |

| විස්තරය | 01.01.2018 සිට 31.12.2018 (ප්‍රතිපාදන) | 01.01.2018 සිට 31.12.2018 අයවැය (සංශෝධිත) | අයවැයට අනුව ලගාකර ගැනිම් |
|---|---|---|---|
| | රු | රු | % |
| **අතිරික්තය** | **1,033,438,918** | **1,107,109,550** | 93 |
| **අඩුකලා:බදු ප්‍රතිපාදන** | 281,019,653 | 193,000,000 | 146 |
| **සම්මුච්චිත අරමුදලට ඉ/ගෙ ශේෂය** | **752,419,265** | **914,109,550** | 82 |
| | - | - | |
| **සම්පූර්ණ අදායම** | **752,419,265** | **914,109,550** | 82 |

* මෙය කෙටුම්පත් මූල්‍ය වාර්තාවක් වන අතර අවසාන වෙනස් කම් කලයුතුව ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර නැත.

## 01.01.2017 to 31.12.2017 දක්වා කාර්යාංශයේ ආදායම් හා වියදම් වාර්තාව

| විස්තරය | 01.01.2017 සිට 31.12.2017 | අයවැය (සංශෝධිත ) 01.01.2017 31.12.2017 | අයවැයට අනුව ලගාකර ගැනිම් |
|---|---|---|---|
| | රු | රු | % |
| **අදායම** | | | |
| බඳවා ගැනිමේ ගාස්තු - නියෝජිත ආයතන | 308,355,022 | 340,000,000 | 91 |
| බඳවා ගැනිමේ ගාස්තු- පුද්ගලික/කාර්යාංශ | 1,075,879,208 | 1,000,000,000 | 108 |
| කොරියානු බඳවා ගැනිම් ප්‍රවර්ධන ගාස්තු | 116,548,198 | 100,000,000 | 117 |
| පහසුකම් ගාස්තු | 42,369,200 | 40,000,000 | 106 |
| බලපත්‍ර ගස්තු | 49,399,999 | 75,000,000 | 66 |
| සෙස් ආදායම | 158,596,643 | 175,000,000 | 91 |
| කොරියානු බඳවා ගැනිමේ ආදායම | 71,803,585 | 130,000,000 | 55 |
| | - | - | |
| පුහුණු කිරිමේ අදායම | 88,250,464 | 90,000,000 | 98 |
| විදේශ තානාපති කාර්යාල අදායම | 841,920,978 | 825,000,000 | 102 |
| **මෙහෙයුම් අදායම** | **2,753,123,297** | **2,775,000,000** | **99** |
| **එකතු කලා - වෙනත් අදායම්** | | | |
| විදේශ ආධාර | - | | |
| ගුවන් ප්‍රවේශපත්‍ර අංශයෙන් ලැබූ කොමිස් අදායම | 2,505,676 | 8,000,000 | 31 |
| රක්ෂණ කොමිස් මුදල්(දේශිය / විදේශිය) | 53,023,698 | 60,000,000 | 88 |
| විදේශ විනිමය හුවමාරු ලාභ / (පාඩු) | 1,647,320 | 25,000,000 | 7 |
| විවිධ ආදායම් | 71,653,867 | 30,000,000 | 239 |
| **මුළු වෙනත් අදායම්** | **128,830,561** | **123,000,000** | **105** |
| **<u>අඩුකලා:</u>** | | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | 1,414,905,095 | 1,397,800,000 | 101 |
| ආයතනික වියදම් | 476,202,559 | 547,090,000 | 87 |
| මෙහෙයුම් වියදම් | 255,435,381 | 299,600,000 | 85 |
| මූල්‍ය වියදම් | 5,116,256 | 5,600,000 | 91 |
| ප්‍රචාරණ සහ වෙළඳ දැන්විම් | 12,369,650 | 38,000,000 | 33 |
| ව්‍යාපාර ප්‍රවරධන වියදම් | 36,615,840 | 39,156,000 | 94 |
| සේවක සුභසාධක අරමුදල් වියදම් | 422,452,872 | 451,000,000 | 94 |
| **මුළු වියදම** | **2,623,097,652** | **2,778,246,000** | **94** |
| ආයෝජන පොලි | 771,644,508 | 700,000,000 | 110 |
| සේවක ණය පොලි | 38,429,256 | 20,000,000 | 192 |
| | **810,073,764** | **720,000,000** | **302** |
| **අතිරික්තය** | **1,068,929,970** | **839,754,000** | **127** |
| **අඩුකලා:බදු ප්‍රතිපාදන** | 186,560,191 | 235,131,120 | 79 |

| විස්තරය | 01.01.2017 සිට 31.12.2017 | අයවැය (සංශෝධිත ) 01.01.2017 31.12.2017 | අයවැයට අනුව ලගාකර ගැනීම් |
|---|---|---|---|
| | රු | රු | % |
| සම්මුච්චිත අරමුදලට ඉ/ගෙ ශේෂය | **882,369,779** | **604,622,880** | **146** |
| | - | - | |
| | | - | |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | - | 30,000,000 | - |
| සත්‍ය ලැබීම්/ගෙවීම් විශ්‍රාමික සැලසුම | (3,819,491) | - | |
| | - | - | |
| සම්පූර්ණ අදායම | **878,550,288** | **634,622,880** | **138** |
| * ඉහත සංඛ්‍යා ලේඛණ විගණනය කලයුතුව ඇත | | | |

## විදේශ රැකියා අංශයේ අනුමත තනතුරු පිළිබඳ තොරතුරු - 2018

| තනතුර | සේවය | ශ්‍රේණිය | වැටුප් කාණ්ඩය | සේවා මට්ටම | අනුමත තනතුරු | | | පවත්නා තනතුරු | | | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ස්ථිර | කොන්ත්‍රාත් | තාවකාලික | ස්ථිර | කොන්ත්‍රාත් | තාවකාලික | |
| අතිරේක ලේකම් | ශ්‍රීලංප.සේ | විශේෂ | SL-3 | 1 | 2 | 0 | 0 | 2 | 0 | 0 | 0 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රීලංප.සේ | I | SL-1 | 1 | 2 | 0 | 0 | 1 | 0 | 0 | 1 |
| ප්‍රධාන ගණකාධිකාරි | ශ්‍රීලංග.සේ | I | SL-1 | 1 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| අධ්‍යක්ෂ | ශ්‍රීලංක්‍ර.සේ | I | SL-1 | 1 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| සහකාර අධ්‍යක්ෂ | ශ්‍රීලංක්‍ර.සේ | III/II | SL 1 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| සහකාර ලේකම් | ශ්‍රීලංප.සේ | III | SL-1 | 1 | 2 | 0 | 0 | 1 | 0 | 0 | 1 |
| අභ්‍යන්තර විගණක | ශ්‍රීලංග.සේ | II,III | SL-1 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| ගණකාධිකාරි | ශ්‍රීලංග.සේ | II,III | SL-1 | 1 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| පරිපාලන නිලධාරි | ර.ක.ස.සේ | අධි ශ්‍රේණිය | MN-7 | 2 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක | II/I | MN6 | 3 | 2 | 0 | 0 | 0 | 0 | 0 | 2 |
| සංවර්ධන නිලධාරි | සං.නි.සේ | | MN-4 | 3 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| සංවර්ධන නිලධාරි | සං.නි.සේ | | MN-4 | 3 | 989 | 0 | 0 | 976 | 0 | 0 | 13 |
| සංවර්ධන සහකාර | සං.නි.සේ | | MN-4 | 3 | 6 | 0 | 0 | 6 | 0 | 0 | 0 |
| තොරතුරු තාක්ෂණ සහකාර | ශ්‍රීලංතො.සංතාසේ | | MT-01 | 3 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| රාජ්‍ය කළමණාකාර සහකාර | ර.ක.ස.සේ | | MN-2- | 3 | 30 | 0 | 0 | 19 | 0 | 0 | 11 |
| පිලිගැනිමේ නිලධාරි/දුරකථන ක්‍රියාකරු | දෙපාර්මේතුගත | | MN-1- | 3 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| නිශ්චල ජයාරූප ශිල්පි | තාවකාලික | | MT-1- | 3 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 |
| කැමරා ක්‍රියාකරු | තාවකාලික | | MT-1- | 3 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 |
| කැමරා සහායක | තාවකාලික | | PL-1- | 4 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 |
| රියදුරු | රියදුරු සේවය | | PL-3- | 4 | 11 | 0 | 0 | 9 | 0 | 0 | 2 |
| කාර්යාල කාර්ය සහයක | කා.සේ.සේ | | PL-1- | 4 | 14 | 0 | 0 | 11 | 0 | 0 | 3 |
| **එකතුව** | | | | | **1067** | **0** | **3** | **1029** | **0** | **0** | **41** |